කාර්යසාධන වාර්තාව

செயற்திறன் அறிக்கை

Performance Report

# 2014

## දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
## வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
## Department of Divineguma Development

නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය

வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு

Ministry of Housing & Samurdhi

# අන්තර්ගතය


| | | පිටුව |
|---|---|---|
| ❖ | අන්තර්ගතය | 2 |
| ❖ | ස්තුතිය | 3 |
| ❖ | දැක්ම හා මෙහෙවර | 4 |
| 01. | අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | 05 - 08 |
| 02. | පාලන අංශයේ කාර්යසාධනය | 09 - 19 |
| 03. | 2014.12.31 දිනට යෝජිත ව්‍යාපෘති සැලැස්ම හා එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය | 20 - 21 |
| 04. | 2014.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය (කලාප හා දිස්ත්‍රික් වශයෙන්) | 22 - 23 |
| 05. | 2014.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය (දිස්ත්‍රික් හා අංශ වශයෙන්) | 24 - 26 |
| 06. | සමාජ සුභ සාධන හා සමාජ ආරක්ෂණ හා අංශයේ කාර්යසාධනය | 27 - 35 |
| 07. | සමාජ සංවර්ධන අංශයේ කාර්යසාධනය | 36 - 40 |
| 08. | ප්‍රජාමූල සංවිධාන අංශයේ කාර්යසාධනය | 41 - 44 |
| 09. | ජීවනෝපාය සංවර්ධන අංශයේ කාර්යසාධනය | 45 - 57 |
| 10. | තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යසාධනය | 58 |
| 11. | මාධ්‍ය අංශයේ කාර්යසාධනය | 59 |
| 12. | ප්‍රජාමූල බැංකු අංශයේ කාර්යසාධනය | 60 - 83 |
| 13. | ගිණුම් වාර්තා | 84 - 89 |

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
## ස්තූතිය

2013 අංක 1 දරණ දිවිනැගුම පනතින් පිහිටුවා ඇති දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභිලාෂයන් මුදුන් පමුණුවා ගනිමින්, රටටත්, රටේ දිළිඳු ජනතාවටත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවයක් ඉටුකිරීම සඳහා, 2014 වර්ෂයේදී ඇපකැපවී කටයුතු කළ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලුම කාර්යමණ්ඩලයට පළමුව කෘතඥතාවය පලකරමි.

තවද, ඉහත පරිදි වන ජනතා සේවයන් සැලකීමේදී, නිසි මඟපෙන්වීම් ලබාදෙමින්, මෙම දෙපාර්තමේන්තුව වෙත දැක්වූ කාරුණික සහයෝගය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අදාල සියලු නිලධාරීන්ටත්, සමස්ථ කාර්ය මණ්ඩලය වෙනුවෙන් ස්තූතිය පිරිනමමි. එමෙන්ම, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු, සහනාධාර සහ සමාජ සුභසාධන සේවා නිසිපරිදි පවත්වාගෙන යාමට දිවයිනේ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් දැක්වූ කාරුණික සහයෝගය හා රාජකාරී කැපවීම් කෘතවේදීව සිහිපත්කරමි.

අවසාන වශයෙන් 2014 වසරේ අප දෙපරේතමේන්තුවේ රාජකාරී කටයුතු පවත්වාගෙන යාමේදී, නන් අයුරින් සහයෝගය දැක්වූ සියලම අදාල රාජ්‍ය ආයතනවලටත්, අනෙකුත් අදාල ආයතන හා පුද්ගලයන්ටත් ස්තූතිය පුදකරමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව**

## අපගේ දැක්ම

**“ දිළිඳුබව තුරන් කරමින්, ජීවනෝපාය ආර්ථික කටයුතු තුලින් සවිබල ගැන්වූ ප්‍රජාවක් ”**

## අපගේ මෙහෙවර

**“ප්‍රජාව සවිබල ගැන්වීම, මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම හා ජීවනෝපාය කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය මඟින් ජාතික සංවර්ධනය වේගවත් කිරීමට දායක වීම හා ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින්, දිළිඳුබව තුරන් කළ හා සමාජ සාධාරණත්වය සහතික කෙරෙන සමෘද්ධිමත් ජාතියක් ගොඩනැඟීමට ප්‍රබලව දායකවීම”**

## 01. අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

1995 අංක 30 දරණ පනත මඟින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1996 අංක 18 දරණ පනත මඟින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ 2005 අංක 26 දරණ පනත මඟින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරිතුන සහ උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව සහ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු දෙක ද ඇතුලුව, රාජ්‍ය ආයතන 05 ඒකාබද්ධ කරමින්, 2013 අංක 01 දරණ දිවි නැගුම පනතට අනුව, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. දිවිනැගුම පනතේ විධිවිධාන අනුව, ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් 2014 ජනවාරි 03 දිනැති අංක 1843/47 දරණ ගැසට් නිවේදනය පළ කිරීමෙන් පසු, මෙම දෙපාර්තමේන්තුව නිල වශයෙන් ස්ථාපිත කරන ලදී. අනතුරුව, ඉහත ආයතන 05 හි සේවය කරන ලද 26,000 කට අධික සේවකයින් නව දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කරන ලදී. මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය දිවයිනේ දිස්ත්‍රික් 25 තුළ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331 ක් තුළ සහ ග්‍රාම නිලධාරී වසම් 14,022 ක් ආවරණය වන පරිදි පැතිර පවතී. තවද, 2014.01.10 දිනැති අංක 1844/69 දරණ ගැසට් නිවේදනය මඟින් කලාප කාර්යාල 06 ක් පිහිටුවා, දිවයිනේ දිස්ත්‍රික් 25 එම කලාප 06 ට පහත පරිදි අයත් වනසේ බෙදා, දෙපාර්තමේන්තුවේ පාලනය හා කළමනාකරණය පවත්වා ගෙනයාමට අදාල යාන්ත්‍රණය සකස් කරන ලදී.

| කලාපය | කලාපවලට අයිති දිස්ත්‍රික්ක |
|---|---|
| • කලාප අංක 01 - | කොළඹ, කළුතර, ගාල්ල, මාතර, රත්නපුර |
| • කලාප අංක 02 - | ගම්පහ, කුරුණෑගල, කෑගල්ල, පුත්තලම |
| • කලාප අංක 03 - | මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල |
| • කලාප අංක 04 - | හම්බන්තොට, මොණරාගල, අම්පාර |
| • කලාප අංක 05 - | අනුරාධපුරය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව |
| • කලාප අංක 06 - | යාපනය, මන්නාරම, වව්නියාව, කිලිනොච්චිය, මුලතිව් |

දිවයිනේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ළඟා කර ගැනීම සඳහා, දිළිඳුබව තුරන්කිරීමේ සහ සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කරමින් පුද්ගලයා, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කරගත් ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ එක් ප්‍රධාන අරමුණකි. මේ සඳහා, දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන ස්ථාපිත කොට, ජාතික, කලාප හා දිස්ත්‍රික්ක මට්ටමේ සම්බන්ධිකරණ ජාලයන් ගොඩනැඟීම මඟින්, ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතිය සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම මඟින් ප්‍රජා මට්ටමේ ජාතික සංවර්ධන ක්‍රියාවලියකට ජනතාව ඒකරාශි කිරීම දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ තවත් මූලික අරමුණකි. මේ සඳහා, 2013 අංක 01 දරණ දිවි නැගුම පනතේ විධි විධාන අනුව, දෙපාර්තමේන්තුව පහත පරිදි වන ප්‍රධාන ධාරා තුනක් යටතේ ක්‍රියාත්මක වේ.

(I) නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව
(II) ප්‍රජා මූල බැංකු පද්ධති ධාරාව
(III) ප්‍රජා මූල සංවිධාන ධාරාව

## (I) නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව

දෙපාර්තමේන්තුවේ නිල ව්‍යුහයේ සංයුතිය පහත පරිදි වේ. එනම් ප්‍රධාන කාර්යාලය, අධ්‍යක්ෂ ජනරාල් සහ පාලන, සමාජ ආරක්ෂණ හා සමාජ සුභසාධන, සමාජ සංවර්ධන, ප්‍රජා මූල සංවිධාන, ජීවනෝපාය සංවර්ධන, සැලසුම් හා මෙහෙයුම්, තොරතුරු තාක්ෂණ, මාධ්‍ය, ප්‍රජා මූල බැංකු සහ ගිණුම් යන අංශ වල අංශ ප්‍රධානීන්ගෙන් යුත් අංශ 11 ක් එම එක් එක් අංශවල රාජකාරී කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. කලාප කාර්යාල 06 තුළ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් 06 දෙනා ප්‍රධාන කරගත් කාර්ය මණ්ඩලය සහ දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් (දිස්ත්‍රික් ලේකම් වරුන්) ගේ මෙහෙයවීම යටතේ, දිස්ත්‍රික් දිවි නැගුම අධ්‍යක්ෂ සහ එම කාර්ය මණ්ඩලය මගින් කලාප හා දිස්ත්‍රික් මට්ටමින් අදාල රාජකාරී ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රජා මූල බැංකු කටයුතු, ප්‍රජා මූල සංවිධාන ගොඩනැගීම සහ සංවර්ධන ව්‍යාපෘති ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් දිවි නැගුම කළමනාකරුවන් සහ දිවි නැගුම සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියළු කාර්යාල හා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි.

## (II) ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව

මෙම අංශයේ කාර්යභාරය පහත පරිදි වේ.එනම් ප්‍රධාන කාර්යාලයේ බැංකු මූල්‍ය අධ්‍යක්ෂ යටතේ පාලනය වන කාර්ය මණ්ඩලය මගින් සහ දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331 කට අදාල ප්‍රජාමූල බැංකු සමිති හා මහා සංගම් සහ ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක වන බැංකු 1074 කට අදාල සියලු කාර්ය මණ්ඩලය මගින් මෙම බැංකු පද්ධතිය ක්‍රියාත්මක වේ. එමගින්, සමෘද්ධි සහනාධාර බෙදාදීම, ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීමේ තැන්පතු පවත්වා ගෙනයාම, ප්‍රතිලාභීන්ට හා අඩු ආදායම්ලාභීන්ට ක්ෂුද්‍රමූල්‍ය ණය නිකුත් කිරීම, ඉතිරි අරමුදල් වැඩි ප්‍රතිලාභ ලැබෙන මූලාශ්‍රවල ආයෝජනය කිරීම සහ වෙනත් සමාජ සුභසාධන කටයුතු ක්‍රියාත්මක කිරීමද කරනු ලබයි.

2014.12.31 දින වන විට, සියලු බැංකු සතුව රු. බිලියන 48 ක ආයෝජනයක් පැවතින. ජීවනෝපාය කටයුතු සඳහා ණය පහසුකම් අත්‍යවශ්‍ය ග්‍රාමීය ජනතාවට විවිධ ක්‍රම මගින් ලබාදී තිබූ මුළු ණය ප්‍රමාණය රු. බි. 128 කි. 2014 වර්ෂය අවසාන දිනට මුළු ණය වල උපචිත වටිනාකම රු. බි. 30කි. තවද, මෙම අංශයේ සියළු කටයුතු නව තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ ක්‍රියාවලි ගතකොට, ජනතාවට වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීමට අපේක්ෂිතය. මෙම අංශයට අදාල කාර්යසාධනය සම්බන්ධ තොරතුරු අංක 08 පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

## (III) ප්‍රජාමූල සංවිධාන ධාරාව

දිවි නැගුම පනතේ අංක 09, 10, 11 සහ 12 වගන්ති අනුව ප්‍රජා මූල සංවිධාන පිහිටුවීම පිළිබඳ විධිවිධාන සඳහන් කර ඇත. පනතේ අදාල වගන්ති අනුව, ව්‍යවස්ථානුකූලව, නිල වශයෙන් ප්‍රජා මූල සංවිධාන පිහිටුවීමට නියමිත වී ඇති අතර,මේ වන විට ඊට අදාල ව්‍යවස්ථාව කෙටුම්පත් කොට, නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. ප්‍රජා මූල සංවිධාන ශක්තිමත් කොට, ප්‍රජාව බලගන්වා, ඔවුන් ආර්ථික, සාමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කරමින් ප්‍රජා මූල බැංකු හා ජීවනෝපාය වැඩසටහන සඳහා යොමු කිරීමේ අරමුණින්, 2014 වර්ෂය තුළදී ප්‍රජා මූල සංවිධාන 38,696 ක් පිහිටුවන ලදි. පනතේ සඳහන් අරමුණු ළඟාකර ගැනීම සඳහා , මීට අදාල ඉදිරි කටයුතුද එළඹෙන වසරවලදී සිදුකිරීමට නියමිතය. මෙම අංශයට අදාල කාර්ය සාධනය සම්බන්ධ සවිස්තරාත්මක තොරතුරු අංක 05 පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

### ජීවනෝපාය සංවර්ධනය මූලික කොටගත් සංවර්ධන ව්‍යාපෘති

2014 වර්ෂයේ දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද රුපියල් මිලියන 3,146.88 ක ප්‍රතිපාදන, ජීවනෝපාය සංවර්ධන අංශය මූලික කරගත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කරන ලදි. ජීවනෝපාය සංවර්ධන අංශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති අතර, කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති, සත්ත්ව පාලන ව්‍යාපෘති, ධීවර සංවර්ධන ව්‍යාපෘති, ස්වයං රැකියා කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති හා අලෙවි සංවර්ධන ව්‍යාපෘති ප්‍රධාන තැනක් ගන්නා ලදි. එහි දී, 2014 වර්ෂය තුළ රු.මි. 1,715.82 වැය කරමින් මුළු වශයෙන් ව්‍යාපෘති 94,797 ක් නිම කරන ලදි. මෙම අංශය යටතේ, ඉහත දැක්වූ උප අංශ සහ දිස්ත්‍රික් වශයෙන් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති , ඒ සඳහා වැය කල මුදල් හා ව්‍යාපෘති ප්‍රතිලාභීන් පිළිබඳ වැඩිදුර තොරතුරු වගු අංක 1,2 සහ 3 යටතේ සහ අංක 06 පරිච්ඡේදය යටතේ දැක්වේ.

### අනෙකුත් අංශවල කාර්යසාධනය

2014 වර්ෂය තුළදී. සමාජ ආරක්ෂණ හා සමාජ සුභසාධන අංශයට අදාලව ලබාකරගත් කාර්යසාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු අංක 03 පරිච්ඡේදය යටතේද, සමාජ සංවර්ධන අංශයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු අංක 04 පරිච්ඡේදය යටතේද, දක්වා ඇත. ඊට අමතරව, සහායක සේවා වශයෙන් 2014 වසර තුළදී පාලන අංශය ළඟා කරගත් කාර්යසාධනය අංක 02 පරිච්ඡේදය යටතේද, තොරතුරු හා තාක්ෂණ අංශයේ කාර්යසාධනය අංක 07 පරිච්ඡේදය යටතේද, මාධ්‍ය අංශයේ කාර්යසාධනය අංක 08 පරිච්ඡේදය යටතේද, ගිණුම් වාර්ථා සම්බන්ධ විස්තර අංක 10 පරිච්ඡේදය යටතේද දක්වා ඇත.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව නිල වශයෙන් පිහිටුවනු ලැබුවේ, 2014.01.03 දිනදීය. ඉන් පසු, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා කලාප කාර්යාල 06 නිල වශයෙන් ස්ථානගත කරනු ලැබුවේ, 2014 අප්‍රේල් මස අවසන් භාගයේදිය. එබැවින්, එම වසරතුළදී ඉටු කල හැකි වූයේ මෙම දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ, රාජ්‍ය ආයතන 05හි කාර්ය මණ්ඩලය, ජාතික, කලාප, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය යන මට්ටම්වල පිහිටි කාර්යාලවලට අනුයුක්ත කිරීම, එම මට්ටම්වල කාර්යාල පද්ධතිය ස්ථානගත කිරීමට අදාල කටයුතු, ප්‍රධාන කාර්යාලීය අංශ පිහිටුවීම, ප්‍රධාන කාර්යාලයේ සිට ග්‍රාම නිලධාරි වසම් දක්වා පරාසයක පැතිරී සිටින කාර්ය මණ්ඩල ව්‍යුහය තාර්කිකව පිහිටුවීම හා ඒ ඔස්සේ පාදක මට්ටම දක්වා , සංවර්ධන, බැංකු සේවා, සමාජ ආරක්ෂණ හා සමාජ සුභසාධන යන ප්‍රධාන රාජකාරි හා සෙසු සියලු රාජකාරි ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරයයි.

මීට අමතරව, දෙපාර්තමේන්තුව පිහිටුවීමේදි, රජයේ ප්‍රතිපත්තිය පරිදි, දෙපාර්තමේන්තුවට බැදීමට මනාපය පල කල, (එනම්, මුල් පත්වීම් දින සිට විශ්‍රාම වැටුප් පදනමින් 8,373 දෙනෙකු හා නව පත්වීම් පදනමින් 14,159 දෙනෙකු ) ගෙන් යුත් කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහනය කර ගැනීම, වන්දි ලබා ඉවත්විමට කැමැත්ත පල කල 1,501ක් වූ සේවකයින්ට වන්දි ලබාදී සේවයෙන් ඉවත්විමට ඉඩ සැලසීම, අධිකාරි 03 හි , සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය ලබාදෙමින් සේවය කල හා තවදුරටත් එම පදනමෙන්ම දෙපාර්තමේන්තුවට බැදී සේවය කිරීමට මනාපය පල කල 1,068ක් වූ සේවකයින්ට ඊට අදාල සේවා කටයුතු සැලසීමට 2014 වසර තුළදී ඉටුකල ප්‍රධාන රාජකාරි වේ.

ඉහත දැක්වූ පසුබිම තුළ, විවිධ ප්‍රායෝගික  අපහසුතා සහ ගැටලු වලට මුහුණ දෙමින් රු. මි1,715.82 ක් වැය කොට ප්‍රතිලාභී පවුල් 94,797 දෙනෙකුට එම ප්‍රමාණයට සංවර්ධන ව්‍යාපෘති දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට හැකිවීම දෙපාර්තමේන්තුව ළඟාකරගත් ජයග්‍රහණයකි. ඒ එස්සේ දිවිනැගුම පනතේ 04 වගන්තියේ සඳහන් පරමාර්ථ යම්තාක් දුරකට ළඟාකර ගැනීමට හැකි වූ බවද සඳහන් කරමි. එමෙන්ම, අප රටේ අඩු ආදායම්ලාභී ජනතාව සවිබල ගන්වමින්, ජීවනෝපාය හා ආර්ථික සංවර්ධන කටයුතු වේගවත් කරමින්, ඔවුන් දිළිඳු බවින් මුදවාලීමටත්, ඔවුන් රටේ ප්‍රධාන ආර්ථික ධාරාවේ සක්‍රිය හා ස්ථාවර කොටස් කරුවන් බවට පත්කරලීමේත්, උදාර අරමුණ ළඟාකර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවට තව බොහෝ දුරක් යා යුතුව ඇත.එසේ හෙයින්, ඉදිරි වර්ෂවලදී එම අරමුණු ළඟාකරගැනීම සඳහා අභිප්‍රේරණය වූ සහ කැපවූ මානව සම්පතක් නිර්මාණය කරලීමේ අරමුණද ඇතිව ඉදිරි සැලසුම් සකස්කොට ක්‍රියාත්මක කරන බවද සඳහන් කරමි.

**ආර්.ඒ.ඒ.කේ. රණවක**
**අධ්‍යක්ෂ ජනරාල්**
**දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව**

## 2.පාලන අංශයේ කාර්යසාධනය

| |
|---|
| දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාලන අංශය - ආයතනික, මානව සම්පත්, පුහුණු හා විමර්ශනවලට අදාල කටයුතු සිදු කරනු ලබයි. පරිපාලනයේ දී මුහුණ දෙනු ලබන එදිනෙදා කටයුතු සහ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමද මෙම අංශය යටතේ ඉටු කෙරෙන ප්‍රධාන රාජකාරී වේ. |

### 2.1. මානව සම්පත් අංශය

පාලන අංශය, අධ්‍යක්ෂ පාලනගේ ඍජු අධීක්ෂණය යටතේ පත්කොට ඇති අතර, මෙම අංශයේ සේවක සංඛ්‍යාව 59 කින් සමන්විත වේ. මානව හා භෞතික සම්පත් නිසි ලෙස කළමනාකරණය කිරීමත්, ආයතනික සංවර්ධනය උදෙසා කැපවීමත්, දෙපාර්තමේන්තුවේ විවිධ අංශවල කාර්ය භාරයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා සහාය සේවාවන් සැපයීමත්, පාලන අංශයට පැවරෙන මූලික කාර්ය භාරය වේ.

#### 2.1.1. ප්‍රධාන අරමුණු,

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමේ සිට මෙතෙක් මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමඟ පැවැත්වෙන විශේෂ සාකච්ඡා හා සම්බන්ධීකරණ වැඩ පිළිවෙලපහතින් දැක් වේ.

- ❖ බඳවා ගැනීම් හා උසස්වීමේ පටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- ❖ කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම, විනය, පවත්වාගෙන යාම, දෛනික රාජකාරී කටයුතු පහසු කරවීම උදෙසා කටයුතු කිරීම.
- ❖ ආයතනයේ යහපැවැත්ම තහවුරු කිරීම.
- ❖ කාර්යාල පිරි සැකැස්ම සකස් කිරීම හා කාර්යාල සංවිධාන සටහන සකස් කිරීම.

#### 2.1.2.දෛනික රාජකාරී

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සිට මෙතෙක් ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමඟ පැවැත්වෙන විශේෂ සාකච්ඡා හා සම්බන්ධීකරණ වැඩ පිළිවෙල.

- ❖ දෛනික තැපෑල පිළිබඳ කටයුතු කිරිම.
- ❖ අංශවල හා අංශ ගත සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- ❖ මහජන ඉල්ලීම් කටයුතු කිරීම.
- ❖ සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම.
- ❖ කාර්ය මණ්ඩල පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම.
- ❖ ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීම.
- ❖ සේවක වැටුප්, දීමනා, හා ගමන් වියදම් හා සියලුම ගෙවීම් සම්බන්ධ බිල්පත්ගෙවීම් කිරීමට අදාල කටයුතු.

## 2.1.3. විශේෂ පැවරුම්,

- ❖ පාලන අංශයට අදාල පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අදාල පිළිතුරු ලබාදීම.
- ❖ පාලන අංශයට අදාල විගණන විමසුම සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.
- ❖ පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීමේවලින් පැන නඟින කරුණු පිළිබඳව කටයුතු කිරීම හා ඒ පිළිබඳව අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම.
- ❖ කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අනිකුත් උසස්වීම් විභාග පැවැත්වීම / සන්නිවේදනය කාර්යය සපුරාලීම.

## 2.1.4. කාර්ය මණ්ඩලය

ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල නියුතු දිවිනැගුම සංවර්ධන නිලධාරින් ඇතුලු දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලය 23,635 කි.


වගුව - 01 යෝජිත කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු

සාරාංශය

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින ගණන | පුරප්පාඩු |
|---|---|---|---|
| පාලන හා සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩලය | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 7 | 1 | 6 |
| අධ්‍යක්ෂ | 19 | 8 | 11 |
| දිස්ත්‍රික් දිවි නැගුම අධ්‍යක්ෂ | 25 | 24 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | 21 | 12 | 9 |
| දිස්ත්‍රික් දිවි නැගුම නියෝජ්‍ය අධ්‍යක්ෂ | 50 | 14 | 36 |
| කොට්ඨාශ දිවි නැගුම සහකාර අධ්‍යක්ෂ | 160 | 0 | 160 |
| ප්‍රදේශීය දිවි නැගුම සහකාර අධ්‍යක්ෂ | 332 | 0 | 332 |
| පරිපාලන නිලධාරි | 7 | 2 | 5 |
| ජ්‍යෙෂ්ඨ දිවි නැගුම කළමනාකරු | 205 | 0 | 205 |
| දිවි නැගුම කළමනාකරු | 2557 | 2415 | 142 |
| දිවි නැගුම සංවර්ධන නිලධාරි | 27437 | 20344 | 7093 |
| කළමනාකාර සහකාර | 477 | 371 | 106 |
| **අනු එකතුව** | **31298** | **23192** | **8106** |
| මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලය | | | |
| ප්‍රධාන ගණකාධිකාරි | 7 | 1 | 6 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 0 | 1 |
| ගණකාධිකාරි | 27 | 4 | 23 |
| අභ්‍යන්තර විගණක | 8 | 4 | 4 |
| මූල්‍ය සහකාර | 7 | 1 | 6 |
| ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණන නිලධාරි | 25 | 0 | 25 |
| අභ්‍යන්තර විගණන නිලධාරි | 78 | 77 | 1 |
| අභ්‍යන්තර විගණන සහකාර | 128 | 120 | 8 |
| **අනු එකතුව** | **281** | **207** | **74** |
| තාක්ෂණ අංශයේ කාර්ය මණ්ඩලය | | | |
| ඉංජිනේරු | 6 | 2 | 4 |
| පද්ධති විශ්ලේෂක | 1 | 1 | 0 |
| භාෂා පරිවර්තක | 7 | 2 | 5 |


| | | | |
|---|---|---|---|
| නීති නිලධාරි | 1 | 1 | 0 |
| පුහුණු හා පර්යේෂණ නිලධාරි | 35 | 10 | 25 |
| මාධ්‍ය නිලධාරි | 2 | 1 | 1 |
| තාක්ෂණ නිලධාරි | 6 | 6 | 0 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 365 | 0 | 365 |
| **අනු එකතුව** | **423** | **23** | **400** |
| **අනෙකුත් කාර්ය මණ්ඩලය** | | | |
| රියදුරු | 297 | 133 | 164 |
| කාර්යාල කාර්ය සහායක | 441 | 67 | 374 |
| අරක්කැමි | 8 | 1 | 7 |
| කම්කරු | 16 | 12 | 4 |
| **අනු එකතුව** | 762 | 213 | 549 |
| **මුළු එකතුව** | **32764** | **23635** | **9129** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර





1. පාලන 2. නීති
3. මෙහෙයුම් 4. සමාජ සුබ සාධන 5. සමාජ ආරක්ෂණ

# සංවිධාන ව්‍යුහය දිස්ත්‍රික් මට්ටමින්




ජෙ.දි.ක – ජ්‍යෙෂ්ඨ දිවිනැගුම කළමනාකරු




- කෘෂිකර්මය
- සත්ව කාර්මාන්තය
- ධීවර කාර්මාන්තය
- බෝග වගාව
- අත් වියනය
- අත්කම්
- දින පොත් නිෂ්පාදනය
- මැණික් කාර්මාන්තය
- කුකුළු පාලනය
- ගව පාලනය
- සම්ප්‍රදායික කාර්මාන්ත
- මී මැසි පාලනය          කිතුල් නිෂ්පාදන ආදිය...

## දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින්ගේ

## නාම ලේඛනය - 2014

1. ආර්.ඒ.ඒ.කේ.රණවක මහතා - අධ්‍යක්ෂ ජනරාල්
2. ආර්.පී.බී.තිලකසිරි මහතා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
3. එච්.එම්.ජයතිලක හේරත් මහතා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
4. අමරානන්ද වීරසිංහ මහතා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
5. ඒ.පී.එස්.රංජිත් ගුණසේකර මහතා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
6. එස්.කේ.ලියනගේ මහතා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
7. ආර්.එච්.ඩබ්.ඒ.කුමාරසිරි මහතා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

**ප්‍රධාන ගණකාධිකාරි තනතුරු**

1. එස්.එම්.එස්.ජී රත්නායක මයා
2. සුනන්දා පියසිලි මිය
3. කේ.එම්. කුලරත්න මයා
4. ජේ. එම්.එස්. බණ්ඩාර මයා
5. කේ.ජී.එස්.කේ. වීරක්කොඩි මයා
6. එස්.එස්.කේ. ලියනගේ මයා
7. එස්. බාලරාජා මයා

**ගණකාධිකාරි තනතුරු**

1. පී.ඒ.එස්.ජේ. කුමාර මයා
2. කේ.කේ.එල්. චන්ද්‍රතිලක මයා

**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

1. ටී.කේ.ද කොස්තා මයා

**අධ්‍යක්ෂක තනතුරු**

1. සී.ඩී. කළුආරච්චි මහතා - අධ්‍යක්ෂ (පාලන)
2. එස්.එම්.ආර්.එස්.බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ (ජීවනෝපාය සංවර්ධන)
3. ජේ. කේ. පද්මසිරි මහතා - අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්)
4. කාන්ති දිසානායක මිය - අධ්‍යක්ෂ (අලෙවි)
5. රාජිනි ශ්‍රීයාලතා මිය - අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන)

**දිවිනැගුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් තනතුරු**

1. කේ.ඒ.එම්.පෙරේරා මයා
2. බී.ඒ.එස්.උදයංගනී මිය
3. ඩබ්.එම්.ටී.යූ.විජේරත්න මිය
4. එම්.එස්.එම්. සෆ්රාස් මයා
5. එච්.එම්.සී.එස්.හේරත් මයා
6. එස්.ආර්.ගමගේ මයා
7. කේ.ඩී.වික්‍රමසූරිය මයා
8. එච්.එම්.එස්.කේ.කේ. හේරත් මිය
9. එස්.ත්‍රිමාන්න මයා
10. පී.ටී.එම්.ඉර්ෆාන් මයා
11. එච්.ආර්. සිරිනාම මිය
12. යූ.පී.එස්.ඒ.පියදාස මයා
13. බී.ජී. අබේසේකර මයා
14. එම්. චන්දිමා මිය
15. ජෙයභවානි කනේෂමූර්ති මිය
16. ඒ.ඒ.එල්. අමරසේකර මිය
17. අයි.ඒ.නීල් ප්‍රනාන්දු මයා
18. කේ.ඒ.එල්.සිරිල් මයා
19. එන්.ජී.ජේ.පී. රෝහිත මයා
20. පී. ගුණරත්නම් මයා
21. එස්.ඒ.එන්.ප්‍රියශාන්ත මයා
22. නිරංජන් රුවන් රාජශිල්ප මයා
23. කේ. මහේෂ්වරන් මයා
24. ටී.එම්.කේ.බී. වීරසිංහ මයා
25. කේ. සසිදරන් මයා

**නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු**

1. මහේෂ් පෙරේරා මහතා
2. එස්. ලියනාරච්චි මහතා
3. එච්. කේ. රණවීර මහතා
4. ආර්.එම්.එල්.ඩබ්.එල්. රත්නායක මිය

5. බී. ජී.එල්.ආර්.එන්.එස්. බණ්ඩාර මහතා
6. එස්.ආර්. විජේසේකර මහතා
7. ටී. ඒ. රණසිංහ මහතා
8. එස්. වන්නිගම මහතා
9. කපිල මාසකෝරාළ මහතා
10. එස්.ඩී. කල්‍යාණි මිය
11. රංජිත් ද සිල්වා මහතා

**නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුර**

1. එච්. අනුරවංශ මයා

**සහකාර අධ්‍යක්ෂ තනතුරු**

1. ආනන්ද ගමගේ මයා
2. එස්. පී. වනිගතුංග මහතා
3. එම්. එස්. පී. යාපා මිය
4. ජේ. එම්. එම්.ඩබ් ජයසිංහ මිය
5. ඩබ්. ඒ. පී.එම්. වීරසූරිය මිය
6. අයි. ඩී.එන්. සංජීවනි මිය
7. අයි.සී.ජේ. ගුණරත්න මයා
8. පී. එම්.ඩී.ඩබ්.ඩී. පල්ලාවල මයා
9. ඒ. ෆීලික්ස් ප්‍රනාන්දු මයා
10. ඩබ්.පී.එස්. වික්‍රමසිංහ මිය
11. පී.ඩී.ආර්.කේ. පෙරේරා මයා
12. ඩී.එම්.කේ. දිසානායක මිය

**ඉංජිනේරු තනතුර**

1. ඒ.එල්.එම්. මාහීර් මයා

**පරිපාලන නිලධාරි තනතුරු**

1. පී. ජී. උපුල් ජයශාන්ත මහතා
2 බී.එල්.එස්.බොරළුගොඩ මිය

## 2.2. පුහුණු හා පර්යේෂණ අංශය

2014 වර්ෂයේ මැද භාගය ආසන්නයේ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පුහුණු හා පර්යේෂණ අංශය ස්ථාපනය කරන ලදී. ඊට ප්‍රථම සමෘද්ධි අධිකාරිය පැවති අවධියේ ආරම්භ කරන ලද පුහුණු වැඩසටහන් ඉදිරියට ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව දිවිනැගුම බැංකු ක්ෂේත්‍රයට අනුයුක්තව සේවය කරන නිලධාරීන්ට ක්ෂුද්‍රමූල්‍ය විෂය යටතේ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය මගින් නිලධාරීන් 600 කට පමණ පුහුණුව ලබා දී ඇත. එමෙන්ම සමූපකාර ණය දෙන සමිතියට අයත් සණස Campus ආයතනය සහ ගණකාධිකරණ සහ කළමනාකරණ ආයතනය මගින් දිවිනැගුම බැංකුවල සේවයේ නිරත අය සඳහාම ගණකාධිකරණය, ව්‍යාපාර පරිපාලනය යන විෂයට අදාළව 600 කට පමණ පුහුණුව ලබා දී ඇත. පසුගිය වසර අග භාගයේ ඉහත පාඨමාලා හැදෑරීම සඳහා යොමුකළ කණ්ඩායමක් මේ දක්වාද පුහුණුව ලබමින් සිටියි. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පුහුණු හා පර්යේෂණ අංශය ස්ථාපනය කිරීමෙන් අනතුරුව පහත වැඩසටහන් පැවැත්වීම සඳහා සැලසුම් කරන ලදී.

### 2.2.1 ආයතනයේ දැක්ම, මෙහෙවර ප්‍රකාශය සහ අභිමතාර්ථ සකස් කිරීම පිළිබඳ වැඩමුළුව

මෙම වැඩමුළුව පැවැත්වීම සඳහා සුදුසු විද්වත් මඩුල්ලක් සහ වැඩමුළුව මෙහෙයවීම සඳහා මනා පුරුදු සම්පත් දායකයින් හඳුනාගෙන, අදාළ වැය ඇස්තමේන්තු සහ ව්‍යාපෘති වාර්තා අනුමත කර, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී පුහුණුව පැවැත්වීම සඳහා අවස්ථා 03 කදී පමණ සැලසුම් කළ ද සහභාගීවන්නන්ගේ කාර්ය බහුලත්වය නිසා දින නියමයක් නොමැතිව කල් දැමීමට සිදුවිය.

### 2.2.2 දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව.

දිවයිනේ දිස්ත්‍රික් 25 නියෝජනය වන පරිදි සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල, දිවිනැගුම බැංකු සහ ක්ෂේත්‍රයේ රාජකාරි වල නියුතු නිලධාරීන් දිවිනැගුම වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 437 ක් පැවැත්වීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු හා සැලසුම් සකස් කළද ඉහත දැක්ම, මෙහෙවර සහඅභිමතාර්ථ සකස් කිරීමේ වැඩමුළුව ආරම්භ කිරීමෙන් පසු එමගින් සකස් කරන මෙහෙවර ප්‍රකාශය ආදිය මෙම වැඩමුළු සඳහා අවශ්‍ය වූ බැවින් ඉහත වැඩසටහන නොපැවැත්වීම හේතුකොට ගෙන මෙම වැඩසටහන ද පැවැත්වීමට නොහැකි විය.

### 2.2.3. ගිණුම් අංශයේ කටයුතු කඩිනම් කිරීම උදෙසා ගණකාධිකාරී වරුන් Pay roll සහ CIGAS මෘදුකාංග පිළිබඳ පුහුණු කිරීම.

සියලුම කලාප කාර්යාල නියෝජනය වන පරිදි රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් ගණකාධිකාරිවරුන් මේ යටතේ පුහුණු කරන ලදී. මෙම පුහුණුව මුදල් අයකිරීමකින් තොරව පවත්වන ලදී.

### 2.2.4. දිවිනැගුම බැංකු කළමනාකරුවන්ගේ ආකල්ප සංවර්ධනය කිරීමේ පුහුණු වැඩමුළුව.

පාරිභෝගික ආකර්ෂණය වැඩි කිරීමේ අරමුණින් දීප ව්‍යාප්තව පිහිටා ඇති දිවිනැගුම බැංකු 1074 හි සේවයේ නියුතු නිලධාරීන් පුහුණු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන පැවැත්වීම සඳහා සැලසුම් කර ඇත. මෙය ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වීම සඳහා සැලසුම් කරන ලදී.

ඉහත පුහුණු වැඩසටහන් වලට අමතරව 2014 වසරේ එවකට පැවති කලාප කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාල මගින්ද විවිධ පුහුණු වැඩසටහන් සංවිධානය කොට නිලධාරීන් පුහුණු කර ඇත.

## 2.3 විමර්ශන අංශය

### 2.3.1 අරමුණ

ආයතනය තුල සේවය කරන සියළුම නිලධාරීන් විසින් සිදු කරන අක්‍රමිකතා සහ සාපරාධි ක්‍රියා සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විගණන වාර්තා ඇතුළු විමර්ශනය කල යුතු සියළු කාර්යයන් සිදු කර දූෂණයෙන් වංචාවෙන් තොර යහපත් ආයතනයක් බවට පත් කිරීම

### 2.3.2 කාර්යයන්

01. මූලික විමර්ශනය
02. චෝදනා පත්‍ර නිකුත් කිරීම/නිදහසට කරුණු විමසීම
03. විධිමත් විනය පරීක්ෂණය පැවැත්වීම
04. විධිමත් විනය නියෝගය නිකුත් කිරීම
05. අභියාචනා සලකා බැලීම

1. 2014 වර්ෂයට අදාලව විධිමත් විනය පරීක්ෂණ වාර්තා - 25
2. 2014 වර්ෂයට අදාලව විධිමත් විනය පරීක්ෂණට අදාල නියෝග - 20
3. 2014 වර්ෂයට අදාලව මූලික විමර්ශන /අභ්‍යන්තර විගණන වාර්තා - 16
4. 2014 වර්ෂයට අදාලව චෝදනා පත්‍ර නිකුත් කර නැත
5. 2014 වර්ෂයට අදාලව අභියාචනා මණ්ඩලය පහත පරිදි තීරණ ලබා දීම

- දඬුවම් සහිතව නැවත සේවය ලබා දීම - 13
- දඬුවම් ලිහිල් කිරීම - 06
- ප්‍රතික්ෂේප කිරීම - 18

## දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

## ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2014

### *2014.12.31 දිනට යෝජිත ව්‍යාපෘති සැලැස්ම හා එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය*

| කලාපය | දිස්ත්‍රික්කය | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | යවන ලද ප්‍රතිපාදන (රු.මි.) | නිකුත් කළ අත් මුදල් (රු.මි.) | කෘෂිකර්ම ව්‍යාපෘති | | පශු සම්පත් ව්‍යාපෘති | | ධීවර ව්‍යාපෘති | | කර්මාන්ත ව්‍යාපෘති | | අලෙවි හා සේවා | | මුළු ව්‍යාපෘති | | නිම ව්‍යා. ගණන | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ගණන | මුදල (රු.මි.) | ගණන | මුදල (රු.මි.) | ගණන | මුදල (රු.මි.) | ගණන | මුදල (රු.මි.) | ගණන | මුදල (රු.මි.) | ගණන | මුදල (රු.මි.) | | |
| අංක 01 | කොළඹ | 300.00 | 255.00 | 377.1 | 503 | 16.25 | 739 | 27.06 | 74 | 3.86 | 5676 | 223.78 | | | 6992 | 270.95 | 2979 | 87.6 |
| | කළුතර | 160.00 | 136.00 | | 3449 | 26.58 | 551 | 11.11 | 57 | 0.21 | 2298 | 55.82 | 1327 | 21.77 | 7682 | 115.49 | 6134 | 77.13 |
| | රත්නපුර | 180.00 | 153.00 | | 2318 | 38.54 | 340 | 8.91 | | | 2639 | 84.17 | 810 | 20.35 | 6107 | 151.97 | 3472 | 71.53 |
| | ගාල්ල | 200.00 | 170.00 | | 4413 | 40.62 | 1186 | 13.89 | 497 | 8.35 | 4843 | 75.29 | 2748 | 40.82 | 13687 | 178.97 | 7018 | 84.62 |
| | මාතර | 140.00 | 119.00 | | 1527 | 23.21 | 264 | 8.48 | 1468 | 10.80 | 3620 | 79.03 | | | 6879 | 121.52 | 3370 | 57.21 |
| ***උප එකතුව*** | | ***980.00*** | ***833.00*** | ***377.1*** | ***12210*** | ***145.20*** | ***3080*** | ***69.45*** | ***2096*** | ***23.22*** | ***19076*** | ***518.09*** | ***4885*** | ***82.94*** | ***41347*** | ***838.90*** | ***22973*** | ***378.09*** |
| අංක 02 | ගම්පහ | 260.00 | 221.00 | 437.0 | 856 | 16.90 | 951 | 24.93 | 177 | 6.38 | 7883 | 208.92 | | | 9867 | 257.13 | 4566 | 116.68 |
| | කුරුණෑගල | 280.00 | 238.00 | | 4764 | 70.57 | 3255 | 90.60 | 42 | 1.45 | 4106 | 105.50 | 592 | 12.38 | 12759 | 280.5 | 5466 | 135.44 |
| | පුත්තලම | 120.00 | 102.00 | | 933 | 16.86 | 2234 | 41.71 | 425 | 9.24 | 2012 | 51.54 | | | 5604 | 119.35 | 3227 | 60.17 |
| | කෑගල්ල | 180.00 | 153.00 | | 3120 | 45.70 | 1938 | 24.72 | 3427 | 89.24 | 738 | 19.17 | | | 9223 | 178.83 | 6097 | 96.59 |
| ***උප එකතුව*** | | ***840.00*** | ***714.00*** | ***437.0*** | ***9673*** | ***150.03*** | ***8378*** | ***181.96*** | ***4071*** | ***106.31*** | ***14739*** | ***385.13*** | ***592*** | ***12.38*** | ***37453*** | ***835.81*** | ***19356*** | ***408.88*** |
| අංක 03 | මහනුවර | 260.00 | 221.00 | 496.3 | 2479 | 56.14 | 2268 | 62.83 | 14 | 1.35 | 4945 | 139.68 | | | 9706 | 260.00 | 8243 | 206.56 |
| | මාතලේ | 80.00 | 68.00 | | 1061 | 13.97 | 592 | 17.71 | 2 | 0.03 | 1742 | 47.57 | | | 3397 | 79.28 | 3397 | 78.28 |
| | නුවරඑළිය | 100.00 | 85.00 | | 652 | 17.12 | 1315 | 32.97 | 10 | 1.94 | 936 | 25.34 | | | 2913 | 77.37 | 2420 | 52.06 |
| | බදුල්ල | 180.00 | 153.00 | | 4559 | 67.77 | 2352 | 58.28 | 19 | 0.27 | 1759 | 48.92 | | | 8689 | 175.24 | 8421 | 153.18 |
| ***උප එකතුව*** | | ***620.00*** | ***527.00*** | ***496.3*** | ***8751*** | ***155.00*** | ***6527*** | ***171.79*** | ***45*** | ***3.59*** | ***9382*** | ***261.51*** | ***0.00*** | ***0.00*** | ***24705*** | ***591.89*** | ***22481*** | ***490.08*** |
| අංක 04 | හම්බන්තොට | 100.00 | 85.00 | 209.0 | 1610 | 27.97 | 219 | 7.88 | 108 | 3.70 | 2110 | 59.75 | | | *4047* | *99.30* | *2899* | 64.20 |
| | මොනරාගල | 80.00 | 68.00 | | 1626 | 10.10 | 231 | 5.71 | 20 | 0.43 | 21948 | 51.13 | 38 | 0.63 | *23863* | *68.00* | *5829* | 39.46 |
| | අම්පාර | 100.00 | 85.00 | | 1646 | 20.98 | 1891 | 33.31 | 192 | 4.63 | 1781 | 40.58 | | | *5510* | *99.50* | *4472* | 75.92 |
| ***උප එකතුව*** | | ***280.00*** | ***238.00*** | ***209.0*** | ***4882*** | ***59.05*** | ***2341*** | ***46.90*** | ***320*** | ***8.76*** | ***25839*** | ***151.46*** | ***38*** | ***0.63*** | ***33420*** | ***266.80*** | ***13200*** | ***179.58*** |
| අංක 05 | අනුරාධපුරය | 140.00 | 119.00 | 275.7 | 5537 | 55.41 | 2967 | 41.27 | 126 | 2.64 | 1202 | 29.76 | 508 | 9.63 | 10340 | 138.71 | 5369 | 76.50 |
| | පොලොන්නරුව | 116.20 | 104.20 | | 2560 | 23.81 | 3169 | 33.31 | 141 | 1.16 | 1102 | 23.50 | 447 | 10.30 | 7419 | 92.08 | 6409 | 73.4 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ත්‍රිකුණාමලය | 110.68 | 81.12 | | 3260 | 35.06 | 1298 | 27.68 | 1051 | 14.62 | 2119 | 36.41 | | | 7728 | 113.77 | 1604 | 33.32 |
| | මඩකලපුව | 60.00 | 51.00 | | 485 | 7.73 | 2333 | 38.21 | 91 | 1.66 | 386 | 9.33 | 247 | 3.06 | 3542 | 59.99 | *1936* | *51.01* |
| ***උප එකතුව*** | | ***426.88*** | ***355.32*** | ***275.7*** | ***11842*** | ***122.01*** | ***9767*** | ***140.47*** | ***1409*** | ***20.08*** | ***4809*** | ***99.00*** | ***1202*** | ***22.99*** | ***29029*** | ***404.55*** | ***15318*** | ***234.24*** |
| | *වව්නියාව* | | *5.00* | | 50 | 1.43 | 75 | 2.54 | 1 | 0.01 | 29 | 1.01 | | | 155 | 4.99 | 155 | 4.99 |
| | *යාපනය* | | *5.00* | | 55 | 1.44 | 88 | 1.46 | 29 | 0.81 | 33 | 0.74 | 14 | 0.53 | 219 | 4.98 | 219 | 4.99 |
| *අංක 06* | *මන්නාරම* | | *5.00* | *25.0* | 5 | 0.12 | 643 | 4.41 | 1 | 0.02 | 15 | 0.42 | | | 664 | 4.97 | 664 | 4.98 |
| | *මුලතිව්* | | *5.00* | | 200 | 2.00 | 136 | 3.00 | | | | | | | 336 | 5.00 | 336 | 4.99 |
| | *කිලිනොච්චිය* | | *5.00* | | | | 45 | 2.50 | 50 | 2.50 | | | | | 95 | 5.00 | 95 | 5.00 |
| ***උප එකතුව*** | | ***0.00*** | ***25.00*** | ***25.0*** | ***310*** | ***4.99*** | ***987*** | ***13.91*** | ***81*** | ***3.34*** | ***77*** | ***2.17*** | ***14*** | ***0.53*** | ***1469*** | ***24.94*** | ***1469*** | ***24.95*** |
| **මුළු එකතුව** | | **3146.88** | **2692.32** | **1820.2** | **47668** | **636.28** | **31080** | **624.48** | **8022** | **165.30** | **73922** | **1417.36** | **6731** | **119.47** | **167423** | **2962.89** | **94797** | **1715.82** |

# දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
## ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2014
### *2014.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය (කලාප හා දිස්ත්‍රික් වශයෙන්)*

| කලාපය | දිස්ත්‍රික්කය | වෙන් කල ප්‍රතිපාදන (රු.මි.) | යවන ලද ප්‍රතිපාදන (රු.මි.) | නිදහස් කල අක් මුදල් (රු.මි.) | යෝජිත මුළු ව්‍යාපෘති | | නිමි ව්‍යාපෘති ගණන | වියදම (රු.මි.) | යවා ඇති අක් මුදලට සාපේක්ෂව වියදමේ % |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | *ගණන* | *මුදල (රු.මි.)* | | | |
| අංක 01 | කොළඹ | 300.00 | 255.00 | 377.1 | 6992 | 270.95 | 2979 | 87.6 | 100.26% |
| | කළුතර | 160.00 | 136.00 | | 3914 | 101.84 | 6134 | 77.13 | |
| | රත්නපුර | 180.00 | 153.00 | | 6107 | 151.97 | 3472 | 71.53 | |
| | ගාල්ල | 200.00 | 170.00 | | 13687 | 178.97 | 7018 | 84.62 | |
| | මාතර | 140.00 | 119.00 | | 7282 | 124.7 | 3370 | 57.21 | |
| *උප එකතුව* | | ***980.00*** | ***833.00*** | ***377.10*** | ***37982*** | ***828.43*** | ***22973*** | ***378.09*** | **100.26%** |
| අංක 02 | ගම්පහ | 260.00 | 221.00 | 437.0 | 9867 | 257.13 | 4566 | 116.68 | 93.56% |
| | කුරුණෑගල | 280.00 | 238.00 | | 12759 | 280.5 | 5466 | 135.44 | |
| | පුත්තලම | 120.00 | 102.00 | | 5604 | 119.35 | 3227 | 60.17 | |
| | කෑගල්ල | 180.00 | 153.00 | | 9223 | 178.83 | 6097 | 96.59 | |
| *උප එකතුව* | | ***840.00*** | ***714.00*** | ***437.04*** | ***37453*** | ***835.81*** | ***19356*** | ***408.88*** | 93.56% |
| අංක 03 | මහනුවර | 260.00 | 221.00 | 496.30 | 9706 | 260.00 | 8243 | 206.56 | 98.75% |
| | මාතලේ | 80.00 | 68.00 | | 3397 | 79.28 | 3397 | 78.28 | |
| | නුවරඑළිය | 100.00 | 85.00 | | 2913 | 77.37 | 2420 | 52.06 | |
| | බදුල්ල | 180.00 | 153.00 | | 8689 | 175.24 | 8421 | 153.18 | |
| *උප එකතුව* | | ***620.00*** | ***527.00*** | ***496.30*** | ***24705*** | ***591.89*** | ***22481*** | ***490.08*** | 98.75% |
| අංක 04 | හම්බන්තොට | 100.00 | 85.00 | 209.40 | 4047 | 99.30 | 2899 | 64.20 | 85.76% |
| | මොනරාගල | 80.00 | 68.00 | | 23863 | 68.00 | 5829 | 39.46 | |
| | අම්පාර | 100.00 | 85.00 | | 5510 | 99.50 | 4472 | 75.92 | |
| *උප එකතුව* | | ***280.00*** | ***238.00*** | ***209.40*** | ***33420*** | ***266.80*** | ***13200*** | ***179.58*** | 85.76% |
| අංක 05 | අනුරාධපුරය | 140.00 | 119.00 | 275.7 | 10340 | 138.71 | 5369 | 76.50 | 84.95% |
| | පොළොන්නරුව | 116.20 | 104.20 | | 7419 | 92.08 | 6409 | 73.41 | |
| | ත්‍රිකුණාමලය | 110.68 | 81.12 | | 7728 | 113.77 | 1604 | 33.32 | |
| | මඩකලපුව | 60.00 | 51.00 | | 3542 | 59.99 | *1936* | *51.01* | |
| *උප එකතුව* | | ***426.88*** | ***355.32*** | ***275.74*** | ***29029*** | ***404.55*** | ***15318*** | ***234.24*** | 84.95% |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අංක 06 | *වව්නියාව* | | *5.00* | 25.00 | 155 | 4.99 | 155 | 4.99 | 99.80% |
| | *යාපනය* | | *5.00* | | 219 | 4.98 | 219 | 4.99 | |
| | *මන්නාරම* | | *5.00* | | 664 | 4.97 | 664 | 4.98 | |
| | *මුලතිව්* | | *5.00* | | 336 | 5.00 | 336 | 4.99 | |
| | *කිලිනොච්චිය* | | *5.00* | | 95 | 5.00 | 95 | 5.00 | |
| *උප එකතුව* | | ***0.00*** | ***25.00*** | ***25.00*** | ***1469*** | ***24.94*** | ***1469*** | ***24.95*** | 99.80% |
| **මුළු එකතුව** | | **3146.88** | **2692.32** | **1820.58** | **164058** | **2952.42** | **94797** | **1715.82** | **94.25%** |

** කලාප 02 හා කලාප 04 වෙත යවන ලද ඉහත අක් මුදලින් **පුත්තලම උළු වැඩසටහන සඳහා රු.මි. 30 ක්ද, හම්බන්තොට නිවාස වැඩසටහන සඳහා රු.මි.24.95** ක්ද වැය දරා ඇත.*

# දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

## ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2014

### *2014.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය (දිස්ත්‍රික් හා අංශ වශයෙන්)*

| කලාපය | දිස්ත්‍රික්කය | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | යවන ලද ප්‍රතිපාදන (රු.මි.) | නිදහස් කළ අරමුදල් (රු.මි.) | *නිමි ව්‍යාපෘති* | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | කෘෂිකර්ම | | පශු සම්පත් | | ධීවර | | කර්මාන්ත | | අලෙවි හා සේවා | | සමස්ත | |
| | | | | | *ගණන* | *වියදම (රු.මි.)* | *ගණන* | *වියදම (රු.මි.)* | *ගණන* | *වියදම (රු.මි.)* | *ගණන* | *වියදම (රු.මි.)* | *ගණන* | *වියදම (රු.මි.)* | *ගණන* | *වියදම (රු.මි.)* |
| අංක 01 | කොළඹ | 300.00 | 255.00 | 377.1 | 300 | 5.57 | 278 | 6.22 | 29 | 1.62 | 2061 | 67.58 | 311 | 6.61 | 2979 | 87.60 |
| | කළුතර | 160.00 | 136.00 | | 2753 | 18.15 | 238 | 4.83 | 33 | 1.05 | 2475 | 42.61 | 635 | 10.49 | 6134 | 77.13 |
| | රත්නපුර | 180.00 | 153.00 | | 1281 | 17.61 | 118 | 2.49 | | | 1520 | 42.11 | 553 | 9.32 | 3472 | 71.53 |
| | ගාල්ල | 200.00 | 170.00 | | 3288 | 27.01 | 655 | 5.49 | 54 | 0.78 | 1944 | 35.79 | 1077 | 15.55 | 7018 | 84.62 |
| | මාතර | 140.00 | 119.00 | | 801 | 11.26 | 101 | 1.89 | 501 | 3.01 | 1412 | 32.01 | 555 | 9.04 | 3370 | 57.21 |
| | ***උප එකතුව*** | ***980.00*** | ***833.00*** | ***377.10*** | ***8423*** | ***79.60*** | ***1390*** | ***20.92*** | ***617*** | ***6.46*** | ***9412*** | ***220.10*** | ***3131*** | ***51.01*** | ***22973*** | ***378.09*** |
| අංක 02 | ගම්පහ | 260.00 | 221.00 | 437.0 | 246 | 4.91 | 418 | 10.38 | 64 | 2.93 | 3171 | 86.06 | 667 | 12.4 | 4566 | 116.68 |
| | කුරුණෑගල | 280.00 | 238.00 | | 1546 | 26.12 | 1453 | 43.12 | 6 | 0.17 | 2028 | 57.72 | 433 | 8.31 | 5466 | 135.44 |
| | පුත්තලම | 120.00 | 102.00 | | 562 | 9.02 | 1424 | 21.38 | 287 | 6.78 | 722 | 18.38 | 232 | 4.61 | 3227 | 60.17 |
| | කෑගල්ල | 180.00 | 153.00 | | 2017 | 27.76 | 1596 | 10.85 | 4 | 0.12 | 2268 | 53.23 | 212 | 4.63 | 6097 | 96.59 |
| | ***උප එකතුව*** | ***840.00*** | ***714.00*** | ***437.04*** | ***4371*** | ***67.81*** | ***4891*** | ***85.73*** | ***361*** | ***10.00*** | ***8189*** | ***215.39*** | ***1544*** | ***29.95*** | ***19356*** | ***408.88*** |
| අංක 03 | මහනුවර | 260.00 | 221.00 | 496.30 | 2203 | 31.81 | 1922 | 51.31 | 8 | 0.24 | 3372 | 110.42 | 738 | 12.78 | 8243 | 206.56 |
| | මාතලේ | 80.00 | 68.00 | | 1061 | 13.76 | 592 | 17.29 | 2 | 0.04 | 1742 | 47.19 | | | 3397 | 78.28 |
| | නුවරඑළිය | 100.00 | 85.00 | | 662 | 7.55 | 1041 | 28.09 | 8 | 1.66 | 566 | 12.52 | 143 | 2.24 | 2420 | 52.06 |
| | බදුල්ල | 180.00 | 153.00 | | 5136 | 66.70 | 1719 | 41.05 | 51 | 0.40 | 1193 | 41.10 | 322 | 3.93 | 8421 | 153.18 |
| | ***උප එකතුව*** | ***620.00*** | ***527.00*** | ***496.30*** | ***9062*** | ***119.82*** | ***5274*** | ***137.74*** | ***69*** | ***2.34*** | ***6873*** | ***211.23*** | ***1203*** | ***18.95*** | ***22481*** | ***490.08*** |
| අංක 04 | හම්බන්තොට | 100.00 | 85.00 | 209.00 | 1139 | 18.4 | 43 | 2.03 | 45 | 1.16 | 1477 | 41.09 | 195 | 1.52 | *2899* | *64.20* |
| | මොනරාගල | 80.00 | 68.00 | | 1949 | 13.96 | 226 | 4.29 | 17 | 0.38 | 667 | 16.79 | 2970 | 4.04 | *5829* | *39.46* |
| | අම්පාර | 100.00 | 85.00 | | 1471 | 18.02 | 1474 | 23.55 | 156 | 3.66 | 1171 | 27.74 | 200 | 2.95 | *4472* | *75.92* |
| | ***උප එකතුව*** | ***280.00*** | ***238.00*** | ***209.00*** | ***4559*** | ***50.38*** | ***1743*** | ***29.87*** | ***218*** | ***5.20*** | ***3315*** | ***85.62*** | ***3365*** | ***8.51*** | ***13200*** | ***179.58*** |
| අංක 05 | අනුරාධපුරය | 140.00 | 119.00 | 275.7 | 2527 | 29.06 | 1557 | 24.80 | 73 | 1.58 | 989 | 16.79 | 223 | 4.27 | 5369 | 76.50 |
| | පොලොන්නරුව | 116.20 | 104.20 | | 2197 | 21.85 | 2604 | 20.21 | 69 | 2.00 | 1053 | 25.50 | 486 | 3.85 | 6409 | 73.41 |
| | ත්‍රිකුණාමලය | 110.68 | 81.12 | | 594 | 7.60 | 18 | 0.36 | 208 | 4.08 | 318 | 10.14 | 466 | 11.14 | 1604 | 33.32 |
| | මඩකලපුව | 60.00 | 51.00 | | 481 | 7.61 | 776 | 30.44 | 90 | 1.61 | 358 | 8.4 | 231 | 2.95 | 1936 | 51.01 |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| *උප එකතුව* | | ***426.88*** | ***355.32*** | ***275.74*** | ***5799*** | ***66.12*** | ***4955*** | ***75.81*** | ***440*** | ***9.27*** | ***2718*** | ***60.83*** | ***1406*** | ***22.21*** | ***15318*** | ***234.24*** |
| *අංක 06* | *වව්නියාව* | | *5.00* | *25.00* | 50 | 1.43 | 75 | 2.54 | 1 | 0.01 | 26 | 0.87 | 3 | 0.14 | 155 | 4.99 |
| | *යාපනය* | | *5.00* | | 55 | 1.44 | 88 | 1.46 | 29 | 0.81 | 26 | 0.70 | 21 | 0.58 | 219 | 4.99 |
| | *මන්නාරම* | | *5.00* | | 5 | 0.12 | 643 | 4.42 | 1 | 0.02 | 12 | 0.32 | 3 | 0.10 | 664 | 4.98 |
| | *මුලතිව්* | | *5.00* | | 200 | 2.00 | 136 | 2.99 | | | | | | | 336 | 4.99 |
| | *කිලිනොච්චිය* | | *5.00* | | | | 45 | 2.50 | 50 | 2.50 | | | | | 95 | 5.00 |
| *උප එකතුව* | | ***0.00*** | ***25.00*** | ***25.00*** | ***310*** | ***4.99*** | ***987*** | ***13.91*** | ***81*** | ***3.34*** | ***64*** | ***1.89*** | ***27*** | ***0.82*** | ***1469*** | ***24.95*** |
| **මුළු එකතුව** | | **3146.88** | **2692.32** | **1820.18** | **32524** | **388.72** | **19240** | **363.98** | **1786** | **36.61** | **30571** | **795.06** | **10676** | **131.45** | **94797** | **1715.8** |

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

දිවි නැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2014

***මූල්‍ය හා භෞතික ප්‍රගතිය ව්‍යාපෘති වර්ග අනුව 2014.12.31 දිනට***

| කලාපය | **ව්‍යාපෘති වර්ගීකරණය** | | | | | | | | | | **මුළු එකතුව** | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | *කෘෂි ව්‍යාපෘති* | | *පශු ව්‍යාපෘති* | | *ධීවර ව්‍යාපෘති* | | *කර්මාන්ත ව්‍යාපෘති* | | *අලෙවි ව්‍යාපෘති* | | | |
| | *නිම් ගණන* | *වියදම (රු.මි.)* | *නිම් ගණන* | *වියදම (රු.මි.)* | *නිම් ගණන* | *වියදම (රු.මි.)* | *නිම් ගණන* | *වියදම (රු.මි.)* | *නිම් ගණන* | *වියදම (රු.මි.)* | *නිම් ගණන* | *වියදම (රු.මි.)* |
| අංක 01 | 8423 | 79.6 | 1390 | 20.92 | 617 | 6.46 | 9412 | 220.1 | 3131 | 51.01 | 22,973 | 378.09 |
| අංක 02 | 4371 | 67.81 | 4891 | 85.73 | 361 | 10 | 8189 | 215.39 | 1544 | 29.95 | 19,356 | 408.88 |
| අංක 03 | 9062 | 119.82 | 5274 | 137.74 | 69 | 2.34 | 6873 | 211.23 | 1203 | 18.95 | 22,481 | 490.08 |
| අංක 04 | 4559 | 50.38 | 1743 | 29.87 | 218 | 5.20 | 3315 | 85.62 | 3365 | 8.51 | 13,200 | 179.58 |
| අංක 05 | 5799 | 66.12 | 4955 | 75.81 | 440 | 9.27 | 2718 | 60.83 | 1406 | 22.21 | 15,318 | 234.24 |
| අංක 06 | 310 | 4.99 | 987 | 13.91 | 81 | 3.34 | 64 | 1.89 | 27 | 0.82 | 1,469 | 24.95 |
| **එකතුව** | **32524** | **388.72** | **19240** | **363.98** | **1786** | **36.61** | **30571** | **795.06** | **10676** | **131.45** | **94,797** | **1715.82** |


## 03. සමාජ සුභ සාධන හා සමාජ ආරක්ෂණ හා අංශයේ කාර්යසාධනය

| |
|---|
| අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික මට්ටම දරිද්‍රතා මට්ටමින් පහත නොවැටෙන පරිදි ස්ථාවරව තබා ගනිමින්, ඔවුන් සමාජ හා ආර්ථිකමය වශයෙන් බල ගැන්වීමට සහය වීම. |

### 3.1සමෘද්ධිවැඩසටහන

1995 වර්ෂයේ දී සමෘද්ධි සහනාධාර වැඩසටහන ආරම්භ වීමට පෙර ක්‍රියාත්මක වූ බොහෝ සහනාධාර වැඩසටහන්වල මූලික පරමාර්ථය වූයේ සමාජ සුභ සාධනය පමණි.
නමුත් සමෘද්ධි සහනාධාර වැඩසටහන ත්‍රිවිධ සංවර්ධන ප්‍රවේශයන් ඔස්සේ,දිළිඳුකම පිටුදැකීම පරමාර්ථකොට ගෙන සමස්ත දිවයින පුරා ක්‍රියාත්මක විය.

**රූපසටහන - 01**




සමෘද්ධි සහනාධාර වැඩසටහනේ වැදගත්ම ලක්ෂණය නම්, එය රටේ සමස්ත සංවර්ධනය අරමුණු කොටගෙන සංවර්ධන දිශානතිව ක්‍රියාත්මක වීමයි. ඒ නිසා සමාජයේ අඩු ආදායම් ලබන පවුල්වල අවම ජීවන මට්ටම පවත්වා ගැනීම සඳහා යම් මූලාධාරයක් සපයන අතර ඔවුන්ගේ පවුල්වල ආදායම් තත්ත්වය වර්ධනය කරගනිමින් රටේ සමස්ත ආර්ථික ක්‍රියාවලියට ඵලදායී ලෙස සම්බන්ධ කර ගැනීම හා පෙළඹවීමේ ක්‍රම උපායක් ලෙස මෙය හැඳින්විය හැකය.

1995 සිට සමෘද්ධි සහනාධාර, දීමනාපත්‍ර ලෙස නිකුත් කිරීම සිදු කළද,2012 අයවැය යෝජනා අනුව මෙතෙක් ලබාදුන් සමෘද්ධි සහනාධාරය සමෘද්ධි බැංකු සංගම් මගින් ප්‍රතිලාභියාට මුදල් ලෙස ගෙවීම ආරම්භ කරන ලදී.

2014 වර්ෂයේදී ද මෙම ක්‍රියාවලිය සමස්ත දිවයින තුළම සාර්ථකව ක්‍රියාවට නැංවිණි.

වගුව - 02 **2014 වර්ෂයේ සහනාධාර වැඩසටහනට අදාලව දීමනාව බෙදී ගිය ආකාරය**

| සහනාධාර වටිනාකම රු. | අනිවාර්ය ඉතිරිකිරීම් රු. | සමාජ ආරක්ෂණ රු. | නිවාස ලොතරැයිය රු. | ප්‍රතිලාභියාට හිමිවන මුදල රු. |
|---|---|---|---|---|
| 1500/- | 300/- | 45/- | 10/- | 1145/- |
| 1200/- | 200/- | 45/- | 10/- | 945/- |
| 750/- | 100/- | 45/- | 10/- | 595/- |
| 210/- | 155/- | 45/- | 10/- | - |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

### 3.1.1අනිවාර්ය ඉතිරිකිරීම්

සමෘද්ධි ප්‍රතිලාභීන් ඉතිරිකිරීම් සඳහා හුරු කිරීමේ අරමුණින් සෑම ප්‍රතිලාභියෙකුම අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා දායක කරවනු ලබන අතර, යම් ආයෝජන අවශ්‍යතාවයකදී,හදිසි රෝහල් ගතවීමක දී, උසස් අධ්‍යාපන අවශ්‍යතාවයක දී අනිවාර්ය ඉතිරි කිරීම් දායක මුදල් ලබාගත හැකිය.

### 3.1.2. සමාජ ආරක්ෂණය

සමෘද්ධි ප්‍රතිලාභී පවුලක සිදුවන මරණයකදී,විවාහයකදී,රෝහල්ගතවීමකදී,දරු උපතකදී,පවුල් ආර්ථික වශයෙන් පහත් මට්ටමකට ඇද වැටීම වලක්වාලීමේ අරමුණින් සිදු කෙරෙන ආරක්ෂණ වැඩසටහන් සඳහා සෑම ප්‍රතිලාභියෙකුම දායක කරගනු ලැබේ.


### 3.1.3. නිවාස ලොතරැයිය

ප්‍රතිලාභී පවුල්වල නිවාස අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් සෑම ප්‍රතිලාභියෙකුගේම දායක මුදලින් ගොඩනංවනු ලබන නිවාස අරමුදලකි.

### 3.1.4.ප්‍රතිලාභියාට හිමිවන මුදල

සමෘද්ධි බැංකු හරහා ප්‍රතිලාභියාට අතට හිමිවන මුදලින්,ආහාර හෝ වෙනත් අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා තමාට අවශ්‍ය ඕනෑම ස්ථානයකින් භාණ්ඩ හෝ සේවා ලබාගැනීමේ අවකාශ සලසා ඇත.

රූපසටහන - 02 සමෘද්ධි ප්‍රතිපාදන සමෘද්ධි ප්‍රතිලාභීන් අතට පත්වීමේ ක්‍රියාවලිය




වගුව - 03 සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව (2009 – 2014)

| වර්ෂය | ප්‍රතිලාභී සංඛ්‍යාව |
|---|---|
| 2009 | 1,600,786 |
| 2010 | 1,572,129 |
| 2011 | 1,541,318 |
| 2012 | 1,516,543 |
| 2013 | 1,477,173 |
| 2014 | 1,479,811 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 01




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර


පසුගිය වසර වලට සාපේක්ෂව සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව ක්‍රමිකව අඩු වී ඇත

වගුව - 04 පසුගිය වසර හය තුල සහනාධාර වැඩසටහනේ වියදම (2009 – 2014)

| වර්ෂය | වියදම රු. |
|---|---:|
| 2009 | 9,274.10 |
| 2010 | 9,239,509,541.96 |
| 2011 | 9,043,442,154.63 |
| 2012 | 10,553,188,655.62 |
| 2013 | 15,255,979,958.73 |
| 2014 | 15,041,799,341.62 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 02 **2009 සිට 2014 දක්වා සහනාධාර වැඩසටහන් වියදම ප්‍රස්ථාරගතව දැක්වීම**




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වගුව - 05 **සමෘද්ධි සහනාධාර දීමනාව දිස්ත්‍රික් මට්ටමින් ලබාදුන් ආකාරය**

| දිස්ත්‍රික්කය | රු.210/- | රු.750/- | රු.1200/- | රු.1500/- | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කොළඹ | 1,787 | 48,650 | 0 | 237 | 50,654 |
| ගම්පහ | 7,731 | 106,481 | 4,273 | 315 | 118,800 |
| කළුතර | 6,241 | 46,033 | 11,748 | 115 | 64,137 |
| නුවර | 7,944 | 61041 | 21002 | 114 | 90,101 |
| මාතලේ | 3,330 | 35,743 | 3,466 | 194 | 42,733 |
| නුවරඑළිය | 8,124 | 24,946 | 6,617 | 15 | 39,702 |
| ගාල්ල | 8,250 | 55,284 | 9,126 | 53 | 72,713 |
| මාතර | 4,982 | 50,076 | 12,799 | 32 | 67,889 |
| හම්බන්තොට | 6,830 | 26,812 | 21,520 | 5 | 55,167 |
| යාපනය | 0 | 38,873 | 10,374 | 4,660 | 53,907 |
| මන්නාරම | 0 | 2,636 | 7,875 | 2,655 | 13,166 |
| වව්නියා | 2,805 | 8,234 | 846 | 102 | 11,987 |
| මුලතිව් | 44 | 2,088 | 7,198 | 1,714 | 11,044 |
| කිලිනොච්චි | 0 | 3,109 | 6,059 | 2,565 | 11,733 |

| දිස්ත්‍රික්කය | රු.210/- | රු.750/- | රු.1200/- | රු.1500/- | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| මඩකලපුව | 17,296 | 62,143 | 84 | 2 | 79,525 |
| අම්පාර | 14,324 | 57,720 | 2,858 | 108 | 75,010 |
| ත්‍රිකුණාමලය | 8,175 | 28,385 | 2,208 | 600 | 39,368 |
| කුරුණෑගල | 9,338 | 120,091 | 20,030 | 485 | 149,944 |
| පුත්තලම | 1,752 | 38,034 | 15,671 | 15 | 55,462 |
| අනුරාධපුරය | 5,671 | 48,124 | 8,743 | 474 | 63,012 |
| පොලොන්නරුව | 4,484 | 21,742 | 3,235 | 112 | 29,573 |
| බදුල්ල | 6,419 | 27,553 | 22,956 | 45 | 56,973 |
| මොනරාගල | 7,397 | 30,445 | 9,209 | 96 | 47,147 |
| රත්නපුර | 12,311 | 56,983 | 42,419 | 143 | 111,856 |
| කෑගල්ල | 8,881 | 37,866 | 21,428 | 33 | 68,208 |
| මුළු එකතුව | 154096 | 1039092 | 271,734 | 14,889 | 1,479,811 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

## 3.1.5 පෝෂණ වැඩසටහන

### 3.1.5.1 ආරම්භය හා විකාශය

සමෘද්ධිලාභී පවුල්වල ගැබිණි හා කිරිදෙන මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව පෝෂණ වැඩසටහන ආරම්භ කරන ලදී.මෙම වැඩසටහන සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන සහනාධාර වැඩසටහන් අතරින් එකකි. මෙම වැඩසටහනේ විකාශය පහත පරිදි වේ.

- 1992 වර්ෂයේදී ළදරු කිරිපිටි සහනාධාර වැඩසටහන නමින් ආරම්භ වූ මෙම වැඩසටහන, මගින් දිළිඳු පවුල්වල අලුතින් උපදින දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීම සඳහා මසකට රු.50/- ක් බැගින් වූ කිරිපිටි මුද්දර පත්‍රිකාවක් දරුවන්ට වයස අවුරුද්ද සම්පූර්ණ වන තුරු ලබාදී ඇත. මෙමගින් මසකට අවම වශයෙන් කිරිපිටි පැකට් 2 ක් මිලදී ගැනීමේ අවස්ථාව ලබාදී ඇත

- ළදරුවන්ට මව්කිරි දීම දිරි ගැන්වීම සඳහා මෙම වැඩසටහන මවුවරුන්ගේ පෝෂණය මුල් කරගෙන විශේෂ ආහාර මුද්දර වැඩසටහන නමින් 1994 වර්ෂයේ ජූලි මස සිට ප්‍රතිසංවිධානය කරන ලදී.

- 1994 දී දිළිඳු පවුල්වල අලුතින් දරු උපතක් ලද මවකට,දරු උපත සිදුවූ මාසයේ සිට ඉදිරි මාස 12 ක කාලය දක්වා විශේෂ ආහාර මුද්දර පත්‍රිකාවක් ලබාදුන් අතර සමූපකාර වෙළඳසැල් වලින් ප්‍රතිලාභියාට අවශ්‍ය ආහාර වර්ග මිලදී ගැනීම සඳහා රු. 100/- ක මාසික දීමනාවක් හිමිවිය.

- 1995 දිළිඳු සහන ආහාර මුද්දර වැඩසටහන අවසන්කර සමෘද්ධි වැඩසටහන ආරම්භ වුවද මෙම පෝෂණ සහනාධාර වැඩසටහන සමෘද්ධිලාභී පවුල් ආශ්‍රිතව දිගටම ක්‍රියාත්මක විය.

- 2000 වර්ෂයේ අප්‍රේල් මස සිට ළමා හා මාතෘ පෝෂණය නංවාලන අදහසින් ක්‍රියාත්මක කෙරෙන මෙම වැඩසටහන යටතේ දීමනා ලාභියෙකුට දැනට ලබාදෙන රු.100/- ක මාසික දීමනාව රු.150/- දක්වා ඉහළ නැංවීමට රජය තීරණය කර ක්‍රියාත්මක කර ඇත.

- එසේම එම වසරේ වතුවල පදිංචි අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයින් ප්‍රතිලාභ ලබාගැනීමට ඉදිරිපත් වී ඇත්තේ ඉතා සුළු වශයෙන් බැවින් මෙම තත්ත්වය වෙනස් කොට මෙම වැඩසටහන යටතේ දිළිඳු පවුල්වලට හිමිවිය යුතු ප්‍රතිලාභ නිසිපරිදි වතුවල පදිංචි පවුල්වලටද ලබාගතහැකිවන සේ කටයුතු කර ඇත.

### 3.1.5.2 පෝෂණ වැඩසටහනේ වර්තමාන තත්ත්වය

මහින්ද චිංතන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ගැබිණි මාතා සහන වැඩසටහන යථාර්තයක් බවට පත්කරමින් සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 330 පුරාම මෙම වැඩසටහන ව්‍යාප්ත කරන ලදී.

ඒ අනුව ගැබිණි හා කිරිදෙන මව්වරුන් සඳහා මසකට රු.500/-ක වටිනාකමින් යුක්ත මුද්දර 20 න් සමන්විත මුද්දර පත්‍රිකාවක් ලබාදෙන අතර,ඉන් මුල් මුද්දර 08 පූර්ව මාතෘ අවදිය සඳහා ද ඉතිරි මුද්දර 12 කිරි දෙන මව්වරු සඳහාද වෙන්කර ඇත.


එමගින් ලබාදෙන ආහාර ද්‍රව්‍ය,

- සුදු/රතු කැකුළු/සම්බා/නාඩු හාල් - 5kg
- කඩල/කව්පි/මුංඇට/ලංකා පරිප්පු/මයිසූර් පරිප්පු -500g
- බිත්තර/වියළි හාල්මැස්සන්/කරවල/සැමන්

  (බිත්තර 8 ක් හෝ එම වටිනාකමට සරිලන වියළි හාල්මැස්සන් හෝ කරවල)

මෙම පෝෂණ මල්ලට අදාල ද්‍රව්‍ය නිකුත් කරනු ලබන්නේ සමූපකාර ප්‍රාදේශීයක මගින් හෝ බලය ලත් වෙළෙන්දෙකු මගිනි.

### 3.4.3.පෝෂණ මල්ල ප්‍රතිලාභින් අතට පත්වීමේ ක්‍රියාවලිය



## 3.5. සමාජ ආරක්ෂණ වැඩසටහන

සමාජ ආරක්ෂණ අරමුදල භාරකාර මණ්ඩලයක් මගින් පාලනය වන අතර එය 1997 ජනවාරි 01 දින භාරකාර ඔප්පුවක් මගින්, පිහිටුවා ඇත. මෙම භාරකාර මණ්ඩලය සමෘද්ධි විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයෙකුගෙන් හා නිල බලයෙන් පත්වන සාමාජිකයන් සිව්දෙනෙකුගෙන් සමන්විත වන අතර ,සමෘද්ධි කොමසාරිස් ජනරාල් නිල බලයෙන් ම එහිසභාපති වේ.

සමාජ ආරක්ෂණ වැඩසටහන සමෘද්ධි සහනාධාරලාභීන්ගේ සමාජීය ආරක්ෂාව හා රැකවරණය සහතික කරනු වස් සමෘද්ධි ප්‍රතිලාභීන් සහ ඔවුන්ගේ පවුල් සාමාජිකයන්ට ආර්ථික හා සාමාජීය සංවර්ධන කාර්යයන්හි යෙදෙමින් ස්වශක්තියෙන් සමෘද්ධිය කරා පිය නැගීමට රුකුලක් වන අයුරින් පෙල ගස්වා ඇත.

එකී පරමාර්ථය පෙරදැරිව ප්‍රතිලාභින්ගේ පවුලේ සාමාජිකයන් ජීවන මගෙහි මුහුණ දෙන දහසක් බාධක වලදී සමාජීය හා ආර්ථික තත්ත්වය තවදුරටත් පහත වැටීමට ඇති ඉඩ ප්‍රස්ථා අහුරාලීමේ අරමුණින්

- ප්‍රතිලාභින්ගේ පවුලක සිදුවන පළමු හා දෙවන සජීවී දරු උපත් සඳහා රු.5000/- කද
- ප්‍රතිලාභියා හෝ දරුවෙකුගේ විවාහය සඳහා රු.3000/- ද
- ප්‍රතිලාභියා හෝ කාලාත්‍රයාගේ රෝහල්ගතවීමකදී දිනකට රු.200/- බැගින් වාර්ෂයේ උපරිම දින 30 ක් සඳහා රු.6000/- ද ලෙස ප්‍රතිලාභ ලබාදී ඇත.

මීට අමතරව සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන මගින් දරිද්‍රතා සීමාව මත බරතැබීමේ නිර්ණායක පදනම්ව දිවයින පුරා විසිර සිටින සමෘද්ධිලාභී පවුල්වල අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ, උසස් ලෙස සමත් වූ සිසු දරු දැරියන්ට මසකට රු 1000/- බැගින් වසර දෙකක අධ්‍යයන කාලයක් සඳහා වූ ශිෂ්‍යත්වයක් ලබාදීමට කටයුතු කර ඇත.

## 04. සමාජ සංවර්ධන අංශයේ කාර්යසාධනය

| |
|---|
| සමාජ සංවර්ධනය යනු සමාජයේ සියලුම අංශවල සමස්ත සංවර්ධනයයි. සමස්ත සමාජය තුල ආධ්‍යාත්මික සංවර්ධනයෙන් පිරිපුන් පරිසරයක් ඇති කිරීම මෙහි මූලික අරමුණ වේ. |

2014 වර්ෂයතුලදී, සමාජ සංවර්ධනය උදෙසා මෙම අංශය මඟින් ක්‍රියාත්මක කල වැඩසටහන් පිළිබඳව විස්තර පහත දක්වා ඇත.

- සියළු අවාසි සහගත සමාජ කොටස්වල සමාජීය වටිනාකම ඉස්මතු කිරීමට කටයුතු යෙදීම
- දිළිඳු බවට හේතු වන සමාජීය සාධකයන් හඳුනාගෙන පිළියම් යෙදීම.
- අඩු ආදායම්ලාභීන්ගේ හා එම පවුල්වල දරුවන්ගේ සාමාජීය හා සංස්කෘතික අගයන් වැඩි කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආධ්‍යාත්මික හා සදාචාර වර්ධනයෙන් පිරිපුන් පවුලක් ඇති කිරීම.

### 4.1. වර්තමාන කාර්යයභාරය

2014 වර්ෂයේදී දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහනට සමඟාමීව ක්‍රියාත්මක ආධ්‍යාත්මික හා සමාජ සංවර්ධන වැඩසටහන් ඉහත මුදල් යොදා ගෙන දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම සමාජ සංවර්ධන අංශය සැලසුම් කරනු ලැබීය. මීට අමතරව සමාජ සංවර්ධන පදනමේ අරමුදල් යොදා ගෙන මෙම වසරේ සමාජ සංවර්ධන වැඩසටහන්හි ඉලක්ක සපුරා ගෙන ඇත.

### 4.2. මත් හා දුම්වැටි නිවාරණ වැඩසටහන

- ❖ අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථික සංවර්ධනයට ප්‍රබල අභියෝගයක් වූ මත් හා දුම්වැටි භාවිතයෙන් සිදුවන ආර්ථික හා සමාජීය විනාශය පිළිබඳව දැනුවත් කරමින් මතින් තොර සාරධර්ම පිරි ගමක් ස්ථාපිත කිරීම මූලික අරමුණ විය.
- ❖ පසුගිය වර්ෂයන්හි ජාතික මට්ටමින් ක්‍රියාත්මක වූ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන ප්‍රවර්තන වර්ෂයේදී තවදුරටත් වැඩි දියුණු කරමින් ක්‍රියාත්මක කරන ලද අතර ප්‍රාදේශීය වශයෙන් හඳුනා ගන්නා ලද වැඩසටහන්ද ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාවට නංවා ඇත.
- ❖ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සහභාගීත්වයෙන් විශේෂ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා වසම් මට්ටමින් ක්‍රියාත්මක කරන ලදී.

- ❖ මීට අමතරව දුම්කොළ හා මධ්‍යසාර පිළිබද ජාතික අධිකාරි පනත සාර්ථකව ක්‍රියාත්මක කර වීමට ප්‍රජාව තුළින් බලපෑම් ඇති කිරීම, දුම්වැටි භාවිතය හා ප්‍රචාරය, අලෙවිය අධෛර්යමත් කිරීමට හා වෙළඳ සැල් හිමියන් පනතේ ප්‍රතිපත්ති පිළිබදව දැනුවත් කිරීම මෙම වර්ෂයේදී කළ ක්‍රියාකාරකම් අතර ප්‍රමුඛ වේ.

### 4.2.1.ජාත්‍යන්තර දුම්වැටි විරෝධි දිනය - මැයි 31

දරිද්‍රතාවයට බලපාන සාධක අතර මත්ද්‍රව්‍ය භාවිතය හා දුම්වැටි භාවිතය ප්‍රධාන වේ. එබැවින් සෑම වර්ෂයක්ම මැයි. 31 ජාත්‍යන්තර දුම්වැටි විරෝධි දිනය තේමා කොට ගෙන ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මීට අමතරවදුම්වැටියට යන මුදල රටේ සංවර්ධනයට යොමු කිරීම උදෙසා දීපව්‍යාප්තව කොඩි අලෙවි කිරීමේ වැඩසටහන ද ක්‍රියාත්මක කරඑමඟින් ලබා ගන්නා මුදල් ප්‍රාදේශීය මට්ටමින් සමාජ සංවර්ධන පදනම් වල තැන්පත් කරනු ලැබේ.

**"දැයක් පුබුදමු. මතින් තොර වෙමු. දිවිය නංවමු "** තේමා කර මුද්‍රණය කළ කොඩි දිවයින පුරා බෙදා හැරීමට කටයුතු කළ අතර මේ වෙනුවෙන් වැය වූ මුදල මිලියන 3.49 කි. ඒ තුළින් ලබා ගන්නා වූ මුළු ආදායම රු.මි. 90 කි.

එම මුදල් යොදා ගෙන මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, ළමා අපයෝජනය හා සිය දිවි නසා ගැනීම් වැලක්වීමේ වැඩසටහන්, අඩු ආදායම්ලාභීන්ගේ නිවාස සැකසීම අළුත්වැඩියාව, වැසිකිළි පහකසුකම් ලබාදීම හා සනීපාරක්ෂක වැඩසටහන්, ප්‍රාදේශීය සංවර්ධන හා විවිධ සුභසාධන හා ආපදා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. තවද අඩු ආදායම්ලාභී දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නගා සිටුවීම සදහා ශිෂ්‍යත්ව වැඩසටහන් වැනි සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කළේය.

## 4.3.වාර්ෂික කොඩි ආදායම (2007 – 2014)

වගුව **- 06**

| වර්ෂය | කොඩි ආදායම (රු.මි.) |
|---|---|
| 2007 | 51.9 |
| 2008 | 68.1 |
| 2009 | 83.2 |
| 2010 | 79.3 |
| 2011 | 86.3 |
| 2012 | 123.5 |
| 2013 | 124.7 |
| 2014 | 90.0 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

## 4.3.සමාජ සංවර්ධන පදනම

ජාත්‍යන්තර දුම්වැටි විරෝධි කොඩි දිනයේදි උපයන ලද කොඩි ආදායම් තැන්පත් කරමින් සියළුම ප්‍රාදේශීය මට්ටම් ස්ථාපිත කර ඇති සමාජ සංවර්ධන පදනමේ අරමුදලක් ඇත. මෙම අරමුදලේ මුදල් භාවිතා කරමින් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව 2014 වර්ෂයේ සමාජ සංවර්ධන පදනම් වලින් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත දක්වා ඇත



වගුව - 07 සමාජ සංවර්ධන පදනමේ අරමුදල් වලින්ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය

| ක්‍රියාත්මක කරන ලද වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | මුදල රු. |
|---|---|---|
| මත් නිවාරණ වැඩසටහන | 1833 | 5,736,410.00 |
| ළමා ආරක්ෂණ වැඩසටහන | 2775 | 12,897,936.00 |
| සිසු දිරිය ශිෂ්‍යත්ව | 2532 | 9,418,249.00 |
| පාසැල් නොයන ළමුන් පාසැල් ගත කිරීම | 1309 | 2,590,120.00 |
| ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන | 1141 | 6,481,697.00 |
| ආබාධිත වැඩසටහන | 918 | 4,576,668.00 |
| සංස්කෘතික හා ආධ්‍යාත්මක සංවර්ධන වැඩසටහන | 3313 | 7,227,861.00 |
| නිවාස අළුත්වැඩියා කිරීම | 1003 | 14,990,408.00 |
| නිවාස ඉදිකිරීම් | 357 | 17,350,723.00 |
| සනීපාරක්ෂක වැඩසටහන් | 1804 | 25,575,754.00 |
| වෙනත් වැඩසටහන් | 1870 | 11,415,925.00 |
| **එකතුව** | **18855** | **107,715,533.00** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

## 4.3.1ළමා ආරක්ෂාව පිළිබදව ක්‍රමවත් වූ වැඩ පිළිවෙලක් ගම තුළ ක්‍රියාත්මක කිරීම.

- සෑම ගමකම සක්‍රිය ළමා සමාජයක් බිහි කිරීම හා එම ළමා සමාජ නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. හා
- සෑම වසමකට ළමා සමාජ දරුවන් සදහා සෞන්දර්ය වැඩසටහන්, සංස්කෘතික තරග හා විෂය දැනුමට අදාළ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් පැවැත්වීම, රස වින්දන වැඩසටහන්, වෘත්තීය මාර්ගෝපදේශන, සංස්කෘතික මධ්‍යස්ථාන වටා ළමුන් ඒකරාශී කරවීමට.

  දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදි.

## 4.3.2.ඉතිරි කිරීම හා සකසුරුවම සදහා දරුවන් හුරු කිරීම ( සිසුරක/ කැකුළු ගිණුම්)

නිර්මාණශිලී කුසලතාවලින් පිරි අනාගතය භාර ගැනීමට සිටින දරුවන්ගේ ලෝකය ඔප්නැංවීමටත් ඔවුන්ගේ කුසලතාවයන් වර්ධනය කරමින් කායික මානසික හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කරමින් අනාගතය සඳහා වර්තමාන ළමා පරපුර පෙළ ගැස්වීම මෙම වැඩසටහනේ අරමුණයි. මේවන විට ක්‍රියාකාරී ළමා සමාජ 14,000 ක්‍රියාත්මක වන අතර ලක්ෂ 03 කට ආසන්න පිරිසක් සාමාජිකත්වයක් ලබා ගෙන ඇත.

**ළමා සමාජ දරුදැරියන්ගේ සංස්කෘතික හා සාහිත්‍යමය හැකියාවන් ඔප්නැංවීම**



මෙවරද ළමා සමාජ දරු දැරියන්ගේ සංස්කෘතික හා සාහිත්‍යමය හැකියාවන් ඔප්නැංවීම හා එම හැකියාවන් ජාතික තලයට ගෙන ඒම උදෙසා කලාප, ප්‍රාදේශීය, දිස්ත්‍රික් තරඟාවලින් ඒ ඒ දිස්ත්‍රික්කයන්හි පවත්වන ලදී. මේ සඳහා එම දිස්ත්‍රික්කවල සිංහල හා ද්‍රවිඩ මාධ්‍ය ළමා සමාජ දරුවන් තරඟ ඉසව් 15 කින් වයස් කාණ්ඩ 03 ක් ඔස්සේ තරඟවලට සහභාගී කරවන ලදී.

දිස්ත්‍රික්ක 25 ක ළමා සමාජ තරඟාවලිය සඳහා රු.මි. 2.931 ක් වැය කළ අතර ජාතික තරඟාවලිය 2015.

වර්ෂයේදී පැවැත්වීමට නියමිතය



## 4.4.ඉසුරුමත් නිවහනක් නිවාස සංවර්ධන වැඩසටහන

"ඉසුරුමත් නිවහනක් " තේමා කර ගනිමින් දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ නිවාසවල අළුත්වැඩියා කළයුතු අංගයන් කඩිනමින් අළුත්වැඩියා කිරීමට සැලසුම් කරන ලදී.

මෙහිදී අඩු ආදායම්ලාභී නිවාස ලාභීන්ගේ නිවාස අළුත්වැඩියාව සඳහා ( සෙවිලි තහඩු ලබාදීම/ වහල සැකසීම/ බිත්ති සැකසීම/ කපරාදු කිරීම, ගෙබිම සැකසීම ...... ) රු. 10,000/- උපරිමයකට යටත්ව අදියර 04 කින් මෙම ප්‍රතිපාදන ලබාදීමට අපේක්ෂා කරනු ලැබීය. මෙහි පළමු අදියරේදී අඩු ආදායම්ලාභීන් සඳහා රු. 2500/- ප්‍රතිපාදන ලබාදෙන ලදී.

ප්‍රතිලාභීන්-1,197,111

මුදල - රු මි 2,993.00

**4.5 රටවිරු නිවාස වැඩසටහන**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය/විදේශ කටයුතු ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය ඒකාබද්ධව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මෙහෙය වීම මත මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

| | |
|---|---|
| ණය ලබා දීම සඳහා තෝරා ගත් ඉල්ලුම් පත් සංඛ්‍යාව | 25001 |
| ණය ලබාදී ඇති සංඛයාව | 817 1 |
| වැඩ අවසන් නිවාස සංඛ්‍යාව | 5899 |

1 

විශේෂයෙන් ශ්‍රී ලංකාවට විදේශ විණිමය උපයා දෙන විගමණික ශ්‍රමිකයින්ගේ නිවාස සිහිනය සැබෑ කරනු වස් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය දිවයින පුරා පිහිටා ඇති සමෘද්ධි බැංකු ජාලය හරහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

එක් ප්‍රතිලාභියෙක් සඳහා රු ලක්ෂ 300,000/- ක ණය මුදලක් 10% පොළි අනුපාතය යටතේ ලබා දෙමින් එම විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන්ගේ රැකවරණය හා සුභසාධනය වෙනුවෙන් මෙම වැඩසටහන ආරම්භ කර ඇත.

## 05.ප්‍රජාමූල සංවිධාන අංශයේ කාර්යසාධනය

මානව හා භෞතික සම්පත් ශක්තිමත් කිරීමේ පුද්ගලයා, පවුල හා ප්‍රජාව තුල සමාජීය හා ආර්ථික තත්වය නගාසිටුවීමට දැනුම, ආකල්ප හා කුසලතාවයන් වර්ධනය කර ප්‍රජාමූල සංවිධාන ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටු හරහා ප්‍රජාව සවි බල ගැන්වීම.

### 5.1. දිස්ත්‍රික් මට්ටමින් නිලධාරීන් සහ ප්‍රතිලාභීන්දැනුවත් කිරීමේ වැඩසටහන

දකුණු ආසියානු කලාපයේ සංවර්ධනය වෙමින් පවතින රටවල දිළිඳුකම පිටුදැකීම සඳහා විවිධ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක වී තිබේ. ආසියානු කලාපයේ රටවල් හා සසඳන කල සුභසාධන වැඩසටහනක් ක්‍රියාත්මකවීම අතින් ශ්‍රීලංකාව ප්‍රමුඛස්ථානයක සිටී.
අතීතයේ ශ්‍රීලංකාවේ බොහෝ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක වී ඇත්තේ සුභසාධන ප්‍රවේශය මුල්කොට ගෙනයි.එසේ නමුත් මීට දශක තුනක පමණ කාලයක සිට එම වැඩසටහන් සමාජ සජීවිකරණය හා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය මූලික කර ගනිමින් ප්‍රජාව වෙත සමීප විය. වඩාත් සාර්ථකවූයේ මෙම ක්‍රමවේදය මූලික කරගත් වැඩසටහන්ය.
මෙහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධන ප්‍රවාහයෙන් ගිලිහීගිය දිළිඳුප්‍රජාව ජාතික සංවර්ධනයේ සැබෑ හවුල්කරුවන් බවටපත්කරගැනීමටහැකිවිය.සමස්ථ ප්‍රජාව ජාතික සංවර්ධන වැඩසටහන් සඳහා ඍජුව දායකකරගත් සුවිශේෂී අවස්ථාවක් ලෙස දිවිනැගුම වැඩපිළිවෙල පෙන්වාදිය හැකිය.

මෙමවැඩසටහනහාසම්බන්ධවූප්‍රජාවආර්ථික,සමාජීය හා ආධ්‍යාත්මික වශයෙන් සවිබල ගැන්වීම සඳහා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය ඍජුව යොදා ගැනීම කැපීපෙනෙන ලක්ෂනයකි. ඒ හරහා සමස්ථ ආර්ථික වර්ධනයට දිවිනැගුම වැඩපිළිවෙලින් විශාලදායකත්වයක් ලබාදෙන ලදි.

මෙම තත්වය වඩාත් ස්ථාවර කරනු වස් 2013 අංක 01 දරණ දිවිනැගුම පනත එළිදැක්විනි. එම පනත තුළ අන්තර්ගතව ඇත්තේ ප්‍රජාවගේ සුබ සාධනය සාක්ෂාත් කෙරෙන සංවර්ධන වැඩසටහන්වීම කැපීපෙනෙන ලක්ෂණයකි. සෑම සංවර්ධන වැඩසටහනක්ම ප්‍රජාව මූලික කර ගතයුතු බව මෙමපනතේ 09 වන වගන්තිය යටතේපැහැදිළිව දක්වා ඇත. එහි සඳහන්වන්නේ සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි එක් එක් ග්‍රාමනිලධාරී කොට්ඨාශයක් සඳහා හෝ එවැනි කොට්ඨාශ කීපයක් ආවරණය වන පරිදි දිවිනැගුම ප්‍රජාමූල සංවිධාන ආරම්භ කළයුතු බවය. මෙලෙස ආරම්භ කෙරෙන ප්‍රජාමූල සංවිධාන දිවිනැගුම ප්‍රතිලාභීන් හා ස්වකීය කැමැත්තෙන් මේ සඳහා දායකවන ප්‍රතිලාභීන් සියලුදෙනා ගේ සහභාගීත්වය ලබා ගත යුතුය.

දිවි නැගුම පනතේ සඳහන් පරිදි දිවිනැගුම දෙපාර්තුමේන්තුව මගින් ඉටුකළයුතු සියලු සංවර්ධන කාර්යයන් ප්‍රජාමූල සංවිධාන මූලික කොට ගෙන ප්‍රජාවගේ පූර්ණ සහභාගීත්වයෙන් ඉටු කළ යුතුවේ. ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමට සමගාමීව ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටු ද පිහිටුවා පවත්වාගෙන යා යුතුය.

මේ සියලු සංවිධාන පිහිටුවීි, යාවත්කාලීන කිරීම, පවත්වාගෙනයාම හා කළමනාකරණය කිරීම මෙන්ම එම සමිති වල සියලු කටයුතු අධීක්ෂණය කිරීම දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කරඇති ප්‍රජාමූල සංවිධාන අංශය මගින් සිදු කෙරේ.

ඒ අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මෙම අංශයේ කාර්ය භාරය දියත් කිරීම මගින් ප්‍රජාව සම්බන්ධවන පහලම සංවිධානාත්මක ඒකකය වන කුඩාකණ්ඩායම්වලින් සකස් වූ සමිති ඒකරාශී කොට

සංවිධාන ගතකිරීමෙන් ඔවුන් බලගැන්වීම සිදු කළ යුතු විය. එය සිදු කළ හැකිවන්නේ ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීම හා නව ප්‍රජාමූල සංවිධාන ස්ථාපිත කිරීම මගිනි.

### 5.1.1. ඉටු කළ යුතු කාර්යභාරය

ඉහතින් සඳහන් කළ කාර්යභාරයන් ඉටුකිරීම සඳහා දිවිනැගුම දෙපාර්තුමේන්තුවට අයත් දිස්ත්‍රික්කවල සේවයේ නියුතු නිලධාරීන් ට දිවිනැගුම පනත පිළිබඳව හා එහි කාර්ය භාරය , අරමුණු හා පරමාර්ථ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශයතාවය පෙනී ගියේය. මෙය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නව පනතක් මගින් ස්ථාපිත කර ක්‍රියාත්මක වන බැවින් ඒ පිළිබඳව දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වේ. එ නිසා එකී කරුණු සාක්ෂාත් කිරීමට දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවීමට සැලසුම් කරන ලදි.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා පරමාර්ථ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2014 වර්ෂයේ මැයි, ජූනි මාසවලදී ක්‍රියාත්මක කරන ලදි. (එම වැඩසටහන්වල ප්‍රගතියසඳහන් ඇමුණුම් මීට යා කොට ඇත).

මෙහි මූලික අරමුණ වූයේ දෙපාර්තමේන්තු පනත පිළිබඳව හා එහිකාර්යභාරය පිළිබඳව නිලධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීම මගින් ශක්තිමත් ප්‍රජාමූල සංවිධානජාලයක් ගොඩනැගීමසඳහා අවශ්‍ය පදනම සකස් කිරීමය.එනම් නිලධාරීන්ට පනතේ කාර්යභාරය පිළිබඳව අවශ්‍යමූලිකදැනුම ලබාදීමය. ඒසඳහා එක්දින දැනුවත් කිරීමේ වැඩසටහනක් දිස්ත්‍රික් මට්ටමෙන් පවත්වන ලදි. එම දැනුවත් කිරීමේ වැඩසටහනට ඇතුලත්වූ මාතෘකා පහත සඳහන්ය.

### 5.1.2. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා;

- දිවිනැගු මසංවර්ධනප්‍රවේශය.
- ක්ෂුද්‍ර මූල්‍ය සේවාවන් සැපයිම තුළින් දිළිඳුකම අවම කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා හඳුනා ගැනීම.
- දිවිනැගුම ප්‍රජාමූල සංවිධාන ගොඩනැංවීමේදී අනුගමනය කළයුතු ක්‍රමෝපායන් හා ඊට අවශ්‍ය ශිල්ප ක්‍රම භාවිතා කිරීම.
- දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම උදෙසා නිලධාරියාගේ කාර්යභාරය පැහැදිළි කිරීම.

මෙවැනි වැඩසටහන් තුළින් නිලධාරීන්ට හා ප්‍රතිලාභීන්ට දිවිනැගුමෙහි කාර්යභාරය පිළිබඳව මූලික අවබෝධයක් ලබාදීමට උත්සහ කරන ලදි. එක් එක් දිස්ත්‍රික්කය සඳහා පැවති වැඩසටහන් වල වියදම් වාර්තා වගුව 08 යටතේ ඉදිරිපත් කරමි.

වගුව - 08 දිස්ත්‍රික් මට්ටමින් නිලධාරින් සහ ප්‍රතිලාභින් දැනුවත් කිරීමේඑක්දිනවැඩමුළුවේප්‍රගතිය - 2014

| අනු අංකය | කලාපය | දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යාව | පැවැත්වූ දිනය | පැවැත්වූ ස්ථානය | සහභාගිවූ සංඛ්‍යාව | වියදම් කරන ලද ප්‍රතිපාදන (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 1 | අංක 1 | කොළඹ | 1 | 2014.06.06 | බිෂොප්විද්‍යාලය | 740 | 458,609.00 |
| 2 | | කළුතර | 1 | 2014.06.27 | මතුගමප්‍රාදේශීය සභාශ්‍රවනාගාරය | 1000 | 355,400.00 |
| 3 | | ගාල්ල | 2 | 2014.06.26 | ගාල්ලහෝල්ඩී.ශාලාව/බද්දේගමවෘ.පු.ම. | 1368 | 520,440.00 |
| 4 | | මාතර | 2 | 2014.06.17 | නගරසභාශ්‍රවනාගාරය/වැලිගමනගරසභාශ්‍රවනාගාරය | 1300 | 540,900.00 |
| 5 | | රත්නපුර | 2 | 2014.06.18 | සබරගමුවපළාත්ශ්‍රවනාගාරය /සමුදිඋත්සවශාලාව | 800 | 384,000.00 |
| 6 | අංක 2 | ගම්පහ | 2 | 2014.06.03/04 | නයිවලසණසශාලාව | 2100 | 716,300.00 |
| 7 | | කුරුණෑගල | 2 | 2014.05.29/ 2014.06.05 | කුරුණෑගලනගරශාලාව | 2600 | 869,800.00 |
| 8 | | පුත්තලම | 1 | 2014.05.30 | සමූපකාරරංගශාලාව - මාදම්පේ | 790 | 336,200.00 |
| 9 | | කෑගල්ල | 1 | 2014.05.27 | ශාන්තජෝශප්බාලිකාවිද්‍යාල | 852 | 284,980.00 |
| 10 | අංක 3 | මහනුවර | 2 | 2014.06.23/24 | මහාමායාබාලිකාවිද්‍යාල | 1800 | 774,780.00 |
| 11 | | නුවරඑළිය | 1 | 2014.06.26 | නුවරඑළියනගරශාලාව | 799 | 291,570.00 |
| 12 | | මාතලේ | 1 | 2014.06.20 | මාතලේනගරශාලාව | 857 | 353,962.00 |
| 13 | | බදුල්ල | 1 | 2014.06.16 | ඌවපළාත්පුස්තකාලයශ්‍රවනාගාරය | 990 | 377,100.00 |
| 14 | අංක 4 | හම්බන්තොට | 1 | 2014.06.28 | ශ්‍රීලංකාසිංගප්පූරුප්‍රජාසත්කාරක මධ්‍යස්ථානය | 1133 | 389,470 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 15 | | මොණරාගල | 1 | 2014.07.11 | වැල්ලවායමහින්දරාජපක්ෂ සම්මන්ත්‍රණශාලාව | 723 | 262,900.00 |
| 16 | | අම්පාර | 2 | 2014.07.17/ 2014.07 | අම්පාරකච්චේරිය - සිංහලසමන්තුරෙයිනගරශාලාව - දෙමල | 300 700 | 391,400.00 |
| 17 | අංක 5 | අනුරාධපුරය | 3 | 2014.06.10/25/27 | උතුරුමැදපළාත්රැස්වීම්ශාලාව | 1283 | 607,275.00 |
| 18 | | පොළොන්නරුව | 1 | 2014.06.23 | පුලතිසිබුද්ධිමණ්ඩපය | 881 | 359,705.00 |
| 19 | | ත්‍රිකුණාමලය | 2 | 2014. ජූලි | | 393 | 188,655.00 |
| 20 | | මඩකලපුව | 2 | 2014.06.27/28 | Derba ශාලාව | 750 | 299,200.00 |
| 21 | අංක 6 | යාපනය | 2 | 2014 ජූලි | වීරසිංහම්ශාලාව | 900 | 747,400.00 |
| 22 | | කිලිනොච්චිය | 1 | 2014 ජූලි | දිස්ත්‍රික් සමූපකාරශාලාව | 500 | 225,700.00 |
| 23 | | මුලතිව් | 1 | 2014 අගෝස්තු | ප්‍රාදේශිය සභාගොඩනැගිල්ල | 500 | 225,700.00 |
| අනු අංකය | කලාපය | දිස්ත්‍රික්කය | දින සංඛ්‍යාව | පැවැත්වූ දිනය | පැවැත්වූ ස්ථානය | සහභාගී සංඛ්‍යාව | [illegible] (රු.) |
| 24 | | වව්නියාවසිංහල/දෙමල | 2 | 2014 ජූලි,අගෝ. | දිස්ත්‍රික් ලේකම්කාර්යාලය | 496 214 | 344,100.00 |
| 25 | | මන්නාරම | 1 | 2014 අගොස්තු | නගරසභාශාලාව | 500 | 225,700.00 |
| | **එකතුව** | | | | | **23559** | **10,531,246.00** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

## 06. ජීවනෝපාය සංවර්ධන අංශයේ කාර්යසාධනය

2014 වර්ෂයේ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවිමෙන් අනතුරුව දිවිනැගුම පනතට අනුකූලව යමින් ආර්ථික හා සමාජීය මට්ටමින් පුද්ගලයා, පවුල, කණ්ඩායම් සවිබල ගැන්විම උදෙසා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වු අතර ඒ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත රු.මි. 3060 ක ප්‍රතිපාදන වෙන් කර දෙන ලදි.

මෙම ප්‍රතිපාදන ප්‍රමාණයන්ට අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මහජන නියෝජිතයින්ගේ ජීවනෝපාය ව්‍යාපාතීන් ක්‍රියාත්මක කිරිම සඳහා තවදුරටත් රු.මි. 86.88 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අනුමත කරන ලද බැවින් අනුමත මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 3146.88 විය.

ඒ අනුව "දොරින් දොරට ගමින් ගමට " යන තේමාව පදනම් කර ගනිමින් පවුල් ඒකකය තුල වියදම් අඩුකර ගැනිමත් අමතර ආදායම් ලබා ගැනිමේ හා ගෘහස්ත මට්ටමින් කෘෂිකාර්මික, කාර්මික හෝ සේවා ක්ෂෙත්‍ර තුලින් රැකියා අවස්ථා ඇති කර ගැනිම හරහා අමතර ආදායම් මාර්ග විවර කර ගැනිමත් ඉලක්ක කර ගනිමින් 2015 දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන ලදි.

ඉහතින් දැක්වු පරිදි දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවිමෙන් පසු සංවර්ධන කටයුතු කඩිනම් හා ඉලක්කගත ප්‍රවේශයකට යොමු කරලීමටත් පරිපාලන පහසුවත් උදෙසා දිස්ත්‍රික්ක 25, දිවිනැගුම කලාප 06 කට ගොනුගත කරන ලදි. වෙන් කරන ලද රු.මි. 3060 ක ප්‍රතිපාදන මැතිවරණ කොට්ඨාශයකට රු.මි. 20 ක් වන පරිදි කොට්ඨාශ 150 ක් වෙත පලමු අදියරේදි වෙන්කරන ලද අතර ව්‍යාපෘති අවශ්‍යතාවය පරිදි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්ට ගලපා ගැනිමේ හැකියාව අදාල නිලධාරින්ට හා සම්බන්ධිකරණ කමිටු වලට පැවරෙන ලදි. මෙහිදි දිවිනැගුම කලාප වෙත අදාල ප්‍රතිපාදන සඳහා මුදල් අග්‍රිම ලබා දිමට කටයුතු කිරිම මෙහිලා විශේෂයෙන් සඳහන් කළයුතු වේ.

ඒ අනුව පහත පරිදි ප්‍රධාන වැඩසටහන් 05 ක් යටතේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කල අතර රු.මි. 1715.82 ක් වැය කරමින් ඵලදායි ව්‍යාපෘති 94,797 ක් නිම කිරිමට ජීවනෝපාය සංවර්ධන අංශයට හැකිවිය.

1. කෘෂි සංවර්ධන වැඩසටහන
2. පශු සම්පත් සංවර්ධන වැඩසටහන
3. ධිවර සංවර්ධන වැඩසටහන
4. කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන
5. අලෙවි සංවර්ධන වැඩසටහන



භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ඉහත වැඩසටහන් වලට අමතරව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවසතුදිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම් හරහා ක්‍රියාත්මක වන***ජීවනෝපාය චක්‍රිය අරමුදල*** මගින් ද වාර්ෂිකව ජීවනෝපායන් වැඩිදියුණු කිරිමට අවශ්‍ය ප්‍රාග්ධන සම්පාදනය කිරිමට හැකිවිම මෙහිදි විශේෂයෙන් පෙන්වා දිය යුතුය

ඒ අනුව කලාප මට්ටමින් වෙන් කරන ලද භාණ්ඩාගාර ප්‍රතිපාදනප්‍රමාණයන් හා නිමකරන ලද ව්‍යාපෘති සමඟින් දරන ලද ආයෝජනයන් පහත පරිදි වේ.


වගුව - 09 **වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් හා නිමකරන ලද ව්‍යාපෘති**

| කලාපය | මැතිවරණ කොට්ඨාශ ගණන | දිස්ත්‍රික් ගණන | වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | යවන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | නිම කරන ලද ව්‍යාපෘති ගණන | දරණ ලද ආයෝජනය (රු.මි.) | ප්‍රතිලාභී පවුල් ගණන |
|---|---|---|---|---|---|---|---|
| අංක 01 | 48 | 05 | 975.00 | 833.00 | 22,973 | 378.09 | 22,973 |
| අංක 02 | 41 | 04 | 835.00 | 714.00 | 19,356 | 408.88 | 19,356 |
| අංක 03 | 31 | 04 | 615.00 | 527.00 | 22,481 | 490.08 | 22,481 |
| අංක 04 | 11 | 03 | 275.00 | 238.00 | 13,200 | 179.58 | 13,200 |
| අංක 05 | 16 | 04 | 421.88 | 355.32 | 15,318 | 234.24 | 15,318 |
| අංක 06 | 13 | 05 | 25.00 | 25.00 | 1,469 | 24.95 | 1,469 |
| **එකතුව** | **160** | **25** | **3146.88** | **2692.32** | **94,797** | **1715.82** | **94,797** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

**ඉහත දිස්ත්‍රික්ක මට්ටමින් වූ ආයෝජනයන් පිළිබඳව සංඛ්‍යාත්මක දත්තයන් ඇමුණුම් අංක 01 මඟින් දක්වා ඇත.*

ප්‍රස්ථාරය - 03 **කලාප මට්ටමින් නිමකරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව හා දරණ ලද ආයෝජනය**




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

**ලබාදුන් භාණ්ඩාගාර ප්‍රතිපාදනයන්ට අදාලව ඉහත ගණනය කිරීම් පෙන්වා දී ඇත.*

ඒ අනුව සෑම ග්‍රාම නිලධාරි වසමක්ම නියෝජනය වන පරිදි ඉහත ව්‍යාපෘති ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ක්‍රියාත්මක කිරිමේදි ආර්ථික හා සමාජීය වශයෙන් අවාසි සහගත තත්වයට පත්ව ඇති පවුල් මෙන්ම වැන්දඹු , අබාධිත, කාන්තා පවුල් කෙරෙහිද වැඩි අවධානය යොමු කරමින් හා අඩු ආදායම්ලාභින් මෙන්ම යම් ආදායම් මට්ටමක සිටින ප්‍රතිලාභින් සඳහාද පහත නිර්ණායකයන්ට අනුකූලව ප්‍රතිපාදන වෙන් කරමින් ජීවනෝපාය මාර්ග විවර කර දීමට ක්‍රියා කරන ලදි.



වගුව - 10 නිම කරන ලද ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය සාරාංශගතව


| ව්‍යාපාති නිර්ණායකයන් | මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | ලබාදුන් මුදල් ප්‍රමාණය (රු.මි.) |
|---|---|---|
| A - 100 % ක ව්‍යාපෘති ප්‍රදානයන් ලබා දීම | 58,158 | 1027,56 |
| B -ව්‍යාපෘති මුදලින් 50 % ක් ලබා දී නැවත වාරික වශයෙන් අයකිරිම | 36,554 | 681.60 |
| C - ලබා දුන් 100 %ව්‍යාපෘති මුදල නැවැත වාරික වශයෙන් අයකිරිම | 85 | 6.60 |
| D - ජීවනෝපාය චක්‍රිය අරමුදලින් ව්‍යාපෘති ගැන්වීම | 837 | 27.59 |
| **එකතුව** | **95,634** | **1743.35** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

- ආර්ථික හා සමාජීය වශයෙන් අවාසි සහගත තත්වයට පත්ව ඇති පවුල් මෙන්ම වැන්දඹු , අබාධිත, කාන්තා පවුල් සඳහා මෙන්ම අඩුආදායම්ලාභින් සඳහා රු. 75,000/- උපරිමයකට යටත්ව ව්‍යාපෘති ප්‍රදානයන්, - A
- යම් ආදායම් මට්ටමක සිටින ප්‍රතිලාභින් සඳහා රු. 75,000/- උපරිමයකට යටත්ව අවශ්‍ය ව්‍යාපෘති මුදලින් 50 % ක් ලබා දී චක්‍රිය අරමුදලට වාරික වශයෙන් නැවත අයකිරිම - B
- ලබා දුන් 100 %ව්‍යාපෘති මුදල නැවත වාරික වශයෙන් අයකිරිම - C

- දැනට පවත්නා ජීවනෝපාය චක්‍රිය අරමුදලින් ව්‍යාපෘති ගැන්වීම. - D

ප්‍රස්ථාරය - 04 නිම කරන ලද ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ප්‍රස්ථාරගතව දැක්වීම




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර


ඉහත නිර්ණායකයන්ට අනුව වැඩසටහන් මට්ටමින් භාණ්ඩාගාර ප්‍රතිපාදන හා ජීවනෝපාය චක්‍රිය අරමුදල් යටතේ මුදල් ලබා දී ක්‍රියාත්මක කර නිම කරන ලද ජීවනෝපාය ව්‍යාපෘතින්හි භෞතික හා මූලය ප්‍රගතිය පහත පරිදි පෙන්වා දිය හැකිය.

වගුව - 11 වැඩසටහන් අනුව මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| වැඩසටහන | නිම කරන ලද සංඛ්‍යාව | වියදම ( රු.මි. ) | ව්‍යාපෘති ගැන්වූ ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|
| කෘෂි සංවර්ධන | 32,524 | 388.72 | 32,524 |
| පශු සම්පත් සංවර්ධන | 19,240 | 363.98 | 19,240 |
| ධීවර සංවර්ධන | 1,786 | 36.61 | 1,786 |
| කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන | 30,571 | 795.05 | 30,571 |
| අලෙවි සංවර්ධන | 10,676 | 131.45 | 10,676 |
| **එකතුව** | **94,797** | **1715.81** | **94,797** |
| **ජීවනෝපාය චක්‍රිය අරමුදල මඟින්** | **837** | **27.59** | **837** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 05   ජීවනෝපාය ක්ෂේත්‍රයන්හි ප්‍රමාණාත්මක හා ප්‍රතිශතාත්මක දායකත්වය




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

## 6.1. කෘෂි සංවර්ධන වැඩසටහන



තම ගෙවත්ත නිසි ලෙස කළමණාකරණය කර ගනිමින් එදිනෙදා පරිභොජනයට අවශ්‍ය එළවළු, පලතුරු මෙන්ම දේශිය ආහාර භෝගයන් වගාකිරිමට අත්වැලක් සපයා දිමත් ගෘහණියන්ගේ අපතේ යන කාලය නිසි ලෙස ප්‍රයෝජනයට ගැනිම හරහා අමතර අදායම් මාර්ග විවර කර ගැනිමත් උදෙසා ක්‍රියාත්මක මෙම වැඩසටහන යටතේ රු.මි.388.73 ක් වැය කරමින් කෘෂි ව්‍යාපෘති 32,524 සඳහා ප්‍රතිලාභින් යොමු කරමින් ඔවුන්ගේ පවුල්වල ජිවන තත්ත්වය නගා සිටුවිමට දිවිනැගුම වැඩසටහන යටතේ හැකියාව ලැබිණි.

විශේෂයෙන් මෙහිදි කෘෂිකර්ම සංවර්ධන ක්ෂේත්‍රය යටතේ ක්‍රියාත්මක කරන ලද පහත සඳහන් ව්‍යාපෘති විශ්ලේෂණය කිරිමෙන් පැහැදිලි වන්නේ අමතර අදායම් මාර්ගයන් උදා කර ගැනිම කෙරෙහි අවධානය වැඩි වශයෙන් යොමුව ඇති බවයි.

මෙහිදී තේ වගා ව්‍යාපෘති වැඩි දියුණු කිරීම කිරීමට අවශ්‍ය අරමුදල් සැපයිමට දිවිනැගුම වැඩසටහනට හැකියාව ලැබී තිබුණි. එමෙන්ම එදිනෙදා කෘෂිකාර්මික කටයුතු කිරීමේදී ප්‍රජාවට අත්‍යාවශ්‍ය උපකරණ එනම් වතුර මෝටර්, ජල ටැංකි, දියර ඉසින යන්ත්‍ර, ජල බට, උදලු, විල් බැරැක්ක, මුල්ලු, වැනි ප්‍රාග්ධන භාණ්ඩයන් ලබා ගැනීමට කටයුතු කර ඇති බව පොදුවේ දැකිය හැකි ලක්ෂණයකි.

එසේම අමතර ආදායම් මර්ග කෙරෙහි යොමුව ඇති බව වඩාත් පැහැදිලි වනුයේ විසිතුරු මල් වගාව, ගම්මිරිස් වගාව, මී මැසි පාලනය, කුරුඳු වගාව, ලොකු ළූණු හා පලතුරු වගාවවන් සඳහා වැඩි ප්‍රතිලාභීන් ප්‍රමාණයක් නැඹුරු වීමෙන් වේ.

වගුව - 12 නිම කරන ලද කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති විශ්ලේෂණය

| ව්‍යාපෘති වර්ගය | සංඛ්‍යාව | පැල/උපකරණ/භාණ්ඩ/ යෙදවුම්/සතුන් ප්‍රමාණය | වියදම (රු.මි.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කෘෂි ළිං | 102 | 102 | 2.35 | 102 |
| කෘෂි උපකරණ කට්ටල | 3,744 | 36,761 | 44.34 | 3,744 |
| ජල ටැංකි | 3,684 | 3,702 | 34.82 | 3,684 |
| ගෙවතු උපකරණ | 4,446 | 16,269 | 28.99 | 4,446 |
| රබර් පැල | 925 | 26,409 | 3.44 | 925 |
| දියර ඉසින යන්ත්‍ර | 2,972 | 3,053 | 37.35 | 2,972 |
| තේ වගාව | 6,834 | 4,204,870 | 80.85 | 6,834 |
| විසිතුරු මල් වගාව | 1,076 | 64,989 | 16.06 | 1,076 |
| තවාන් උපකරණ | 1,041 | 6,123 | 19.11 | 1,041 |
| කිතුල් පැණි නිශ්පාදනය | 57 | 70 | 0.60 | 57 |
| වතුර මෝටර | 3,543 | 3,612 | 69.66 | 3,543 |
| ගම්මිරිස් පැල | 1,141 | 178,497 | 19.42 | 1,141 |
| බිම්මල් වගාව | 465 | 1,175 | 9.65 | 465 |
| මීමැසි පාලනය | 272 | 1,014 | 1.49 | 272 |
| පලතුරු වගාව | 1,167 | 55,240 | 4.98 | 1,167 |
| එළවළු වගාව | 177 | 2,434 | 1.38 | 177 |
| ආරක්ෂිත ගෘහ | 175 | 175 | 5.30 | 175 |
| රටකජු වගාව | 50 | 50 | 0.67 | 50 |
| ඉඟුරු වගාව | 53 | 53 | 1.00 | 53 |
| බඩඉඟුරු වගාව | 62 | 13,755 | 0.43 | 62 |
| කුරුඳු වගාව | 338 | 107,306 | 4.84 | 338 |
| ලොකු ළූණු | 200 | 200 | 2.00 | 200 |
| ***එකතුව*** | **32,524** | **4,725,859** | **388.73** | **32,524** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර



## 6.2. පශු සම්පත් සංවර්ධන වැඩසටහන

පශු සංවර්ධන වැඩසටහන යටතේ රු. මි. 363.98 ක් වැය කරමින් ප්‍රතිලාභීන් 19,240 කට අවශ්‍ය ව්‍යාපෘති 19,240 ක් ක්‍රියාත්මක කර නිම කිරීමට දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ හැකියාව ලැබී තිබුණි.

මෙහිදී කිරිගව පාලනය සඳහා වැඩි මුල්‍ය ආධාර ලබාදී තිබූ අතර ජීවනෝපාය වැඩසටහන්හි ඉලක්කයක් වූ කිරි ගොවීන් නගා සිටුවීම කෙරෙහි සෑම දිස්ත්‍රික්කයක්ම කටයුතු කර තිබිණි.

එමෙන්ම මීට අමතරව දෛනික පරිභෝජනයට අවශ්‍ය කිරි ලබා ගැනීම හා අමතර ආදායම් ලබා ගැනීම කෙරෙහි ද නැඹුරුතාවයක් දක්වා ඇති බවද. කෙසේ වුවද වැඩි ප්‍රතිලාභීන් ප්‍රමාණයක් කුකුළු පාලන ව්‍යාපෘති

කෙරෙහි යොමු ගතවීම මෙහිදී විශේෂ ලක්ෂණයක් වන අතර කුකුළු පැටවුන් 386,446 ක් පමණ ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කර ඇත.

වගුව - 13 **නිම කරන ලද පශු සංවර්ධන ව්‍යාපෘති විශ්ලේෂණය**

| ව්‍යාපෘති වර්ගය | සංඛ්‍යාව | සතුන් /උපකරණ/භාණ්ඩ/ යෙදවුම්ප්‍රමාණය | වියදම (රු.මි.) | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කුකුළු පැටවුන් | 11,846 | 369,771 | 114.10 | 11,846 |
| කිරිගව පාලනය | 3,379 | 3,574 | 152.41 | 3,379 |
| ගවගාල් ඉදිකිරිම | 1,817 | 3,272 | 42.67 | 1,817 |
| ඌරු පැටවුන් | 90 | 323 | 1.76 | 90 |
| එළු පාලනය | 1,503 | 4,912 | 40.76 | 1,503 |
| කුකුල් කොටු | 291 | 1,182 | 4.06 | 291 |
| සත්ත්ව උපකරණ | 274 | 3,362 | 5.08 | 274 |
| එළු මඩු | 4 | 7 | 0.04 | 4 |
| මීගව පාලනය | 36 | 43 | 3.10 | 36 |
| ***එකතුව*** | **19,240** | **386,446** | **363.98** | **19,240** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

## 6.3. ධීවර සංවර්ධන වැඩසටහන

ධිවර සංවර්ධන වැඩසටහන යටතේ රු.මි. 36.61 ක් වැය කරමින් ධිවර ප්‍රතිලාභින් 1,786 ගේ ධිවර කටයුතු වැඩිදියුණු කර ගැනිම උදෙසා මුල්‍ය ආධාර සැපයිමට අප දෙපාර්තමේන්තුවට හැකියාව ලැබිණි. පහත දැක්වෙන ධිවර ව්‍යාපෘති විශ්ලේෂණය තුලින් ධිවර කර්මාන්තයේ යෙදෙන ප්‍රතිලාභින්ට අත්‍යාවශව පවතින ධිවර ආම්පන්න හා උපකරණ මෙන්ම ජීවිත ආරක්ෂාව පිළිබඳවද සහය ලබා දිමට හැකිවිම විශේෂත්වයක් බව පෙන්වා දිය හැකිය.

වගුව - 14 **ධීවර සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය**

| *ව්‍යාපෘති වර්ගය* | *සංඛ්‍යාව* | */යන්ත්‍රෝපකරණ/භාණ්ඩ/ යෙදවුම්/සතුන් පැල/ ප්‍රමාණය* | *වියදම (රු.මි.)* | *ප්‍රතිලාභින් සංඛ්‍යාව* |
|---|---|---|---|---|
| ධීවර ආම්පන්න/උපකරණ | 1,077 | 3,552 | 23.27 | 1,077 |
| විසිතුරු මත්ස්‍ය වගාව | 132 | 6,2149 | 2.28 | 132 |
| මිරිදිය මත්සය පාලනය | 52 | 3,0131 | 2.25 | 52 |
| මිරිදිය ටැංකි | 6 | 9 | 0.86 | 6 |
| ඔරු ලබා දීම | 71 | 83 | 3.71 | 71 |
| ජලජ පැළෑටි | 53 | 303 | 2.54 | 53 |

| | | | | |
|---|---|---|---|---|
| ජීවිතාරක්ෂක කබා | 359 | 359 | 0.99 | 359 |
| ධීවර නිෂ්පාදන | 36 | 36 | 0.71 | 36 |
| ***එකතුව*** | **1,786** | **96,622** | **36.61** | **1,786** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

## 6.4 කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන



2014 දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහනේ වැඩි අවධානය ලබා ගෙන ඇති ව්‍යාපෘතිය ලෙස කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධනය බව පෙන්වා දිය හැක්කේ, දිස්ත්‍රික්ක වෙත වෙන් කරන ලද වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් මේ සඳහා වැය කර ඇති ආකාරය පහත විශ්ලේෂණය තුලින් මනාව ගම්‍ය වන බැවිණි.



මෙහිදි රු. මි. 795.05 ක් වැය කරමින් විවිධ වු කර්මාන්තයන් හි යෙදෙන 30,571 ක් වු ප්‍රතිලාභින් වෙත යන්ත්‍රෝපකරණ හා ප්‍රාග්ධන භාණ්ඩයන් 40,114 ක් ලබා ගැනිමට අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදයන් සැපයීමට හැකිවිණි.

වගුව - 15 ***නිම කරන ලද කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘති විශ්ලේෂණය***

| *ව්‍යාපෘති වර්ගය* | *සංඛ්‍යාව* | *යන්ත්‍රෝපකරණ/ භාණ්ඩ/ යෙදවුම්/සතුන් ප්‍රමාණය* | *වියදම (රු.මි.)* | *ප්‍රතිලාභින් සංඛ්‍යාව* |
|---|---|---|---|---|
| මහන මැෂින් | 11,471 | 12,051 | 330.84 | 11,471 |
| වඩු උපකරණ | 4,727 | 6,869 | 154.27 | 4,727 |
| ඇඹරුම් යන්ත්‍ර | 2,137 | 2,502 | 44.29 | 2,137 |
| වෙල්ඩින් යන්ත්‍ර | 2,247 | 2,531 | 42.21 | 2,247 |
| කම්ප්‍රෙෂර් යන්ත්‍රය | 926 | 942 | 25.18 | 926 |
| රසකැවිලි / බයිට් නිශ්පාදන | 578 | 876 | 10.30 | 578 |
| ස්වර්ණාභරණ නිශ්පාදන | 66 | 90 | 1.12 | 66 |
| විසිතුරු අයිතමයන් | 82 | 82 | 1.11 | 82 |
| අත්කම් නිශ්පාදන | 235 | 695 | 9.88 | 235 |
| පෙදරේරු උපකරණ /යන්ත්‍ර | 2,421 | 6,308 | 46.01 | 2,421 |
| විදුලි උපකරණ | 577 | 825 | 12.05 | 577 |
| ආපනශාලා/ බේකරි උපකරණ | 1,568 | 2,488 | 37.61 | 1,568 |
| ඇඳුම් මැසිම | 1,599 | 1,629 | 41.19 | 1,599 |
| සුළු කර්මාන්තය | 684 | 708 | 16.85 | 684 |
| වේවැල් කර්මාන්තය | 58 | 82 | 0.68 | 58 |

| | | | | |
|---|---|---|---|---|
| වී තම්බන බැරල් /බොයිලේරු | 318 | 318 | 4.78 | 318 |
| ඉටිපන්දම් නිෂ්පාදනය | 95 | 95 | 2.83 | 95 |
| පොල්තෙල් නිෂ්පාදනය | 72 | 72 | 1.58 | 72 |
| රන් කර්මාන්තය | 20 | 20 | 0.18 | 20 |
| වලං කර්මාන්තය | 83 | 321 | 2.38 | 83 |
| රබර් නිෂ්පාදන යන්ත්‍ර | 28 | 28 | 1.12 | 28 |
| කොහු ආශ්‍රිත නිෂ්පාදන | 263 | 266 | 4.40 | 263 |
| තණකොළ කපනමැෂින් | 316 | 316 | 4.19 | 316 |
| ***එකතුව*** | **30,571** | **40,114** | **795.05** | **30,571** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර



## 6.5. අලෙවි සංවර්ධන වැඩසටහන

දැනටමත් විවිධ වූ ජීවනෝපාය වෘත්තීන් හි යෙදෙන ප්‍රතිලාභීන්ගේ පවත්නා ආර්ථික හා සමාජීය මට්ටම වඩාත් වර්ධන කර ගැනිම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක මෙම වැඩසටහන යටතේ රු.මි. 131.45 ක් වැය කරමින් ප්‍රතිලාභි 10,688 කගේ අලෙවි කාර්යයන් උදෙසා අවශ්‍ය 15,936 ක් වූ ප්‍රාග්ධන උපකරණ සැපයිමට හැකියාව ලැබී ඇති බව පහත දැක්වෙන ව්‍යාපෘති විශ්ලේෂණ තුලින් පෙන්වා දිය හැකිය.

වගුව - **16** ***නිම කරන ලද අලෙවි සංවර්ධන ව්‍යාපෘති විශ්ලේෂණය***

| *ව්‍යාපෘති වර්ගය* | *සංඛ්‍යාව* | *උපකරණ/භාණ්ඩ/ යෙදවුම් ප්‍රමාණය* | *වියදම (රු.මි.)* | *ප්‍රතිලාභීන් සංඛ්‍යාව* |
|---|---|---|---|---|
| ජංගමරථ / ජංගම අලෙවිසැල් | 472 | 472 | 8.74 | 472 |
| ගෑස් සිලින්ඩර / ගයින්ඩර | 715 | 786 | 6.46 | 715 |
| විදුලි තරාදි | 730 | 739 | 10.38 | 730 |
| ශිතකරණ | 535 | 535 | 20.28 | 535 |
| විදුරු අල්මාරි | 671 | 685 | 10.28 | 671 |
| රූපලාවන්‍ය උපකරණ | 797 | 929 | 17.59 | 797 |
| ඡායාරූප උපකරණ | 41 | 50 | 2.02 | 41 |
| වාහන / පාපැදි අළුත්වැඩියාව | 199 | 364 | 5.57 | 199 |
| සන්නිවේදන උපකරණ | 44 | 45 | 1.75 | 44 |
| කේටරින් උපකරණ | 625 | 1,208 | 6.13 | 625 |
| විදුලි උපකරණ | 146 | 254 | 1.82 | 146 |
| ගෘහස්ත වෙළඳාම / අලෙවි කුටි | 5,026 | 8,970 | 34.15 | 5,026 |
| රසකැවිලි / බයිට් නිෂ්පාදන | 504 | 534 | 3.19 | 504 |
| කුළුබඩු නිෂ්පාදන අලෙවිය | 45 | 45 | 1.25 | 45 |
| කිරි නිශ්පාදන අලෙවිය | 55 | 55 | 0.65 | 55 |
| උත්සව භාණ්ඩ | 83 | 265 | 1.19 | 83 |
| **එකතුව** | **10,688** | **15,936** | **131.45** | **10,688** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

## 6.6. ජීවනෝපාය චක්‍රිය අරමුදල

2007 වර්ෂයේ ජාතික සවිය ගම්පුබුදු ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ආදායම් උත්පාදන ව්‍යාපාති සඳහා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය දරණ ලද ආයෝජනයෙන් 50% ක් වාරික වශයෙන් නැවත අයකර ජීවනෝපාය චක්‍රිය අරමුදල සමෘද්ධි බැංකු සංගම් මට්ටමින් ආරම්භ කරන ලදි.

එසේ ආරම්භ කරන ලද චක්‍රිය අරමුදල වෙත, වාර්ෂිකව ක්‍රියාත්මක ජීවනෝපාය ව්‍යාපෘති යටතේ වාරික අයකිරීම් එකතුවන අතරම ජීවනෝපාය ණය මුදල් ලබා දීමද සිදුවේ. මෙය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සතු මූල්‍ය වත්කමක් වන අතර ඉතා පහසු ප්‍රාග්ධන සම්පාදන මාර්ගයක් බවටද පත්වී ඇත.

**වගුව - 17 ජීවනෝපාය චක්‍රිය අරමුදලේ 2014 වර්ෂයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාති සංඛ්‍යාව | වැයකල මුදල (රු.මි.) |
|---|---|---|
| **ජීවනෝපාය චක්‍රිය අරමුදල** | **837** | **27.59** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

චක්‍රිය අරමුදලේ ආරම්භයේ සිට 2014.12.31 දින වන විට දිවිනැගුම බැංකු සංගම් 1074 ක් හරහා ජීවනෝපාය ව්‍යාපෘති ණය ලබා දීම් 70,864 ක් සිදුකර ඇති අතර ඒ වෙනුවෙන් රුපියල් මිලියන 1,717.79 ක් වැය කර ඇත.


**වගුව - 18 සමස්ත ආයෝජනය හා විශ්ලේෂණය**

| වැඩසටහන | නිම කරන ලද සංඛ්‍යාව | වියදම ( රු.මි. ) | ව්‍යාපෘති ගැන්වූ ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| කෘෂි සංවර්ධන | 32,524 | 388.72 | 32,524 |
| පශු සම්පත් සංවර්ධන | 19,240 | 363.98 | 19,240 |
| ධීවර සංවර්ධන | 1,786 | 36.61 | 1,786 |
| කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන | 30,571 | 795.05 | 30,571 |
| අලෙවි සංවර්ධන | 10,676 | 131.45 | 10,676 |

| | | | |
|---|---|---|---|
| ජීවනෝපාය චක්‍රිය අරමුදල | 837 | 27.59 | 837 |
| **එකතුව** | **95,634** | **1743.4** | **95,634** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

**ප්‍රස්ථාරය - 06 වැඩසටහන් මට්ටමින් සමස්ත ව්‍යාපෘති සංඛ්‍යාව හා ආයෝජනය සන්සන්දනාත්මකව**




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වගුව - 19දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

## ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2014

### *2014.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය*

| කලාපය | දිස්ත්‍රික්කය | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | යවන ලද ප්‍රතිපාදන (රු.මි.) | නිදහස් කළ මුදල් (රු.මි.) | නිම්වියාපෘති | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | කෘෂිකර්ම | | පශු සම්පත් | | ධීවර | | කර්මාන්ත | | අලෙවි හා සේවා | | සමස්ත | |
| | | | | | ගණන | වියදම (රු.මි.) | ගණන | වියදම (රු.මි.) | ගණන | වියදම (රු.මි.) | ගණන | වියදම (රු.මි.) | ගණන | වියදම (රු.මි.) | ගණන | වියදම (රු.මි.) |
| අංක 01 | කොළඹ | 300.00 | 255.00 | 377.1 | 300 | 5.57 | 278 | 6.22 | 29 | 1.62 | 2061 | 67.58 | 311 | 6.61 | 2979 | 87.60 |
| | කළුතර | 160.00 | 136.00 | | 2753 | 18.15 | 238 | 4.83 | 33 | 1.05 | 2475 | 42.61 | 635 | 10.49 | 6134 | 77.13 |
| | රත්නපුර | 180.00 | 153.00 | | 1281 | 17.61 | 118 | 2.49 | | | 1520 | 42.11 | 553 | 9.32 | 3472 | 71.53 |
| | ගාල්ල | 200.00 | 170.00 | | 3288 | 27.01 | 655 | 5.49 | 54 | 0.78 | 1944 | 35.79 | 1077 | 15.55 | 7018 | 84.62 |
| | මාතර | 140.00 | 119.00 | | 801 | 11.26 | 101 | 1.89 | 501 | 3.01 | 1412 | 32.01 | 555 | 9.04 | 3370 | 57.21 |
| *උප එකතුව* | | ***980.00*** | ***833.00*** | ***377.10*** | ***8423*** | ***79.60*** | ***1390*** | ***20.92*** | ***617*** | ***6.46*** | ***9412*** | ***220.10*** | ***3131*** | ***51.01*** | ***22973*** | ***378.09*** |
| අංක 02 | ගම්පහ | 260.00 | 221.00 | 437.0 | 246 | 4.91 | 418 | 10.38 | 64 | 2.93 | 3171 | 86.06 | 667 | 12.4 | 4566 | 116.68 |
| | කුරුණෑගල | 280.00 | 238.00 | | 1546 | 26.12 | 1453 | 43.12 | 6 | 0.17 | 2028 | 57.72 | 433 | 8.31 | 5466 | 135.44 |
| | පුත්තලම | 120.00 | 102.00 | | 562 | 9.02 | 1424 | 21.38 | 287 | 6.78 | 722 | 18.38 | 232 | 4.61 | 3227 | 60.17 |
| | කෑගල්ල | 180.00 | 153.00 | | 2017 | 27.76 | 1596 | 10.85 | 4 | 0.12 | 2268 | 53.23 | 212 | 4.63 | 6097 | 96.59 |
| *උප එකතුව* | | ***840.00*** | ***714.00*** | ***437.04*** | ***4371*** | ***67.81*** | ***4891*** | ***85.73*** | ***361*** | ***10.00*** | ***8189*** | ***215.39*** | ***1544*** | ***29.95*** | ***19356*** | ***408.88*** |
| අංක 03 | මහනුවර | 260.00 | 221.00 | 496.30 | 2203 | 31.81 | 1922 | 51.31 | 8 | 0.24 | 3372 | 110.42 | 738 | 12.78 | 8243 | 206.56 |
| | මාතලේ | 80.00 | 68.00 | | 1061 | 13.76 | 592 | 17.29 | 2 | 0.04 | 1742 | 47.19 | | | 3397 | 78.28 |
| | නුවරඑළිය | 100.00 | 85.00 | | 662 | 7.55 | 1041 | 28.09 | 8 | 1.66 | 566 | 12.52 | 143 | 2.24 | 2420 | 52.06 |
| | බදුල්ල | 180.00 | 153.00 | | 5136 | 66.70 | 1719 | 41.05 | 51 | 0.40 | 1193 | 41.10 | 322 | 3.93 | 8421 | 153.18 |
| *උප එකතුව* | | ***620.00*** | ***527.00*** | ***496.30*** | ***9062*** | ***119.82*** | ***5274*** | ***137.74*** | ***69*** | ***2.34*** | ***6873*** | ***211.23*** | ***1203*** | ***18.95*** | ***22481*** | ***490.08*** |
| අංක 04 | හම්බන්තොට | 100.00 | 85.00 | 209.00 | 1139 | 18.4 | 43 | 2.03 | 45 | 1.16 | 1477 | 41.09 | 195 | 1.52 | *2899* | *64.20* |
| | මොනරාගල | 80.00 | 68.00 | | 1949 | 13.96 | 226 | 4.29 | 17 | 0.38 | 667 | 16.79 | 2970 | 4.04 | *5829* | *39.46* |
| | අම්පාර | 100.00 | 85.00 | | 1471 | 18.02 | 1474 | 23.55 | 156 | 3.66 | 1171 | 27.74 | 200 | 2.95 | *4472* | *75.92* |
| *උප එකතුව* | | ***280.00*** | ***238.00*** | ***209.00*** | ***4559*** | ***50.38*** | ***1743*** | ***29.87*** | ***218*** | ***5.20*** | ***3315*** | ***85.62*** | ***3365*** | ***8.51*** | ***13200*** | ***179.58*** |
| අංක 05 | අනුරාධපුරය | 140.00 | 119.00 | 275.7 | 2527 | 29.06 | 1557 | 24.80 | 73 | 1.58 | 989 | 16.79 | 223 | 4.27 | 5369 | 76.50 |
| | පොලොන්නරුව | 116.20 | 104.20 | | 2197 | 21.85 | 2604 | 20.21 | 69 | 2.00 | 1053 | 25.50 | 486 | 3.85 | 6409 | 73.41 |
| | ත්‍රිකුණාමලය | 110.68 | 81.12 | | 594 | 7.60 | 18 | 0.36 | 208 | 4.08 | 318 | 10.14 | 466 | 11.14 | 1604 | 33.32 |
| | මඩකලපුව | 60.00 | 51.00 | | 481 | 7.61 | 776 | 30.44 | 90 | 1.61 | 358 | 8.4 | 231 | 2.95 | 1936 | 51.01 |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ***උප එකතුව*** | | ***426.88*** | ***355.32*** | ***275.74*** | ***5799*** | ***66.12*** | ***4955*** | ***75.81*** | ***440*** | ***9.27*** | ***2718*** | ***60.83*** | ***1406*** | ***22.21*** | ***15318*** | ***234.24*** |
| *අංක 06* | *වව්නියාව* | | *5.00* | | 50 | 1.43 | 75 | 2.54 | 1 | 0.01 | 26 | 0.87 | 3 | 0.14 | 155 | 4.99 |
| | *යාපනය* | | *5.00* | | 55 | 1.44 | 88 | 1.46 | 29 | 0.81 | 26 | 0.70 | 21 | 0.58 | 219 | 4.99 |
| | *මන්නාරම* | | *5.00* | *25.00* | 5 | 0.12 | 643 | 4.42 | 1 | 0.02 | 12 | 0.32 | 3 | 0.10 | 664 | 4.98 |
| | *මුලතිව්* | | *5.00* | | 200 | 2.00 | 136 | 2.99 | | | | | | | 336 | 4.99 |
| | *කිලිනොච්චිය* | | *5.00* | | | | 45 | 2.50 | 50 | 2.50 | | | | | 95 | 5.00 |
| ***උප එකතුව*** | | ***0.00*** | ***25.00*** | ***25.00*** | ***310*** | ***4.99*** | ***987*** | ***13.91*** | ***81*** | ***3.34*** | ***64*** | ***1.89*** | ***27*** | ***0.82*** | ***1469*** | ***24.95*** |
| **මුළු එකතුව** | | **3146.88** | **2692.32** | **1820.18** | **32524** | **388.72** | **19240** | **363.98** | **1786** | **36.61** | **30571** | **795.06** | **10676** | **131.45** | **94797** | **1715.8** |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

## 07. තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යසාධනය

| |
|---|
| දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ රාජකාරී වලදී තොරතුරු තාක්ෂණය බහුලව යොදා ගනිමින් , කාර්යක්ෂමතාවය හා සඵලදායීතාව වැඩි කරමින් , ජනතාවට වඩා ත් කඩිනම් හා ගුණාත්මක සේවාවක් ලබා දීමට සහාය වීම. |

7.1. ඉ-දිවිනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

මේ යටතේ මානව සම්පත් කළමණාකරන මොඩියුලය තුලින් සියළු නිලධාරීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 26,000 පමණ තොරතුරු මානව සම්පත් කළමනාකරණ මොඩියුලය තුල කලමනාකරණ කිරීම ( Human Resource Management)

7.2. ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය තුලින් ග්‍රාම නිලධාරී වසම්වල තොරතුරු හා සහනාධාරලාභී තොරතුරු යාවත්කාලීන කිරීම ( Customer Relationship Management)

7.3 2014 තුල සිදුකල ව්‍යාපෘති පරිගණක වැඩසටහන් තුල කළමනාකරණ කිරීම (Project &Programme management)

7.4. දිවිනැගුම ප්‍රජාමූල බැංකු පරිගණකගත කිරීමේ වැඩසටහන යටතේ නියමු ව්‍යාපෘතියට අයත් බැංකු 8 සමඟ මෘදුකාංගය නිපදවා අවසන් කිරීම.

දිවිනැගුම ප්‍රජාමූල බැංකුව පරිගණක මෘදුකාංගයන් මගින් ගණුදෙනු කළහැකි ආකාරයට මෘදුකාංගය නිපදවා අවසන් කිරීම හා එය අනෙකුත් දැනට දෘඩාංග සපයා ඇති බැංකු වලට ව්‍යාප්ත කිරීම.

7.5. 2013 වර්ෂයට අදාල සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි දිණුම් ඇදීමේ දත්ත පද්ධතිය සකස් කර නිවාස 1200 පිරිනැමීමට කටයුතු කිරීම.

7.6. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යෑම. ආයතනය නිකුත් කරන චක්‍රලේඛන වෙබ් අඩවිය තුලින් ප්‍රචාරණය කිරීම.

## 8.මාධ්‍ය අංශයේ කාර්යය සාධනය

| |
|---|
| සමාජ සාධාරණත්වය ඇති කරමින්, ජීවනෝපාය සංවර්ධන කටයුතු ඔස්සේ ජීවන තත්වය ඔප්නංවාලීම මඟින් රටේ දිළිඳුකම අවම කිරීමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති හා සමාජ සුභසාධන, සමාජ ආරක්ෂණ හා සමාජ සංවර්ධන වැඩසටහන් පිළිබඳව රටේ පොදු ජනතාව හා අනෙකුත් වගකිව යුතු අංශ නිරන්තරව දැනුවත් කිරීම මාධ්‍ය අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. |

### 8.1.අරමුණ

දුගීබවඅවමකිරීමේසංවර්ධන කාර්යයන්ට හා අඩු ආදායම්ලාභී ජන කොටස්වල උත්සාහයන්ට උරදෙන සන්නිවේදන රටාවන් ගොඩ නගමින් දිවි නැගුම ව්‍යාපාරය පුළුල් සංවාදයකට භාජනය කරමින් එහි සංවර්ධනය වඩාත් ඵලදායිව හා කාර්යක්ෂමව ජනතාව අතරට ගෙන යාමට අදාල ප්‍රචාරන කටයුතු සිදු කිරීම.

### 8.2. ව්‍යාපෘතිය

රටේ ජාතික ආර්ථිකසංවර්ධනයට උරදෙන දිවි නැගුම සංවර්ධන ව්‍යාපෘතීන් කාර්යක්ෂමව හා ඵලදායි කර ගැනීමට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතයට ගැනීම.

#### 8.2.1. විද්‍යුත් මාධ්‍ය භාවිතය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මුල්කොට නාලිකා 07 ක් ආවරණය කරමින් දිවිනැගුම "දොරින් දොරට ගමින් ගමට " පැය ½ ක ගුවන් විදුලි වැඩසටහන ආරම්භ කිරීම. මෙම වැඩසටහන සෙනසුරාදා - වෙළඳ, ස්වදේශී, රජරට, රුහුණු සේවා මඟින් පෙ.ව 11.00 – 11.30 දක්වා, ඉරිදා - කඳුරට සේවා මඟින් පෙ.ව 11.30 – 12.00 දක්වා හා අඟහරුවාදා - වයඹ සේවා මඟින් පෙ.ව 8.00 – 8.30 දක්වා ප්‍රචාරණය කර ඇත. එම ප්‍රචාරණ වැඩසටහන් මාලාව තුළ මීට අමතරව සේවා දායක ප්‍රතිලාභ වශයෙන් තත්පර 60 පටිගත කරන ලද හඬ කොටස් දිනකට 10 බැගින්, තත්පර 30 පටිගත කරන දැනුවත් කිරීමේ පණිවිඩ දිනකට වාර 3 බැගින්, සතිපතා විනාඩි 30 ක වාර්තා වැඩසටහනට අදාළ පූර්ව නිවේදන + තත්පර 10 සේවා දායක ඉදිරිපත් කිරීම දිනකට 3 වරක් බැගින් සෑම දිනකම ප්‍රචාරණය කර ඇත.

ඒ අනුව දිවි නැගුම සංවර්ධන වැඩසටහන් පිළිබඳව පැය ½ සතිපතා ගුවන් විදුලි වැඩසටහන් 12 ක් හා කෙටි දැන්වීම් හඬ කොටස් හා කෙටි දැන්වීම් වාර 270 ක් ප්‍රචාරය කර ඇත.

### 8.3. මුද්‍රිත මාධ්‍ය කටයුතු

ජාතික පුවත්පත් වල පල කෙරෙන දිවිනැගුම සංවර්ධන ව්‍යාපාරය ආශ්‍රිත දෛනික ප්‍රවෘත්ති වාර්තා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අවධානයට යොමු කර ඒ මඟින් අදාළ අංශ සම්බන්ධීකරණයෙන් අදාළ කටයුතු සඳහා පියවර ගැනීම.

කාලීනව සිදු කෙරෙන උත්සව අවස්ථා සඳහා පුළුල් මාධ්‍යය ප්‍රචාරණ කටයුතු වශයෙන් ජාතික පුවත් පත් වල පුවත් පත් දැන්වීම්, තීරුපටි දැන්වීම් හා ලිපි වාර්තා පල කිරීම.අත්පත්‍රිකා, සඟරා, සමරුකලාප, කුඩා පොත් මුද්‍රණය හා අනෙකුත් කටයුතු සිදු කිරීම.

## 8. ප්‍රජාමූල බැංකු අංශයේ කාර්යසාධනය

**ප්‍රජාමූල බැංකු අංශය.**

1996 වර්ෂයේදී ආරම්භ කරන ලද සමෘද්ධි අධිකාරියේ " ණය අංශය " කාලීන වශයෙන් සිදුවූ ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතු කොටගෙන 1998 වසරේදී "බැංකු මූල්‍ය කටයුතු " අංශය ලෙස නම් කරනු ලැබීය. ඒ අනුව බැංකු මූල්‍ය අංශය ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු මෙන්ම දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් පුරුද්ද වැඩි දියුණු කිරීම සඳහා ද කටයුතු කරනු ලබයි. එහෙත් 2013 අංක 01 දරණ දිවිනැගුම පනත මඟින් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව බවට පත් කරන ලදී. එතෙක් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය යටතේ පැවති බැංකු සංගම් හා මහ සංගම් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ප්‍රජාමූල බැංකු සංගම් හා ප්‍රජාමූල බැංකු සමිති ලෙස නම් කරන ලදී.

### 9.1 දර්ශනය

"දිවිනැගුම ප්‍රතිලාභීන් හා දිවිනැගුම අඩු ආදායම්ලාභීන්ට විශිෂ්ඨ සේවයක් සපයන තිරසාර සඵලදායී හා කාර්යක්ෂම දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති බවට පත් කිරීම. "

### 9.2 මෙහෙවර

"ජාතික ආර්ථිකයක් ගොඩනැගීමේ කාර්යයේ දී මූල්‍ය සාක්ෂරතාවය සහිත දිවිනැගුම ප්‍රතිලාභීන් හා දිවිනැගුම අඩු ආදායම්ලාභීන් ස්වශක්තියෙන් නඟාසිටුවීම සඳහා අවශ්‍ය ක්ෂුද්‍ර මූල්‍යකරණය සමඟ ඉදිරියට යමින් තම දිවිනැගුම ප්‍රතිලාභීන් හා දිවිනැගුම අඩු ආදායම්ලාභීන් වෙත විශිෂ්ඨ සේවයක් සපයන සඵලදායී හා කාර්යක්ෂම දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති ජාලයක් ගොඩනැගීම."

### 9.3 හැඳින්වීම

1996 වර්ෂයේදී ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ආරම්භවීමත් සමග එහි තවත් අංශයක් ලෙස "ණය අංශය" ආරම්භ කෙරිණි.

කාලීන වශයෙන් සිදු වූ වෙනස්කම් හේතුකොට ගෙන මෙම අංශය 1998 වසරේදී "බැංකු මූල්‍ය කටයුතු" අංශය ලෙස නම් කරනු ලැබීය.

1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පනත අනුව සමෘද්ධි ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි බැංකු සංගම් 1996 දී ආරම්භ කළ අතර, අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර, ඒ තුලින් ආයෝජන ශක්තිය වැඩි කිරීමටත් නිෂ්පාදන සහ සේවා වර්ධනයට අවශ්‍යප්‍රාග්ධනය (ණය පහසුකම්) සැපයීමටත්, අවිධිමත් ණය ගණුදෙනු අඩු කිරීමටත්, එමගින් ඔවුන් ණය බරින් මුදවමින් ලාභදායී ආයතනික රටාවක් ඇති කිරීමටත් බලාපොරොත්තු විය.

## 9.4 අරමුණු

01. දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීම
02. ආයෝජන හැකියාව වැඩි දියුණු කිරීම
03. නිෂ්පාදන හැකියාව වැඩි දියුණු කිරීම මගින් ආදායම වර්ධනය කිරීම දිවිනැගුම ප්‍රතිලාභීන්ට ණය පහසුකම් සැපයීම.

ඒ අනුව පිහිටුවන ලද දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම් හා ප්‍රජාමූල බැංකු සමිතිවල ප්‍රධාන මෙහෙයුම් කාර්යාලය බවට බැංකු මූල්‍ය කටයුතු අංශය පත්වූ අතර, ඉහත සඳහන් අරමුණු කරා එම ආයතන මෙහෙයවීම බැංකු මූල්‍ය කටයුතු අංශයේ වගකීම සහ කාර්ය භාරය බවට පත්විය.

1. ප්‍රජාමූල බැංකු සංගම්, ප්‍රජාමූල බැංකු සමිතිවල ණය, තැන්පතු , සංරක්ෂණ ඇතුළු සියළු මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් මෙහෙයුම් උපදෙස්, චක්‍රලේඛ මගින් උපදෙස් ලබාදීම හා යාවත්කාලීන කිරීම.
2. ප්‍රජාමූල බැංකු සංගම්හි ගණුදෙනු ක්‍රියාකාරිත්වය ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍යණය (ප්‍රතිමූල්‍ය) පහසුකම් ලබාදීම.
3. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා සේවක ණය ලබාදීම.
4. ප්‍රජාමූල බැංකු සංගම්, ප්‍රජාමූල බැංකු සමිතිවල අරමුදල් ඵලදායීව ආයෝජනය කිරීම.
5. ප්‍රජාමූල බැංකු සංගම්, ප්‍රජාමූල බැංකු සමිතිවලට නව තාක්ෂණය හඳුන්වාදීම සහ පරිගණකගත කිරීම.
6. බැංකු සංගම්වල ගැටළු දුර්වලතා හා ප්‍රවනතා පිළිබඳව ප්‍රගති සමාලෝචන පැවත්වීම.
7. කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
8. බැංකු සංගම්වල අභ්‍යන්තර කළමනාකාරිත්වය පරීක්ෂා කිරීම සඳහා අහඹු විසිත්තයන් කිරීම.
9. ප්‍රජාමූප බැංකු පද්ධතිය නිසි ලෙස මෙහෙයවීමට අවශ්‍ය වන සංරක්ෂණ (රක්ෂණ) ක්‍රම පවත්වාගෙන යාම.
10. ප්‍රජාමූල බැංකු සංගම්වල ක්‍රියාකාරිත්වයට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ (Policy mattars) අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීම, තීරණ ක්‍රියාත්මක කිරීම.
11. ප්‍රජාමූල බැංකුසංගම් සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු දත්ත අවශ්‍ය ආයතන වලට යොමු කිරීම හා එහි ප්‍රගතිය විමසා බැලීම.

මේ අනුව බැංකුමූල්‍ය කටයුතු අංශයේ ක්‍රියාකාරිත්වය දෙයාකාරවේ.

1. ප්‍රජාමූල බැංකු සංගම්වල වැඩසටහන.
2. ප්‍රජාමූල බැංකු අංශය තුළ ක්‍රියාකාරීත්වය.

### 9.4.1 ප්‍රජාමූල බැංකු සංගම් වැඩසටහන.

බැංකු සංගම්හී ආරම්භය අදියර 07 කින් ක්‍රියාත්මක වූ අතර 2014.12.31 දින වන විට උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක ඇතුලළුව දිවයින පුරා බැංකු සංගම් 1,073 ක් ක්‍රියාත්මකවේ.

මේ අනුව බලන විට ප්‍රජාමූල බැංකු සංගම් ලෙස ආරම්භ වූ ශාඛා ජාලය මෙරට ක්ෂුද්‍ර මූල්‍ය කේෂත්‍රයේදීප ව්‍යාප්තව විහිදී ඇති විශාලතම කුඩා මූල්‍ය බැංකු ආයතනික ව්‍යුහය බවට කෙටි කාලයක් තුළදී පත්වී ඇති අතර ප්‍රජාමූල බැංකු සංගම් පද්ධතිය ජාත්‍යන්තර මට්ටමින් ක්ෂුද්‍ර මූල්‍යක්ෂෙත්‍රය තුල කැපී පෙනෙන

ස්ථානයක් හිමි කරගෙන ඇත. සුළු මූල්‍යකරණයේ දැවැත්තයින් අතර, කැපී පෙනෙන ස්ථානයක් හිමි කරගෙන සිටින ප්‍රජාමූල බැංකු සංගම් පද්ධතිය, දිළිඳුකම පිටු දැකීමෙ අරමුණුවලට අනුගත වෙමින් තැන්පතු ඒකරාශිකරණය අතින් විශේෂත්වයක් හිමි කරගෙන සිටින අතර, නව බැංකු තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් බැංකු සංගම් පරිගණක ගත කිරීමේ කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී.

2013 වසර අවසානය වනවිට, බැංකු සංගම් 822 ක් මූල්‍ය ස්වයංපෝෂිත තත්ත්වයට පත්ව තිබූ අතර, 2014 අවසානය වනවිට විවිධ මූල්‍ය අර්බුද හමුවේ එම බැංකු සංගම් ප්‍රමාණය 752 ක් විය.

**බැංකු සංගම්හී සාමාජිකත්වය හා කොටස් ප්‍රාග්ධනය ප්‍රගතිය - 2014.12.31 දිනට**

දිවිනැගුම ප්‍රතිලාභින් රු. 500/- ක කොටසක් මිලදී ගැනීමෙන්, ඔවුනට ප්‍රජාමූල බැංකු සංගමයේ සාමාජිකත්වය හිමිවෙන අතර, ඔවුන් බැංකුවේ කොටස්කරුවන් බවට පත්වේ.

**වගුව - 20 බැංකු සංගම්හී සාමාජිකත්වය ප්‍රගතිය - 2000-2014.12.31**

| වර්ෂය | ගැහැණු[[ | පිරිමි | එකතුව | පසුගිය වසර සාපේක්ෂ වර්ධනය | වර්ධනය අනුපාතය % |
|---|---|---|---|---|---|
| 2000 | 943,142 | 628,094 | 1,571,236 | 326,300 | 26 |
| 2001 | 1,042,158 | 663,905 | 1,706,063 | 134,827 | 9 |
| 2002 | 1,149,226 | 716,833 | 1,866,059 | 159,996 | 9 |
| 2003 | 1,275,273 | 777,222 | 2,052,495 | 186,436 | 10 |
| 2004 | 1,351,769 | 806,470 | 2,158,239 | 105,744 | 5 |
| 2005 | 1,428,848 | 824,846 | 2,253,694 | 95,455 | 4 |
| 2006 | 1,516,985 | 853,604 | 2,370,589 | 116,895 | 5 |
| 2007 | 1,575,509 | 872,490 | 2,447,999 | 77,410 | 3 |
| 2008 | 1,641,872 | 859,900 | 2,501,772 | 53,773 | 2 |
| 2009 | 1,691,112 | 896,947 | 2,588,059 | 86,287 | 3 |
| 2010 | 1,830,840 | 970,693 | 2,801,533 | 213,475 | 8 |
| 2011 | 1,881,808 | 987,740 | 2,869,548 | 68,015 | 2 |
| 2012 | 2,079,173 | 1,078,546 | 3,157,719 | 288,171 | 9 |
| 2013 | 2,199,135 | 1,121,833 | 3,320,968 | 163,249 | 5 |
| 2014 | 2,389,133 | 1,214,461 | 3,603,594 | 282,626 | 7.8 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වසර 14 ක් තුල සාමාජිකත්වයේ ව්‍යාප්තිය 1 සංඛ්‍යා සටහන මඟින් දැක්වේ.2013 වසර හා සසදන විට 2014 වසර තුල ද බැංකු සංගම් සාමාජිකත්වය පසුගිය වසරට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කරන අතර, එම වර්ධන අනුපාතය 7.8% කි. විවිධ ආර්ථික හා සාමාජික ප්‍රශ්න හමුවේ මූල්‍ය ආයතන මුහුණ පෑ අර්බුදකාරි ආර්ථික තත්ත්වයන් තුල ද අපගේ ප්‍රජාමූල බැංකු සංගම් කෙරෙහි ගණුදෙනුකරුවන් තබනු ලබන විශ්වාසය මේ තුල ගම්‍යමාන වේ.


විශේෂයෙන් 2014 වසර ප්‍රජාමූල බැංකු හරහා හඳුන්වාදෙන ලද විදුලි අත්වැල, දිවි නැගුම ඉසුර ණය, රට විරුවෝ නිවාස ණය වැනි විශේෂ ණය යෝජනා ක්‍රමයක් ද මීට බලපා ඇත.

**වගුව - 21** **සාමාජිකයින් ගෙවූ කොටස් මුදල 2014.12.31 දිනට**

| වර්ෂය | මුදල රු ලක්ෂ .ද . | වර්ධනය රුලක්ෂ .ද . | වර්ධන අනුපාතය |
|---|---|---|---|
| 2000 | 985.16 | 397.98 | 67.80 |
| 2001 | 1,383.15 | 397.99 | 40.40 |
| 2002 | 1,679.79 | 296.64 | 21.40 |
| 2003 | 1,930.37 | 250.57 | 14.90 |
| 2004 | 2,206.62 | 276.25 | 14.30 |
| 2005 | 2,601.01 | 394.40 | 17.90 |
| 2006 | 3,096.44 | 495.42 | 19.00 |
| 2007 | 3,639.53 | 543.10 | 17.50 |
| 2008 | 3,989.90 | 350.37 | 9.63 |
| 2009 | 4,212.42 | 222.52 | 5.58 |
| 2010 | 4,790.47 | 578.05 | 13.72 |
| 2011 | 5,370.53 | 580.06 | 12.11 |
| 2012 | 6,380.00 | 1,009.69 | 15.83 |
| 2013 | 7,101.00 | 721.00 | 10.15 |
| 2014 | 8,499.50 | 1,398.50 | 16.45 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 07 **2000 – 2014 කොටස් ප්‍රාග්ධන වර්ධනය (1%)**




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වසර 14 ක් තුල කොටස් ප්‍රාග්ධනයේ ව්‍යාප්තිය 2 හර සංඛ්‍යා සටහන මගින් පෙන්නුම් කෙරේ. ආරම්භක අවධියේ කොටස් ප්‍රාග්ධනයේ වර්ධන අනුපාතය 68% ක් වැනි ඉහල අගයක් පෙන්නම් කළ ද, පසුගිය වර්ෂ වලදී වර්ධන අනුපාතය සීඝ්‍ර ලෙස පහල ගොස් ඇත. ප්‍රවර්ථන වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව කොටස් ප්‍රාග්ධනයේ වර්ධනයක් පෙන්නුම් කලද වර්ධන අනුපාතිය මුල් කාලීන වර්ධනයට සාපේක්ෂව අඩු වී ඇත.කෙසේ වුවත් ප්‍රවර්ථන වර්ෂයේ කොටස් ප්‍රාග්ධනයේ වර්ධනය සලකා බලන කල කොටස් ප්‍රාග්ධන අනුපාතයන් පහළ යාමත් පෙන්නුම් කෙරේ. මෙම තත්වය තවදුරටත් විශ්ලේෂණය කරමින් බැංකු සංගම්හී චිර පැවත්මට දායක වන පරිදි බැංකු මූල්‍ය අංශයේ ඉදිරි සැළසුම් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. 3

2013 වර්ෂයේ රු. මිලියන 7,101 ක් වූ කොටස් ප්‍රාග්ධනය 2014 වර්ෂයේදීරු. මිලියන 8,499.5 දක්වා වර්ධනයක් පෙන්නුම් කෙරේ.


වගුව - 22 බැංකු සංගම් තැන්පතු වැඩසටහන.

**තැන්පතු (සාමාජික, සමාජික නොවන, සමූහ, ළමා සහ දිරිය මාතා)**

| වර්ෂය | සංඛ්‍යාව | වර්ධනය | මුදල රු.ද.ල | වර්ධනයරු.ද.ල |
|---|---|---|---|---|
| 2000 | 2,645,574 | 1,220,922 | 2,033.45 | 1,264.50 |
| 2001 | 3,035,233 | 389,659 | 3,111.16 | 1,077.71 |
| 2002 | 3,296,569 | 261,336 | 3,857.10 | 745.94 |
| 2003 | 3,680,786 | 384,217 | 4,710.80 | 853.70 |
| 2004 | 3,989,539 | 308,753 | 5,751.81 | 1,041.01 |
| 2005 | 4,229,575 | 240,036 | 6,824.88 | 1,073.07 |
| 2006 | 4,394,498 | 164,923 | 8,131.66 | 1,306.78 |
| 2007 | 4,613,504 | 219,006 | 9,875.63 | 1,743.97 |
| 2008 | 5,081,229 | 467,725 | 11,356.79 | 1,481.16 |
| 2009 | 5,167,854 | 86,625 | 13,536.65 | 2,179.86 |
| 2010 | 5,505,853 | 337,999 | 15,906.77 | 2,370.12 |
| 2011 | 5,524,025 | 18,172 | 18,907.33 | 3,000.56 |
| 2012 | 6,206,484 | 682,459 | 20799.06 | 1,891.73 |
| 2013 | 6,383,307 | 176,823 | 23,916.57 | 3,117.52 |
| 2014 | 6,822,409 | 439,102 | 29,436.10 | 5,519.53 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 08 **තැන්පතු මුදල් වර්ධනය (1%)**




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

2014 වසර තුල මිලියන 5,519.5 මුදල් තැන්පත් කරමින් බැංකු සංගම් වැඩසටහන කෙරෙහි තවදුරටත් විශ්වාසය තබා කටයුතු කර ඇති අතර, විශේෂයෙන් බැංකු සංගම් ඉලක්ක කර ක්‍රියාත්මක කරන ලද විශේෂ තැන්පතු වර්ධන වැඩසටහන් මෙම තැන්පතු ප්‍රසාරණය කෙරේ බලපෑම් කර ඇත. අනෙකුත් තරඟකාරී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සමඟ සසඳන විට මෙවන් වර්ධනයක් අත්පත් කර ගැනීම අගය කළ යුතුය.

**9.4.2 ප්‍රජාමූල බැංකු සංගම් ණය වැඩසටහන.**

- දිවිනැගුම සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් හඳුනාගෙන, ස්වශක්තිය මගින් දුගී බවින් මිදීමට අවශ්‍ය පරිසරය ගොඩ නැංවීමට අවශ්‍ය සුළු මූල්‍යකරණ පහසුකම ප්‍රජාමූල බැංකු සංගම් ණය ක්‍රමය යටතේ සිදුවේ.

- සමාජිකයින්ගේ ප්‍රාග්ධන අරමුදල් හා හදිසි මුදල් අවශ්‍යතා පිරිමැසීම සඳහා වූ විශේෂ ණය වැඩසටහන් කිහිපයක් හඳුන්වා දී දියත් කර ඇත.

- ස්වයං රැකියා, මිහිජය ණය, කිරුළ සංවර්ධන යොවුන් දිරිය.ජීවනොපාය ණය වැඩසටහන් තුලින් ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා රු.100,000 සිට රු. 250,000/- දක්වා ණය නිදහස් කෙරේ. වගා කටයුතු සඳහා වූ අරමුදල් සඳහා රු. 75,000 දක්වා ණය මුදල් ලබාගැනීමට පහසුකම් ඇත. 2010 වසර අග භාගයේදී ක්‍රියාත්මක කරන ලද කිරුළ සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ එතෙක් ක්‍රියාත්මක කරන ලද ස්වයංරැකියා රු.100,000 යේ ණය සීමාව රු.250,000/- දක්වා වැඩි කරන ලදී.

- නිවසක් ඉදිකිරීම, අඩක් නිමවූ නිවාසයක වැඩ අවසන් කිරීම. නිවස අළුත්වැඩියාව වැනි අවශ්‍යතා වෙනුවෙන් රු.50,000/- දක්වා ණය පහසුකම් ලබාගෙන, නිවසේ අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට සාමාජිකයින්හට අත්වැලක් සැපයීමට බැංකු සංගමය සූදානම්ය.

- හදිසි මුදල් අවශ්‍යතාවලදී ගිනි පොලීකරුවන්ගේ ග්‍රහනයෙන් මිදී ඉතා පහසුවෙන් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට පාරිභෝගික, ආපදා, ස්වශක්ති ණය යෝජනා ක්‍රම තුලින් සමාජිකයින් හට සහනයක් දී ඇත. 2010 වසර අවසානයේ ආරම්භ කරන ලද විදුලි අත්වැල ණය යෝජනා ක්‍රමය යටතේ සමෘද්ධි ප්‍රතිලාභී හා අඩු අදායම්ලාභී බැංකු සංගම් සාමාජිකයන්ට පදිංචි නිවසට විදුලිය ලබාගැනීම සඳහා රු30,000/- ක උපරිමයකට යටත්ව ණය ලබාදීම සිදු වේ.

- වර්තමානයේදී, ආදායම් උත්පාදන ණය ව්‍යාපෘති සඳහා ලබාදෙන ණය සඳහා සමෘද්ධිලාභී සාමාජිකයින්ට, 8% ක්ද, අඩු ආදායම්ලාභින්ට 10% ක වාර්ෂික අනුපාතයට ලබාදෙන අතර, අනිකුත් ණය සඳහා 12% ක් වේ. (ස්වශක්ති හා විදුලි අත්වැල ණය හැර)

- 2014 වසර තුල සාමාජිකයින්274840 රු.මිලියන 11010 ක මුදලක් ණය ලෙස ලබා දී ඇත.

- 2014 ණය අයවීමේ ප්‍රතිශතය **98.2** (ඉදිරි වාරික අයවීම් ද ඇතුලත්ය). බොල් ණය අනුපාත 4 % ක් වේ.

වගුව - 23 **2014.12.31 දිනට ණය නිකුත් කිරීම**

| වර්ෂය | සංඛ්‍යාව (සමුච්ත) | මුදල රු.ද.ලක්ෂ | වසර තුල ණය නිකුත් කිරීම රු.ද.ලක්ෂ |
|---|---|---|---|
| 1999 | 209,818 | 966.31 | 966.31 |
| 2000 | 481,475 | 2,788.50 | 1,822.19 |
| 2001 | 813,334 | 5,552.75 | 2,764.24 |
| 2002 | 1,016,392 | 7,448.08 | 1,895.33 |
| 2003 | 1,340,126 | 10,503.30 | 3,055.22 |
| 2004 | 1,697,866 | 13,977.81 | 3,474.51 |
| 2005 | 2,149,135 | 20,725.03 | 6,747.22 |
| 2006 | 2,527,841 | 26,035.09 | 5,310.06 |
| 2007 | 2,952,840 | 32,843.04 | 6,807.93 |
| 2008 | 3,450,469 | 42,757.37 | 9,914.36 |
| 2009 | 3,721,662 | 48,352.73 | 5,595.36 |
| 2010 | 4,160,596 | 58,531.61 | 10,178.88 |
| 2011 | 4,682,822 | 71,721.04 | 13,189.43 |
| 2012 | 5,085,275 | 87,046.00 | 15,324.96 |
| 2013 | 5,360,115 | 98,056.00 | 11,010.00 |
| 2014 | 6,388,489 | 127,805.40 | 29,749.40 |


මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වගුව - 24 ණය වර්ගීකරණය 2014.12.31 දිනට සමුච්චිත

| ණය වර්ගය | රු.මි. | දායකත්වය |
|---|---|---|
| ස්වයංරැකියා | 72,680 | 56.87 |
| වගා | 10,350 | 8.09 |
| වෙනත් (මිහිජය, ධීවර, ස්වශක්ති, ආපදා, කිරුල ණය, යොවුන් දිරිය) | 14,501 | 11.34 |
| පාරිභෝගික | 5,035 | 3.93 |
| ජනපුබුදු | 11,100 | 8.68 |
| නිවාස | 14,131 | 11.09 |
| එකතුව | 127,797 | 100.00 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 09 ණය වර්ගීකරණය




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

### 9.4.3 බැංකු සංගම්හී අතිරික්ත අරමුදල් ආයෝජනය (ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වල)


බැංකු සංගම්හි වත්කම්වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් ණය ඉල්ලුම්කරුවන්ට ණය මුදා හැරීමෙන් අනතුරුව අතිරික්ත අරමුදල් මහ සංගම් හරහා භාණ්ඩාගාර චක්‍රලේඛන ප්‍රකාරව රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජන කිරීමට අවසර ලබාදී ඇත. මේ මගින් මහ සංගම් මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමද අරමුණ වේ.

වගුව - 25 ප්‍රජාමූල බැංකු සංගම්හී අතිරික්ත මුදල් ආයෝජනය කිරීම.

| වර්ෂය | මුදල | වර්ධනය | වර්ධනය % |
|---|---|---|---|
| | රු.ලක්ෂ | රු.ලක්ෂ | |
| 2000 | 1,620 | 1,038 | 178.00 |
| 2001 | 3,175 | 1,555 | 95.99 |
| 2002 | 5,097 | 1,922 | 60.54 |
| 2003 | 5,914 | 817 | 16.03 |
| 2004 | 7,828 | 1,914 | 32.36 |
| 2005 | 7,417 | -411 | (5.25) |
| 2006 | 9,936 | 2,519 | 33.96 |
| 2007 | 13,791 | 3,855 | 38.80 |
| 2008 | 18,833 | 5,042 | 36.56 |
| 2009 | 24,039 | 5,206 | 27.64 |
| 2010 | 27,248 | 3,209 | 13.35 |
| 2011 | 39,048 | 11,800 | 43.31 |
| 2012 | 42,098 | 3,050 | 7.81 |
| 2013 | 55,690 | 13,592 | 3.229 |
| 2014 | 48,309 | (7,381) | (15.27) |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 10 මුදල් අනුපාත වර්ධනය




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රජාමූල බැංකු සංගම්හී අතිරික්ත මුදල් ආයෝජනය 6 සංඛ්‍යා සටහන මගින් පෙන්නුම් කරන අතර, බැංකු සංගම් ආරම්භක අවධියේආයෝජන වර්ධනය ඉහළ අගයක් පෙන්නුම් කළද පසුකාලීනව එය පහල ගොස් ඇත. ණය වැඩසටහනේ ප්‍රසාරණය හේතුවෙන් ආයෝජනය කළහැකි අරමුදල් ප්‍රමාණය ක්‍රමිකව සීමා වී ඇත. එය සාධනීය ලක්ෂණයකි.

### 9.4.4 බැංකු මුල්‍යකටයුතු අංශය තුල ක්‍රියාකාරකම්

බැංකු මූල්‍ය කටයුතුලංකාව පුරා ස්ථාපිත ප්‍රජාමූල බැංකු සංගම් හා ප්‍රජාමූල බැංකු සමිති මුල්‍යමෙහෙයුම් ඒකකකය ලෙස කටයුතු කරගෙන යාමේදී ඊට අනුගාමී ලෙස අංශය තුළ විශාල කාර්ය භාරයක් සිදු කෙරේ.


ඒ අනුව බැංකු මූල්‍ය කටයුතු අංශයේ සියළුම වියදම් එම අංශය විසින් දරා ගනු ලබන අතර මීට අමතරව විගණන නිලධාරීන් සම්බන්ධ ගමන් වියදම්, විමර්ශන නිලධාරීන් සඳහා ගමන් වියදම්, බැංකු සංගම් වාර්ෂික වාර්තා සැකසීම සඳහා වැයකරන වියදම් සහ පුහුණු වියදම් මේ යටතට ඇතුලත්වේ.එසේම ප්‍රතිමූල්‍ය ණය බැංකු සංගම්වලට ලබාදීම, මිහිජය පොලී ප්‍රතිපූර්ණය කිරීම, කාර්ය මණ්ඩල ණය පහසුකම් සඳහා අරමුදල් සපයන්නේද බැංකු මූල්‍ය අංශයේ ආදායමෙනි. බැංකු සංගම් හා අදාල ප්‍රවර්ධන හා ප්‍රචාරන කාර්යයන් සඳහා ද මෙම අංශයෙන් මුදල් වැය කෙරේ.


**වගුව - 26බැංකු මූල්‍ය කටයුතු අංශයේ සමස්ත ආදායම හා වියදම පහත දැක්වෙන පරිදිවේ.**

| ආදායම | රුලක්ෂ.ද. | | වියදම | රු .දලක්ෂ . |
|---|---|---|---|---|
| ආයෝජනයෙන් | 1,416 | | අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා ගෙවු පොලිය | 764.8 |
| ණයදීමෙන් | 144 | | අංශයේ පරිපාලන වියදම් | 205.1 |
| බොල්ණය ආපසු අයවීම් | 0 | | වියදම ඉක්මවූ ආදායම | 590.7 |
| අමතරආදායම් | 0.6 | | | |
| | 1,560.6 | | | 1,560.6 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 11 ආදායම ප්‍රස්ථාරය - 12 වියදම




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

බැංකු මූලා කටයුතු අංශය කළමනාකරණ කටයුතු සඳහා පහත සඳහන් නිලධාරී මණ්ඩලයක් සේවා නියුක්ත කර බැංකු සංගම් කටයුතු මෙහෙයවීම, කාර්ය මණ්ඩල ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම., ප්‍රගති කටයුතු හා අනෙකුත් මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි

වගුව - 27 බැංකු මූලා කටයුතු අංශයේ කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ | 01 | |
| 2 | නි.අධ්‍යක්ෂ | 02 | 1 |
| 3 | ස.අධ්‍යක්ෂ | 04 | 2 |
| 4 | සමෘද්ධි කළමනාකරු | 40 | 38 |
| 5 | සමෘද්ධි සංවර්ධන නිලධාරී | 20 | 17 |
| 6 | ලිපිකරුවන් | 03 | 2 |
| 7 | පරිගණක දත්ත සටහන්කරුවන් | 03 | 0 |
| 8 | යතුරු ලේඛිකා | 01 | 1 |
| 9 | කාර්යාල කාර්ය සහායක | 03 | 2 |
| 10 | රියදුරු | 03 | 1 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ඉහත සඳහන් කළ පරිදි බැංකු මූලා අංශය තුළ ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි විග්‍රහ කළ හැකිය.

**9.4.5 ප්‍රජාමූල බැංකු සංගම්හී අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් ක්‍රියාවලිය.**

**හැදින්වීම.**

අඩු ආදායම්ලාභී ජනතාව වැඩි වැඩියෙන් ඉතිරි කිරීමට හුරු කිරීමක් වශයෙන් හා ඔවුන්ගේ අනාගත අභිවෘද්ධියවෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීම් වැඩසටහන ආරම්භ වුනි. මෙහිදී රජය මගින් දෙනු ලබන සහනාධාර මුදලින් යම්කිසි කොටසක් මාසිකව ඉතිරි කිරීම් අනිවාර්ය ඉතිරි කිරීම් ලෙස හදුන්වයි.

මේ වන විට සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන සහනාධාර මුද්දර අතරින්රු.1500, රු.1015, රු.900, රු.615 මුද්දර වලින් පිලිවෙලින් රු.300, රු.200, රු.150 ක් හා රු.100 ක මුදලක් අනිවාර්ය ඉතිරි කිරීම් වශයෙන් මාසිකව ඉතිරි කරනු ලබයි. මෙම මුදල් බැංකු මූල්‍ය අංශය වෙතගෙන්වා ඉහළ පොලි අනුපාතිකයක් යටතේ රාජ්‍ය බැංකුවල ආයෝජනය කර ප්‍රතිලාභීන්ට සැහීමකට පත්විය හැකි ප්‍රශංසනීය ප්‍රතිලාභයක් ලබාදීම මේ වැඩසටහනේ මූලික අරමුණ වේ. මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් අදියර දෙකකින් ක්‍රියාත්මකවේ.

01 1999 නොවැම්බර් මස සිට මේ දක්වා එවන ලද අනිවාර්ය ඉතිරි කිරීම් අර මුදල -මෙහිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඒ ඒ ප්‍රතිලාභීන් අයත් වන බැංකු සංගම් නමින් අදාල සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල් මාසිකව ආයෝජනය පිණිස බැංකු මූල්‍ය අංශය වෙත එවනු ලැබේ.

02 1995 සිට 1999 ඔක්තෝබර් දක්වා මහජන බැංකුවේ, ලංකා බැංකුවේ ආයෝජිත අරමුදල් වලින් ප්‍රජාමූල බැංකුව සමගහොදින්ගණුදෙනු කරනු ලබන ප්‍රතිලාභීන්ගේ 25% ක් සතු අරමුදල් බැංකු මූල්‍ය අංශය වෙත ගෙන්වා ගෙන ආයෝජනය කිරීම සිදු කරන ලදී. 2012 මාර්තු මාසයේ සිට බැංකු සංගම් විසින්ම අදාල ආයෝජනය කරනු ලබන බැවින් ප්‍රධාන කාර්යාලය විසින් අනිවාර්ය ඉතිරිකිරීම් සම්බන්ධව ආයෝජනයත් සිදු නොවේ.

බැංකු මූල්‍ය අංශයේ ආයෝජන කරන ලද අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල් පහත පරිදි වේ.


වගුව - **28** **2014.12.31 දිනට ආයෝජනය සදහා ලද අනිවාර්ය ඉතිරි කිරීම්**

| වර්ෂය | අරමුදල් (රු(ලක්ෂ.ද. | වර්ධනය | වර්ධනය % |
|---|---|---|---|
| 2000 | 1,045 | | - |
| 2001 | 2,424 | 1,379 | 131.96 |
| 2002 | 3,852 | 1,428 | 58.91 |
| 2003 | 5,510 | 1,658 | 43.04 |
| 2004 | 6,652 | 1,142 | 20.73 |
| 2005 | 7,349 | 697 | 10.48 |
| 2006 | 8,282 | 933 | 12.70 |
| 2007 | 9,099 | 817 | 9.86 |
| 2008 | 9,960 | 861 | 9.46 |

| වර්ෂය | අරමුදල් (රු(ලක්ෂ.ද. | වර්ධනය | වර්ධනය % |
|---|---|---|---|
| 2009 | 10,738 | 778 | 7.81 |
| 2010 | 12,886 | 2,148 | 20.00 |
| 2011 | 13,702 | 816 | 6.33 |
| 2012 | 11,726 | (1,976) | (14.42) |
| 2013 | 12,760 | 1,034 | 8.82 |
| 2014 | - | - | - |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 13 අනිවාර්යය ඉතිරි කිරීම්




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

### 9.4.5.1 අනිවාර්ය ඉතිරි කිරීම් පොලී ගෙවීම.


ආයෝජනය සඳහා බැංකු මූලා අංශය වෙත එවනු ලබන අනිවාර්ය ඉතුරුම් අරමුදල් ආයෝජන ඒකකය හරහා ආයෝජනය කිරීමෙන් උපයන ලද පොලී මුදලෙන් සෑම වසරක් අවසානයේම ඒ ඒ ප්‍රජාමූල බැංකු සමිති සඳහා පොලී ගෙවීම් සිදුකරනු ලැබේ. එමෙන්ම 2006 වසරේ සිටම දිවිනැගුම සමිති ක්‍රියාකාරී හා ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම පොලී ගෙවීම ප්‍රජාමූල බැංකු සමිති ඔස්සේ සිදු කෙරේ. එලෙසම ප්‍රජාමූල බැංකු සමිති/බැංකු සංගම් සඳහා තාක්ෂණික හා ඵලදායී ක්‍රම හඳුන්වාදීමේ අරමුණින් 2008 වසරේ සිට අනිවාර්ය ඉතිරි කිරීම් පොලී ගෙවීම සෘජුවම ප්‍රජාමූල සමිති ජංගම ගිණුමට ප්‍රේෂණය කිරීම මඟින් සිදු කෙරිණ. එම ක්‍රියාකාරීත්වය තුලින් මේ මගින් බැංකු මූල්‍යකටයුතු අංශයටද වසරකට මිලියන 3 ක පමණ අමතර ආදායමක් ලබාගැනීමට හැකිවිය. (මාර්ගස්ථ මුදල් රැඳවීමේ කාලය එක් දිනක් දක්වා අඩුකිරීම තුලින්) අනිවාර්ය ඉතුරුම් සඳහා ප්‍රතිලාභීන්ට ලබාදෙන පොලී ප්‍රතිශතය තරඟකාරී වාණිජ බැංකු සමග සැසඳීමේ දී ඉහල අගයක් ගන්නා අතර, එය ගිණුම් හිමි ප්‍රතිලාභීන්ට ලබාදෙන විශේෂ වරප්‍රසාදයකි.

වගුව - **29** **අනිවාර්ය ඉතිරි කිරීම් ගෙවන ලද පොලිය.**

| වර්ෂය | ගෙවන ලද පොලී අනුපාතිකය % |
|---|---|
| 2000 | 14.0 |
| 2001 | 17.75 |
| 2002 | 13.0 |
| 2003 | 8.1 |
| 2004 | 7.5 |
| 2005 | 7.75 |
| 2006 | 10.06 |
| 2007 | 14.0 |
| 2008 | 14.0 |
| 2009 | 14.0 |
| 2010 | 9.5 |
| 2011 | 7.1 |
| 2012 | 7.5 |
| 2013 | 6.5 |
| 2014 | 6.0 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - **14** **අනිවාර්යය ඉතුරුම් පොලිය (1%)**




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

2014වසරේමූල්‍ය වෙළඳපොල පොලී අනුපාතය පහල අගයක්වුව ද අනිවාර්ය ඉතුරුම් සඳහා 6.0පොලී අනුපාතිකයක් බැංකු සංගම් වෙත ලබා දීමට හැකිවීම අගය කල යුතුය. (මෙම වසරේ වානිජ බැංකු විසින් තම ඉතුරුම් වලට ලබාදුන්නේ 5% පොලී අනුපාතයකි.)

### 9.4.6 ණය යෝජනා ක්‍රමය

බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් බැංකු සංගම් විසින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමවලට අවශ්‍ය අරමුදල් සම්පාදනය කරන ගමන්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ද ණය යෝජනා රැසක් දියත් කර ඇත. ඒ අනුව බැංකු මූල්‍ය කටයුතු අංශය මගින් ක්‍රියාත්මක ණය වැඩසටහන් පහත පරිදි වර්ග කර දැක්විය හැක.

2.2.1 ප්‍රතිලාභීන් සඳහා ණය යෝජනා ක්‍රමය
2.2.2 කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමය

#### 9.4.6.1 ප්‍රතිලාභීන් සඳහා ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමය

**(I) ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය.**

බැංකු සංගම් ණය ලබාදෙන්නේ තමා විසින්ම ඒකරාශීකරණය කරනු ලබන තැන්පතු වලිනි. ඒ සඳහා බැංකු සංගම්වලට අවසර ඇත්තේ මුළු තැන්පතු වලින් 80% ක් දක්වා පමණි. ඉන් ඉදිරියට ලබාදෙන ණය සඳහා ඇති වන මූල්‍ය දුෂ්කරතා පියවීම සඳහා බැංකු මූල්‍යකටයුතු අංශය විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් බැංකු පොලී අනුපාතිකයට වඩා අඩු පොලිඅනුපාතිකයක් යටතේ බැංකු සංගම්වලට ලබාදේ. ස්වයං රැකියා, වගා, ධීවර, සත්ත්ව පාලන, වෙළඳාම හා සේවාමය ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා ණය ලබාදේ. ප්‍රතිමූල්‍ය ණය යෝජනා ද්‍රව්‍ය, ප්‍රජාමූල සමිති හරහා සිදුවන අතර, බැංකු මූල්‍ය කටයුතු අංශය වාර්ෂික 4% කට ප්‍රජාමූල සමිති සඳහා ලබාදෙන අතර, ප්‍රජාමූල සමිති විසින් ප්‍රජාමූල බැංකු සංගම්වලට 7% පොලියට ප්‍රතිමූල්‍ය ණය අරමුදල් ලබා දෙයි.


වගුව - 30 **ප්‍රතිමූල්‍ය ණය වැඩසටහනෙහි ප්‍රගතිය 2014.12.31 දිනට**

| වර්ෂය | ණය සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදාහල මුදල රු.මි. | අයවීමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 1999 | 11 | 523 | 3.00 | 100 |
| 2000 | 175 | 5,578 | 52.00 | 92 |
| 2001 | 324 | 12,588 | 117.00 | 101 |
| 2002 | 472 | 18,400 | 177.00 | 100 |
| 2003 | 637 | 23,223 | 233.00 | 100 |
| 2004 | 786 | 27,605 | 283.00 | 101 |
| 2005 | 849 | 30,351 | 315.80 | 102 |
| 2006 | 971 | 36,155 | 389.00 | 100 |
| | | | | |

| වර්ෂය | ණයසංඛ්‍යා ණය සංඛ්‍යාව ව | ප්‍රතිලාභීන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදාහල මුදල මුදාහල මුදල රු.මි. | අයවීමේ ප්‍රතිශතය අයවීමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 2007 | 1,040 | 40,008 | 450.00 | 100 |
| 2008 | 1,072 | 42,631 | 499.71 | 100 |
| 2009 | 1,097 | 44,180 | 523.58 | 100 |
| 2010 | 1,110 | 45,284 | 571.11 | 91 |
| 2011 | 1,112 | 45,399 | 581.42 | 95 |
| 2012 | 1,132 | 46,145 | 613.12 | 100 |
| 2013 | 1,163 | 48,460 | 710.91 | 100 |
| 2014 | 1,175 | 49,332 | 761.64 | 100 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 15 **ප්‍රතිමූල්‍ය ණය වැඩසටහනෙහි ප්‍රගතිය 2014.12.31**




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

**(II) මිහිජය( 8%, 10%) සහන පොලී ප්‍රතිපූරණය**


සබද, ජන පුබුදු, ගෙදර ණය වැඩසටහන 2010 වසර තුල අත්හිටුවා ඇති අතර, මෙම ණය යෝජනා ක්‍රමයට විකල්පයක් ලෙස ස්වයංරැකියා, පියස හා මිහිජය වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.මේ අනුව ප්‍රජාමූල බැංකු සංගම් ක්‍රියාත්මක සියලුම ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා සහන පොලී ප්‍රතිපූරණයන් බැංකු මූල්‍ය අංශය මගින් සිදු කරන ලදී. බැංකු සංගම් වල මූල්‍ය අලාභයන් අවම කිරීම සඳහා සහන ණය පොලී ලබා දීම මෙහි අරමුණයි .2013.12.31 දිනෙන් පසු අය කල පොලී සඳහා සහන පොලී ප්‍රතිපූර්ණය නොකල අතර 2013.12.31 දක්වා අය කල පොලී සඳහා පමණක් මෙම වසරේදී ද පොලී සහන ලබා දෙන ලදී.

**වගුව - 312014.12.31 දිනට බැංකු සංගම් වෙත ලබා දී ඇති සහන පොලී ප්‍රමාණය**

| වසර | මුදල |
|---|---|
| 2008 | 250,143.00 |
| 2009 | |
| 2010 | 3,108,269.00 |
| 2011 | 2,496,830.25 |
| 2012 | 23,566,040.32 |
| 2013 | 91,706,854.90 |
| 2014 | 147,685,633.11 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

**ප්‍රස්ථාරය - 16 බැංකු සංගම්වෙත ලබා දී ඇති සහන පොලී**




මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

**(III) විදුලි අත්වැල ණය වැඩසටහන.**

සැමට විදුලිය සැපයීමේ අරමුණින් දිවිනැගුම ප්‍රතිලාභීන් හා අඩු ආදායම් ලාභී පවුල් ඒකක සඳහා විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය විසින් විදුලි අත්වැල ණය යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. මෙම වැඩසටහනට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා විදුලි බල හා බලශක්ති අ මාත්‍යාංශය මග පෙන්වන අතර ශ්‍රී ලංකා සමෘද්ධි

අධිකාරිය (වර්තමානයේ දිවිනැගුම දෙපාර්තමේන්තුව) හා ලංකා විදුලි බල මණ්ඩලය මේ සඳහා සක්‍රිය දායකත්වය සපයයි.

දීප ව්‍යාප්ත දිවිනැගුම ප්‍රජාමූල බැංකු ජාලය හරහා එකවරම මෙම සහනදායි "විදුලි අත්වැල" ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල අරමුදල් බැංකු මූල්‍ය අංශය මගින් ලබා දෙනු ලබයි.

මෙම වැඩසටහනින් අපේක්ෂිත ප්‍රතිලාභ වන්නේ,

I අඩු අදායම් ලාභීන් විසින් පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යාමට අපේක්ෂිත සුළු කර්මාන්ත හා අලෙවි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂම කර ආර්ථික ශක්තිය ඉහල නැංවීම.

II දිවිනැගුම සංවර්ධන වැඩසටහන සඳහා ණය ඉල්ලුම වැඩිවී නව සාමාජිකයන් ප්‍රජාමූල බැංකු සංගම් වලට ඒකරාශි වී තැන්පතු වර්ධනය වීම.

III බැංකු මූල්‍ය කටයුතු අංශය මගින් ලබාදෙන සේවා ගාස්තු නිසා බැංකු සංගම් වල ආදායම් ශක්තියද ඉහල නැංවීමට හැකි වීම.

IV ප්‍රජාමූල බැංකු සංගම් වල මූල්‍ය ශක්තිය, කාර්යක්ෂමතාවය, විශ්වාසය තවදුරටත් වර්ධනය වීම.

මෙම විදුලි අත්වැල ණය වැඩසටහන සඳහා ප්‍රතිලාභින් වෙත ලබාදෙන උපරිම ණය මුදල රු. 30,000/= වන අතර මාස 60 ක කාලයක් තුල 12% වාර්ෂික පොළිය සමග ණය මුදල වාරික වලින් අයකර ගනු ලැබේ.

මෙහිදී විදුලි බල මණ්ඩලය මගින් හඳුන්වා දෙන ණය ඉල්ලුම් පත්‍රය අදාල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය මගින් ලබා ගෙන මෙහෙයුම් උපදෙස් අංක 05 පරිදි සුදුසුකම් සම්පූර්ණ කර ඇති ඉල්ලුම් පත්‍ර පිලිවෙලින් දිවිනැගුම සංවර්ධන නිළධාරී, දිවිනැගුම කළමනාකරු, ප්‍රාදේශිය ලේකම් නිර්දේශ කර විදුලිබල මණ්ඩලය වෙත ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමෙන් පසු විදුලි පහසුකම් ලබාදෙනු ඇත.

2010 වර්ෂය තුල මෙම විදුලි අත්වැල ණය වැඩසටහනට සම්බන්ධ ද්වි පාර්ශ්වික ගිවිසුම් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය (වර්තමානයේ දිවිනැගුම දෙපාර්තමේන්තුව) හා ලංකා විදුලි බල මණ්ඩලය විසින් අත්සන් කල අතර එම වර්ෂය තුල ණය නිකුත් කිරීමක් සිදු කර නොමැත.

2014 වර්ෂය තුලද මෙම විදුලි අත්වැල ණය වැඩ සටහන සම්බන්ධයෙන් ද්වි පාර්ශ්වික ගිවිසුම දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව හා ලංකා විදුලි බල මණ්ඩලය විසින් අත්සන් කරන ලදී.

**වගුව - 32** **විදුලි අත්වැල ණය වැඩ සටහනේ ප්‍රගතිය**

**2014.12.31 දිනට**

| වර්ෂය | බැංකු මූල්‍ය අංශය විසින් විදුලිබල මණ්ඩලයට | | | බැංකු මූල්‍ය අංශය විසින් ප්‍රතිලාභීන්/අඩු ආදායම්ලාභීන්ට | |
|---|---|---|---|---|---|
| | ලබාදී ඇති | | | ලබාදී ඇති | |
| | ණය සංඛ්‍යාව | මුදල (රු.මි) | පිටහිටි මුදල (රු.මි) | ණය සංඛ්‍යාව | මුදල (රු.මි) |
| 2011 | 02 | 350 | 335.08 | 20694 | 354 |
| 2012 | 07 | 747 | 675.32 | 44932 | 853 |
| 2013 | 09 | 1080 | 861.67 | 64520 | 1237 |
| 2014 | 13 | 1537 | 1106.18 | 80153 | 1537 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

**9.4.6.2 දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා වන ණය යෝජනා ක්‍රමය**

➢ **පාරිභෝගික ණය යෝජනා ක්‍රමය.**

2004 පෙබරවාරි මාසයේදී ආරම්භ වූ මෙම වැඩසටහන 2008 දක්වා දිවිනැගුම සංවර්ධන නිලධාරීන් සඳහා පමණක් වාර්ෂික පොලී අනුපාතය 9% ක ට රු. 50,000 ක ණය මුදලක් ලබාදෙන ලදී. දැනට

මෙම ණය ක්‍රමය සියළුම කාර්ය මණ්ඩලයට විවෘතය. ණය මුදල ආපසු ගෙවීමේ කාලය මාස 60 කි. 2010.10.18 දින සිට 50,000/- ක් වූ ණය මුදල රු. 100,000/- වැඩි කරන ලදී. 2014.12.18 දින සිට මෙම වැඩසටහන දිස්ත්‍රික්ක වෙත විමධ්‍යගත කර ඇත.

වගුව - 33 **2014.12.31 දිනට සේව ක පාරිභෝගික ණය (සමුච්චිත)**

| **ලබාදුන් ණය සංඛ්‍යාව** | **මුදල රු.ද. ලක්ෂ** |
|---|---|
| 28118 | 1869.09 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

- **කාර්ය මණ්ඩලය සඳහා නිවාස ණය යෝජනා ක්‍රමය.**

2004 ජූනි මාසයේදී ආරම්භ වූ මෙම වැඩසටහන දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ප්‍රජාමූල බැංකු අංශයේ ආයෝජන වලින් උපයාගත් ආදායම් මගින් ප්‍රතිපාදන වෙන්කෙරේ. ණය වැඩසටහන යටතේ ඉඩමක් මිලට ගැනීම, නව නිවසක් ඉදිකිරීම, නිවසක් මිලට ගැනීම හා නිවසක කොටසක් එකතු කිරීම හෝ පුළුල් කිරීම යන කරුණු සඳහා ණය ලබාදීම සිදු කරයි. ණය මුදලෙහි ආපසු ගෙවන කාලය වසර 15 දක්වා දීර්ඝ කර ඇත. නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ 2014.12.31 දිනට පහත පරිදි ණය නිකුත් කර ඇත. 2010.01.01 දින සිට අදාල පොලී අනුපාතය 10% දක්වා අඩු කර ඇත. 2014.11.01 දින සිට මෙම ණය අයකිරීම් ද දිස්ත්‍රික් මට්ටමට විමධ්‍යගත කර ඇත.

වගුව - 34 **2014.12.31 දිනට නිවාස ණය (සමුච්චිත)**

| **ලබාදුන් ණය සංඛ්‍යාව** | **මුදල රු.ද. ලක්ෂ** |
|---|---|
| 2129 | 905.08 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

- **යතුරුපැදි ණය යෝජනා ක්‍රමය.**

2004 නොවැම්බර් මාසයේදී ආරම්භ වූ මෙම ණය වැඩසටහන සඳහා, බැංකු මූල්‍ය කටයුතු අංශයේ ආයෝජන වලින් උපයාගත් ආදායමින් ප්‍රතිපාදන වෙන්කෙරේ . දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා පමණක් මෙම ණය වැඩසටහන සීමා වී ඇත. 10% වාර්ෂික පොලී අනුපාතයක් යටතේ උපරිමය රු .150,000 ක ණය මුදලක් මාස 60 ක ආපසු ගෙවීමේ කාලය මත යතුරු පැදි ණය ලබාදෙනු ලැබේ.2014.12.31 දිනෙන් පසු යතුරු පැදි ණය දිස්ත්‍රික් මට්ටමින් නිකුත් කිරීමට භාර දී ඇත. 2014.11.01 දින සිට මෙම ණය අයකිරීම් ද දිස්ත්‍රික් මට්ටමට විමධ්‍යගත කර ඇත.

වගුව - 35 **2014.12.31 දිනට යතුරු පැදි ණය**

**(සමුච්චිත)**

| ලබාදුන් ණය සංඛ්‍යාව | මුදල රු.මි. |
|---|---|
| 4067 | 368.03 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

## 9.4.7 සේවක ශාරීරික අනතුර රක්ෂණය.

ප්‍රජාමූල බැංකු සංගම් සතු මුදල් බැංකු සංගම්වල සිට වානිජ බැංකුවල තැන්පත් කිරීමට ගෙනයාමේදී හා වානිජ බැංකුවේ සිට ප්‍රජාමූල බැංකු සංගම්වලට මුදල් ගෙනඒමේදී සිදුවන මුදල් මංකොල්ලකෑම්වලදී බැංකු කාර්ය මණ්ඩලයට සිදුවන ශාරීරික අනතුරු වෙනුවෙන් මෙම වැඩසටහන යටතේ වන්දි ප්‍රදානය කරනු ලැබේ. 2005 ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාවට නැංවූ ශාරීරික අනතුරු රක්ෂණ අරමුදලට සෑම බැංකු සංගමයක්ම වසරකට රු. 1,000/- ක් ගෙවා රක්ෂණ ආවරණය ලබාගත යුතුය.

මේ යටතේ ලබාගත හැකි උපරිම වන්දි මුදල .

දිවිනැගුම කළමනාකරු රු .200,000/-
දිවිනැගුම සංවර්ධන නිලධාරී රු. 150,000/-

2014 වසරේ මෙම වැඩසටහන යටතේ රක්ෂණ වාරික ලෙස බැංකු සංගම් මගින් රු.808,400/- ක මුදලක් ලැබී ඇත.

## 9.4.8 දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම් අතරැදි මුදල් සංරක්ෂණය

- දිවිනැගුම ප්‍රජාමූල බැංකුසංගම් හි අතරැදි මුදල් හා එකී බැංකු සංගම්වල සිට වාණිජ බැංකුවලට රැගෙන ඒමේදී සහ රැගෙන යාමේදී ඇතිවන මුදල් සොරකම් කිරීම හෝ මංකොල්ලකෑම් වලදී මුදල්වලට ඇතිවන හානිය මෙමගින් ප්‍රතිපූර්ණය කෙරේ.

- බැංකු සංගම් මහා සංගම්වල එදිනෙදා ද්‍රවශීලතා වුවමනාවන් සලකා බලා ඒ අනුව මෙම සංරක්ෂණ ආවරණය සඳහා බැංකු මූල්‍ය අංශයෙන් විමසිය හැක. ඒ සඳහා වාර්ෂිකව වාරික මුදල් බැංකු මූල්‍ය අංශයට එවා සංරක්ෂණ ආවරණය ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත. එහි ප්‍රගතිය 2014.12.31 දිනට බැංකු සංගම් 1069 හා මහා සංගම් 270 ක් මෙම සංරක්ෂණයආවරණය ලබාගෙන ඇත.

- බැංකු සංගම් (ශාරිරික අනතුරු රක්ෂණ මුදල ද ඇතුලත්ව ) හා මහා සංගම් විසින් එවන ලද වාරික මුදල් බැංකු මූල්‍ය අංශය විසින් ගොඩනංවා ඇති අරමුදලකට බැර කර ඵලදායී ආයෝජන යොදවා අරමුදල පුළුල් කර ඇත.

- 2014 වසර සඳහා බැංකු සංගම්මගින් අතරැදි රක්ෂණ වාරික ලෙසරු. 11,631,909/-ක මුදලක් එවා ඇත. 2014වසර සඳහා සිදුවීම් 01ක් වෙනුවෙන් රු 44,930.50 වන්දි වශයෙන් ගෙවීම් කර ඇත.

### 9.4.9 බැංකු සංගම්, මහා සංගම් මූල්‍ය මෙහෙයුම් කටයුතු.

දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම් හා බැංකු සමිති කටයුතු සෑම මුදල් වර්ෂයක් අවසානයේ එනම් ජනවාරි 1 වෙනි දින සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුල සිදුවූ කටයුතු පිළිබඳව විගණනය කර වාර්ෂික විගණන වාර්තාවක් සකස් කල අතර මෙම විගණන වාර්තා මුල් කාලයේසකස් කිරීමේ බලය පැවරී තිබුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරිවරුන් වෙතය.එහෙත් එම කටයුත්ත සාර්ථකව ඉටු නොවුණ හෙයින්එම වර්ෂ වලට අදාලව සකස් නොකරන ලද විගණන වාර්ථා සකස් කිරීම සඳහා රාජ්‍ය/ අර්ධ රාජ්‍ය ආයතනයන්හි ගණකාධිකාරිවරු බාහිර විගණන නිලධාරින් ලෙස යොදා ගනිමින් එම සේවය ලබා ගන්නා ලදී.

2006 වර්ෂයට පසු වර්ෂය විගණනය කර මූල්‍ය ප්‍රකාශ නයන් සකස් කර විගණන මතය සමග ප්‍රජාමූල බැංකු අංශයට යොමු කිරීම අභ්‍යන්තර විගණන අංශය මගින් මේ දක්වා සිදු කරයි.

### 9.4.10 බැංකු අධීක්ෂණ ඒකකය.

බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් හා චක්‍රලේඛ අනුව දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම් හා බැංකු සමිති මෙහෙයුම් ක්‍රියාවලිය විධිමත්ව සිදුවන්නේ ද යන්න අධික්ෂණ කිරිම හා මග පෙන්වීම් කටයුතු සිදු කිරිමටත් සමස්ත බැංකු සංගම් පද්ධති හා කාර්යක්ෂමතාවය ඵලදායිතාවය වර්ධනය කිරිම අරමුණු කරගෙන "බැංකු අධික්ෂණ ඒකකය" ප්‍රජාමූල බැංකු අංශය තුල ස්ථාපනය කර ඇති අතර පහත සඳහන් කටයුතු එම ඒකකය තුලින් ඉටු කරනු ලැබේ.

* දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති හි විගණන විමසුම් සෝදිසි විගණන වාර්තා මගින් හා වෙනත් ආකාරයෙන් ලැබෙන පැමිණිලි අනුව පසු විපරම් කටයුතු සිදු කිරිම, ඒ අනුව අනාවරණය වන අඩුපාඩු නිවැරදි කිරිම හා අභ්‍යන්තර විගණන, නීති විමර්ශන හා අදාල අංශ වෙත අවශ්‍ය තොරතුරු යොමු කර අවශ්‍ය කටයුතු සම්බන්ධිකරණය සිදු කරයි.

* දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති හි ගිණුම් කටයුතු ආයතන කටයුතුවල හා දෛනික කටයුතුවල පවතින අඩුපාඩු නිවැරදි කිරිමට කටයුතු කිරිම හා අවශ්‍ය උපදෙස් ලබාදීම භාගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සිදු කරයි..

* මාසික කේවල ශේෂ පිරික්සුම් තුලනය කිරිමේ කටයුතු, බැංකු ජංගම සේවා, දිවිනැගුම බැංකු ඒකාබද්ධ කිරිම, ස්වාභාවික ආපදා හේතුවෙන් බැංකු සමංගම්වලට සිදුවන හානි හේතුවෙන් බැංකු මෙහෙයුම් කටයුතු නැවත යථා තත්ත්වයට පත් කිරිමට අවශ්‍ය උපදෙස් ලබාදීම හා නිවැරදි කිරිම් කටයුතු සිදු කිරිම.

* දිවිනැගුම ප්‍රජාමූල බැංකු වල හා බැංකු සමිති වල ඇති වන විවිධ කාලීන අවශ්‍යතා අනුව අවශ්‍ය මෙහෙයුම් උපදෙස් හා මග පෙන්වීම් නිකුත් කිරිම තුලින් බැංකු සංගම් හා බැංකු සමිති වල ඵලදායිතාවය ඉහළ දැමීමට දායකවීම "බැංකු/බැංකු සමිති නියාමනය හා අධීක්ෂණ ඒකකය මගින්" මගින් සිදු කෙරේ.

* අඛණ්ඩව අධික්ෂණය කිරිම මෙන්ම, ක්ෂණිකව ඇති වන අවශ්‍යතා සඳහා අවශ්‍ය සහාය ලබාදීම හා සම්බන්ධිකාරක කටයුතු පහසු කිරිම පිණිස බැංකු මහා සංගම් නියාමන අධික්ෂණ ඒකකය දිස්ත්‍රික් 25පුරාම පිහිටුවා ඇත.2014 වරශය බැංකු/බැංකු සමිති නියාමන අධීන්ෂණ ඒකකයේ ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචන3ක් පවත්වා ඇති අතර.එහි දී හදුනා ගන්නා ලද ගැටළු විශාල ප්‍රමාණයක් එම වර්ෂය තුළම නිරවුල් කර ඇත.

### 9.4.11 පුහුණු කටයුතු

1073 වන සමෘද්ධි බැංකු සංගම් ජාලයේ හා 317 ක පමණ වන මහ සංගම් හි සේවය කරන කාර්ය මණ්ඩල බැංකු කටයුතු හා අනෙකුත් විෂයන්ට අදාලව පුහුණු කිරිම් බැංකු මුලා කටයුතු අංශයේ පුහුණු ඒකකය මගින් සිදු කරයි.

ගණුදෙනුකාර ප්‍රජාව වෙත වඩාත් කාර්යක්ෂම ඵලදායි සේවාවක් සැකසීම උදෙසා බැංකු කාර්ය මණ්ඩලය සඳහා දැනුම කුසලතාවය හා යහපත් ආකල්පයන් ප්‍රගුණ කිරිම මෙම ඒකකයේ කාර්ය භාරයයි.

ඒ අනුව බැංකුවේ කටයුතු පිළිබඳ අවබෝධය ලබාදෙන බැංකු කටයුතු හා ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ මුලික පුහුණු පාඨමාලාව සෑම බැංකු නිලධාරියකුට ලබාදීමට කටයුතු කරයි. මෙයට අමතරව මහ සංගම් කටයුතු හා මහ සංගමයේ ගිණුම් කටයුතු පිළිබඳ නුපුහුණු මහ සංගම් කාර්ය මණ්ඩලය පුහුණු කිරිමට කටයුතු කරනු ඇත.

### 9.4.12 කළමනාකරණ තොරතුරුඒකකය

**1073** ක් වූ ප්‍රජාමූල බැංකු සංගම්හී තොරතුරු කළමනාකරණය සිදු කෙරෙන්නේ බැංකු මුලාකටයුතු අංශයේ කළමනාකරණ තොරුතුරු ඒකකය මගිනි**.** ඒ අනුව සෑම බැංකු සංගමයක් හා බැංකු සමිතියක් මාසිකව තම බැංකු සංගම් ප්‍රගතිය, ලබා දී ඇති ආකෘති මගින් තොරතුරු හා කළමනාකරණ ඒකකය වෙත වාර්තා කළ යුතු අතර**,** එම දත්ත සකස් කර බැංකු සංගම්හී පවතින තත්වය විශ්ලේෂණය කර තොරතුරු ඉදිරිපත් කිරීමත් බැංකු සංගම්හි ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය අනුපාත විශ්ලේෂණයන් ගොඩ නැගීම හා ඒ අනුව බැංකු සංගම් ඇගයීම් සිදු කිරිමට සැලසුම් කර ඇත**.** තවද පරිගණක තාක්ෂණය උපයෝගි කරගෙන බැංකු සංගම් හා බැංකු සමිතියෙහි තොරතුරු බැංකු මුලා කටයුතු අංශය වෙත සම්ප්‍රේෂණය කිරිමට කටයුතු කර ඇත.

ප්‍රජාමූල බැංකු සංගම් පරිගණකගත කිරීමේ කටයුතු සාර්ථක වීමත් සමග මෙම ඒකකය මගින් තවත් ඵලදායීව හා කාර්යක්ෂම අන්දමින් බැංකු සංගම් පවත්නා තත්ත්වය විශ්ලේෂණය කිරීම හා ඇගයීම් කාර්ය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ**.**

### 9.4.13 අලෙවි ප්‍රවර්ධන ඒකකය.

බැංකු කරණය තුල වැදගත් අංශයක් වන අලෙවිකරණ මුලධර්මය මෑත කාලීනව ප්‍රජාමූල බැංකු සංගම් ක්ෂේත්‍රයට හදුන්වාදීමට බැංකු මුලා කටයුතු අංශය කටයුතු කර ඇත. ඒ අනුව ප්‍රජාමූල බැංකු සංගම්වල තැන්පතු ප්‍රවර්ධන කාර්යය උදෙසා බැංකු මුලා කටයුතු අංශයේ අලෙවිකරණ ඒකකය මගින් විශේෂ වැඩසටහන් දියත් කර ඇත.

- ❖ 2014 වසර තුල හෙළ සංස්කෘතික සිරිත් හා ජන ක්‍රීඩා ඉදිරි පරපුරට රැකදීම හා ප්‍රජාමූල බැංකු සංගම් ජනතාව අතර ප්‍රචලිත කිරීම අරමුණු කරගත්, රට වටා සෑම බැංකු සංගමයක්ම ආවරණය වන පරිදි අළුත් අවුරුදු උත්සව 1000 ක් පවත්වන ලදී. ඒ සඳහා ඉතුරුම් රු.ද. ලක්ෂ10.5 ක මුදලක් බැංකු මුලා කටයුතු අංශය මගින් බැංකු සංගම්වලට දෙන ලදී.

- ❖ ප්‍රජාමූල බැංකු සංගම්වල ඉතුරුම් ප්‍රවර්ධනය සඳහ 2014 වසර තුල පහත වැඩසටහන් 8 ක් සැලසුම් කර දියත් කරන ලදී.

  I. සිංහල - හින්දු අවුරුදු උත්සවයටසමගාමීව අවුරුදු ගනුදෙනු සතියක් නම් කර එමගින් රු.මි.1,489/- ක තැන්පතු ඒකරාශී කරන ලදී.

II. 2014 මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින් දිරියමාතා තැන්පතු ප්‍රවර්ධන ක්‍රමෝපායක් බැංකු සංගම් 1 තුල ක්‍රියාවට නංවා සාර්ථක ලෙස පවත්වන ලදී.

III. ලෝක ළමා දින පදනම් කරගෙන ළමා තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

IV. තෛයිපොංගල් උත්සවය පදනම් කරගත් ප්‍රවර්ධන වැඩසටහන.

V. නත්තල් උත්සවය පදනම් කරගත් ප්‍රවර්ධන වැඩසටහන.

**9.4.14 පොදු කරුණු.**

**නව වසර තුල අංශය මගින් දියත් කරන ලද අනෙකුත් වැඩසටහන් හා ක්‍රියාකාරකම්**

- 2014 වර්ෂය සඳහා බැංකු සංගම් සඳහා ඉලක්ක පහක් සහිත විධිමත් පරිදි වර්ෂය පුරා විහිදී යන බැංකු සංගම් කටයුතු පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර බැංකු සංගම් ඒ සඳහා යොමු කරන ලදී.

  බොහෝ බැංකු සංගම් කටයුතු මේ වනවිට පරිගණක පහසුකම් සලසාදෙමින් අන්තර්ජාල පහසුකම් මගින් ප්‍රධාන කාර්යාලයේ කළමනාකරණ තොරතුරු ඒකකය වෙත තොරතුරුලබාදිම ද අවශ්‍ය මඟපෙන්වීම කර ඇත.

- 2014 වසර තුල රාජ්‍ය ප්‍රතිපාදන යටතේ බැංකු සංගම් හාබැංකු සමිතිහි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

වගුව - 36 **බැංකු සංගම් හා බැංකු සමිති ගොඩනැගිලි, ඉදිකිරීම්, අලුත්වැඩියා කිරීම්, කොටස් එකතු කිරීම් හා ඉඩම් මිලදී ගැනීම් පිළිබඳ විස්තර**

| වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| අලුතින් ඉදිකරන ලද බැංකු සංගම් හාබැංකු සමිති ගොඩනැගිළි | 33 | 43.53 |
| අලුත්වැඩියා කරන ලද බැංකු සංගම් හා බැංකු සමිති ගොඩනැගිලි | 04 | 2.82 |
| කොටසක් එකතු කිරීම | 25 | 24.05 |
| ඉඩම් මිලදී ගැනීම | 04 | 4.22 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

- 2014 වර්ෂය තුල ගණකාධිකාරීවරුන් සහ විමර්ශන නිලධාරීන් සඳහා බැංකු සංගම් මහා සංගම් විසිත්ත කිරීම වෙනුවෙන් ගමන් වියදම් රු. 2,270,837/-ක මුදලක් ලබාදෙන ලදී.

- බැංකු සංගම් පරිගණකගත කර ඇති රත්නපුර, හම්බන්තොට, මොණරාගල අමතරව අනෙකුත් දිස්ත්‍රික්කවල වූ බැංකු සංගම් පරිගණකගත කිරීම සඳහා අවශ්‍ය වන මෘදුකාංග නිර්මාණය කිරීම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය තෝරාගෙන ඇත. තවද සියළුම බැංකු සංගම්වල ප්‍රතිලාභීන්ගේ දත්ත පද්ධතියක් ගොඩනැංවීමට කටයුතු ආරම්භ කර ඇත.

වගුව - 37

## විසර්ජන ගිණුම 2014

**වියදම්ශීර්ෂ අංකය: 218** **දෙපාර්තමේන්තුවේනම : සමෘද්ධිකොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැයඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරකප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන්කිරීම් (1+2+3) | (5) මුළුවියදම | (6) ශුද්ධප්‍රතිඵලය ඉතිරිය/ඉක්මවීම (4-5) | ඕලු අංකය (අදාළ ඕ.ඕ.එස්.ඒ 2 අකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | පුනරාවර්තන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | - 15,500,125,000 | 4,000,000 | 48,888,300 -48,888,300 | 15,504,125,000 | 15,503,083,403 | 1,041,597 | |
| | **උප එකතුව (පුනරාවර්තන)** | **15,500,125,000** | **4,000,000** | **0** | **15,504,125,000** | **15,503,083,403** | **1,041,597** | |
| | මූලධන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | - 5,800,000 | 0 | 0 | 5,800,000 | 427,500 | 5,372,500 | |
| | **උප එකතුව (මූලධන)** | **5,800,000** | **0** | **0** | **5,800,000** | **427,500** | **5,372,500** | |
| | **මුළු එකතුව** | **15,505,925,000** | **4,000,000** | **0** | **15,509,925,000** | **15,503,510,903** | **6,414,097** | |

පිටු අංක 02 සිට 21 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වූ ආකෘතිපත්‍රවලින් ඉදිරිපත් කෙරෙනගිණුම්තොරතුරු සහ සටහන්අංක i සිට iv (ආ)දක්වා ඇතුළත් අනෙකුත් විස්තරද මෙමවිසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.එබැවින් ඉහත ගිණුමෙහිසඳහන්සංඛ්‍යා, ඊටඅදාළ ගිණුම් තොරතුරු හාසටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම්සැසඳීම් කරඇති බවත්, ඒවා නිවැරදි බවටතහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

නම : පී. එච්. එල්. විමලසිරි පෙරේරා

තනතුර : ලේකම් (නිවාසහා සමෘද්ධි අමාත්‍යාංශය)
දිනය :

ගණන්දිමේනිලධාරි

නම :ආර්.ඒ.ඒ.කේ.රණවක
තනතුර :අධ්‍යක්ෂ ජනරාල්
(දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව)
දිනය :

ප්‍රධාන ගණකාධිකාරි

නම : ආර්.එම්. එම්. ජී. රත්නායක
තනතුර -ප්‍රධාන ගණකාධිකාරී
(දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව)

දිනය :

වගුව - 38<u>විසර්ජන ගිණුම 2014</u>

**වියදම්ශීර්ෂ අංකය: 305දෙපාර්තමේන්තුවේනම : උඩරට ගැමිපුනරුත්තාපන දෙපාර්තමේන්තුව**

| වාර්ෂික ඇස්තමේන්තුවෙ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැයඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරකප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන්කිරීම් (1+2+3) | (5) මුළුවියදම | (6) ශුද්ධප්‍රතිඵලය ඉතිරිය/ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.ඕ.එෆ්.2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | (1+2+3) | | | |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | <u>පුනරාවර්තන</u> | - | | | | | | |
| 2 | සංවර්ධන වැඩසටහන | 20,275,000 | 0 | 0 | 20,275,000 | 18,866,678 | 1,408,232 | |
| | උප එකතුව (පුනරාවර්තන) | **20,275,000** | **0** | **0** | **20,275,000** | 18,866.678 | 1,408,232 | 2 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | <u>මූලධන</u><br>සංවර්ධනවැඩසටහන | -<br>1,350,000 | 0 | 0 | 1,350,000 | 1,318,298 | 31,702 | |
| | **උප එකතුව (මූලධන)** | **1,350,000** | **0** | **0** | **1,350,000** | 1,318,298 | 31,702 | |
| | **මුළු එකතුව** | **21,625,000** | **0** | **0** | **21,625,000** | **20,185,066** | **1,439,934** | |

වගුව **- 39**

## විසර්ජන ගිණුම - 2014

### වියදම් ශීර්ෂ අංකය - 105

| අනු අංකය | වැය සංකේත ශීර්ෂය | ප්‍රතිපාදන | වියදම | ශේෂය |
|---|---|---|---|---|
| 01 | 105-2-1-1-2105 | 397194500.00 | 1882896604.21 | 1189048395.79 |
| 02 | 105-2-1-2-1503 | 9255000000.00 | 8619601398.14 | 635398601.86 |
| 03 | 105-2-1-2-2201 | 41102209.63 | 47612114.15 | 2387885.85 |
| 04 | 105-2-1-3-1503 | 64786063.97 | 91060182.72 | 25939817.28 |
| 05 | 105-2-1-3-2201 | 8320685.45 | 42968963.48 | 7031036.52 |
| 06 | 105-2-1-4-1503 | 20333573.33 | 20533692.54 | 5966307.46 |
| 07 | 105-2-1-4-2201 | 10814229.44 | 25000000.00 | 0.00 |

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

පිටු අංක 02 සිට 21 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වු ආකෘතිපත්‍රවලින් ඉදිරිපත් කෙරෙනගිණුම්තොරතුරු සහ සටහන්අංක i සිට iv (ආ)දක්වා ඇතුළත්අනෙකුත් විස්තරද මෙමවිසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.එබැවින් ඉහත ගිණුමෙහිසඳහන්සංඛ්‍යා, ඊටඅදාළ ගිණුම් තොරතුරු හාසටහන්වලටඅනුකූලව පිළියෙල කර ඇතිබවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම්සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවටතහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : පී. එච්. එල්. විමලසිරි පෙරේරා

තනතුර : ලේකම් (නිවාසහා සමෘද්ධි අමාත්‍යාංශය)
දිනය :

ගණන්දිමේනිලධාරි
නම :ධම්මික ගුණවර්ධන
තනතුර :අධ්‍යක්ෂ ජනරාල් වැ.බ.
(දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව)
දිනය :

ප්‍රධාන ගණකාධිකාරි
නම : ආර්.එම්. එම්. ජී. රත්නායක
තනතුර -ප්‍රධාන ගණකාධිකාරී
(දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
දිනය :

සටහන

2014 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වියදම් දැරීම සඳහා අය වැය තුලින් ඇස්තමේන්තුවක් අනුමත කර නොතිබු අතර, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වු ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව සඳහා වෙන කර තිබු ප්‍රතිපාදන උපයෝගි කර ගෙන වියදම් දරණ ලදි.